# බස්නාහිර පළාතේ පළාත් සභාව

## மேல் மாகாண மாகாண சபை

## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2018** නොවැම්බර් **19** වන සඳුදා

2018கார்த்திகை 19 திங்கட் கிழமை

Monday 19th November 2018

**බත්තරමුල්ල , ශ්‍රී ජයවර්ධනපුර , ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 204 (12 වන මහල) හි පිහිටි බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා ශාලාවේදී පැවැති (ප්‍රථම) සභා රැස්වීම**

பத்தரமுல்ல ,ஸ்ரீ ஜயவர்த்தனபுர ,டென்சில் கொப்பேகடுவ மாவத்தை இலக்கம் 204(12ஆம் மாடி)இல் அமைந்துள்ள மேல் மாகாண மாகாண சபையின் கட்டடத் தொகுதியின் கூட்ட மண்டபத்தில் நடைபெற்ற (முதலாவது) சபைக் கூட்டம்.

First Council meeting was to be held at the Council Hall located in the 12th floor of Western Province Provincial Council at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා .09.44 ට පළාත් සභාව රැස් විය.**

மு.ப. 09.44 **க்கு சபை கூடியது**

*The Provincial Council met at 09.44 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**

*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*

*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද ඉතාමත් සුවිශේෂී දිනයක්. වාසනාවන්ත දිනයක්. ඒ වාගේම ඓතිහාසික දිනයක්. පළාත් සභා ක්‍රමය බිහි වී අවුරුදු 30 කට ආසන්න කාලයක් තුළ ඉතිහාසය ගත් විට පළාත් සභා ක්‍රමය බිහි වීමේදීත් අපි දන්නවා, ඒක සුන්දර ආරම්භයක් නොවූ බව. ඉතාමත්ම කටුක ඇත්දැකීම්වලින් යුත්, මිනිස් ජීවිත ලේ වැගිරීම්වලින්, ජීවිත පූජාවෙන් තමයි පළාත් සභා ක්‍රමය ආරම්භ වුණේ. 1988 ජූලි මාසේ තමයි මුලින්ම ආරම්භ වුණේ. ආරම්භක රැස්වීම පැවැත් වුණේ කොළඹ 07 මහවැලි කේන්ද්‍රයේ. එදා වාඩි වෙන්න තිබුණේ, ෆයිබර් පුටු. මේ වාගේ කුෂන් පුටු නැතුව ආරම්භක රැස්වීමේ ෆයිබර් පුටුවල තමයි මන්ත්‍රීවරු වාඩි වුණේ. ඊට පස්සේ අපි දෙවැනි පළාත් සභා රැස්වීම විජේරාම මාවතේ, සව්සිරිපාය ගොඩනැගිල්ල තුළ කුළියට අරගෙන අවුරුදු 15 ක් එහි පළාත් සභා රැස්වීම පැවැත්වූවා. ඊට පස්සේ ඉතාමත් අමාරුවෙන් 2003 නොවැම්බර් 02 වැනිදා කාර්යාල ගොඩනැගිල්ලක් වශයෙන් සකස් කරපු එහා පැත්තේ තිබුණු ඒ පැරණි - පැරණි නොවෙයි. ඒකත් තවම අලුත්. ඒ ගොඩනැගිල්ලේ අපි රැස්වීම ආරම්භ කළේ, 2003 නොවැම්බර් 02 වැනිදා. ඒත් අපට පහසුකම් තිබුණේ නැහැ. ගොඩක් අඩුපාඩු මධ්‍යයේ තමයි අපි ඒ ගොඩනැගිල්ලට ගෙවදුණේ. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ යුගයේ, රෙජිනෝල්ඩ් කුරේ මහ ඇමැතිතුමාගේ කාලයේ තමයි අපි ඒ පළාත් සභා ගොඩනැගිල්ලට සම්බන්ධ වුණේ. ඊට පස්සේ අපි ඉතාමත් අමාරුවෙන්, ඉතාමත්ම කැපවීමෙන් 2014 අපි අපේම කියන තවත් අලුත් ගොඩනැගිල්ලකට අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ යුගයේ, ප්‍රසන්න රණතුංග ප්‍රධාන ඇමැතිතුමා තමයි මේ ගොඩනැගිල්ලට මුල්ගල තියලා ආරම්භ කළේ. එහෙම හදපු මේ ගොඩනැගිල්ල ඉතාමත් අමාරුවෙන් ආර්ථික ප්‍රශ්න, නොයෙක් ප්‍රශ්න තුළ වත්මන් ගරු ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමාගේ දැඩි කැපවීම තුළ, ඒක අපි විශේෂයෙන් කියන්න ඕනෑ. එතුමා එතුමාගේ නිවසක් නිර්මාණය කරන ආකාරයට තමයි මේ ගොඩනැගිල්ල වෙනුවෙන් මහන්සි වුණේ. එතුමා විතරක් නොවෙයි. අමාත්‍ය මණ්ඩලය, ධූරධාරීන්, ප්‍රධාන ලේකම්තුමා ඇතුළු සියලුම නිලධාරීන්ගේ සහයෝගය ලබා ගෙන තමයි එතුමා අද මේ ගොඩනැගිල්ල මේ මට්ටමට ගෙන එන්න, සුන්දර ස්ථානයක් බවට පත් කරන්න කටයුතු සිද්ධ වුණේ.

ඒත් එක්කම මේ ගොඩනැගිල්ල අපි මීට මාස කිහිපයකට පෙරාතුව අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ආරාධනා කරලා එතුමාගේ ප්‍රධානත්වයෙන් අපි මේ ගොඩනැගිල්ලට නිල වශයෙන් සම්ප්‍රාප්ත වුණා. නමුත් එදා පළාත් සභා රැස්වීමක් පැවත්වුණේ නැහැ. එතුමා පළාත් සභා ක්‍රමය පිළිබඳව ඉතාමත් හරවත් කථාවක් කරලා එදා උත්සවය අපි අවසන් කළා. ඊට පස්සේ අපි විවිධ ප්‍රශ්න, විවිධ ගැටළු මැද තමයි මේ සභා ගර්භයට එන්නට අපට වාසනාව උදා වුණේ.

මහල් 14 කින් යුත් මේ ගොඩනැගිල්ලේ වැඩ කටයුතු අවසන් කරන්න වසර 03 ක් ගත වුණා. තවත් පොඩි පොඩි අඩුපාඩු තිබෙනවා. මේ මහල් 14 එක් මහලක බිම් ප්‍රමාණය වර්ග අඩි 26,200 කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. ඒ තුළ විශේෂයෙන් රථ වාහන ගාල් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් නිර්මාණය කරලා තිබෙනවා. ආබාධිත පුද්ගල වාහන සහ යටි බිම් මහලේ වාහන 82 ක්ද, බිම්මහලේ වාහන 48 ක්ද, පළමු මහලේ වාහන 76 ක්ද සමග යතුරු පැදි සැලකිය යුතු ප්‍රමාණයක් මෙම ගොඩනැගිල්ල තුළ නවතා තැබීමට සියලු පහසුකම් සලසා තිබෙනවා. සම්පූර්ණයෙන්ම වායු සමීකරණය කරන ලද මෙම ගොඩනැගිල්ල නවීන ගිනි ආරක්ෂක පද්ධති, ආරක්ෂක කැමරා පද්ධති, මහජන ඇමතුම් පද්ධති, සෝපාන, පල්දෝරු පද්ධති, මධ්‍යම සර්ව

**[ගරු සභාපතිතුමා]**

යන්ත්‍ර සහ විදුලිජනන යන්ත්‍ර ආදී කාර්යාලය සංකීර්ණයෙන් අත්‍යවශ්‍ය අංග සඳහා පහසුකම්වලින් සමන්විත වෙනවා. මීට අමතරව ආපන ශාලා, බැංකු පහසුකම්, ප්‍රථමාධාර වෙළඳසැල්, ගමනා ගමන පහසුකම්, ගොඩනැගිල්ලේ සේවය කරන සේවක සේවිකාවන්ට මෙන්ම මෙහි සේවාලාභීන්ට අවශ්‍ය සියලු පහසුකම් මෙම කාර්යාල සංකීර්ණය තුළ ස්ථාපිත කර ඇත. මෙම ගොඩනැගිල්ල නිර්මාණය කිරීමේදී විදුලි පරිභෝජනය අවම කර ගනිමින් හරිත වර්ගීකරණයට අයත් ගොඩනැගිල්ලක තිබිය යුතු ගුණාංග ඇතුළත් උපාංග සවි කර ඇති අතර, තොරතුරු තාක්ෂණය උපයෝගී කර ගනිමින් පළාත් සභාවේ සේවාවන් ඩිජිටල් තාක්ෂණය තුළින් මහජනතාවගේ නිවසටම ලබා දීමේ යටිතල පහසුකම් ගොඩනැගිල්ලේ නිර්මාණය කර ඇත. මෙම ගොඩනැගිල්ලේ 11, 12, 13 සහ 14 මහල් පළාත් සභා ලේකම් කාර්යාලය සඳහා වෙන් කර ඇති අතර, ඒ යටතේ අංග සම්පූර්ණ කමිටු ශාලා තුනක් 11 වන මහලේ ස්ථාපිත කර ඇති අතර, ඉහළ මහල්වල සභා ශාලාව සහ ධුරධාරීන්ගේ කාර්යාලය ස්ථාපිත කර ඇත. මෙම ලේකම් කාර්යාලයේ කොටසක ගරු මන්ත්‍රීවරුන්ගේ භෝජනාගාරය තිබෙනවා. නිලධාරී භෝජනාගාරය, පුස්තකාලය, මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා වෙනුවෙන් අනෙකුත් පහසුකම් සලසා තිබෙනවා. ඊට අමතරව ඉදිරියේදී කාය වර්ධන ඒකකයක්ද ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබෙනවා. ඉදිරියේදී තමයි ඒක ක්‍රියාත්මක වෙන්නේ. ඒ බව මම මේ අවස්ථාවේ සිහිපත් කරනවා. සභා ශාලාවේ ඉදි කිරීමේදී ඇති වන තාක්ෂණ පහසුකම්වලින් මෙන්ම පළාත් සභාවේ අභිමානය වඩා ඔපවත් වන ආකාරයේ නිර්මාණවලින් යුක්තව, පහසුකම්වලින් යුක්තව අංග සම්පූර්ණ සභා ශාලවක් නිර්මාණය කර ගැනීමට අවස්ථාව උදා වීම බස්නාහිර පළාත් සභාව ලැබූ සුවිශේෂී භාගයකි.

විශේෂයෙන්ම මම සතුටු වෙනවා. මගේ පළාත් සභා කාලය තුළ 1993 දෙවැනි පළාත් සභාවට තේරී පත් වීමෙන් පසු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක, නියෝජ්‍ය සභාපති, 2009 සිට මේ දක්වා සභාපතිවරයා වශයෙන් කටයුතු කරමින් මගේ ජීවිතයේ මම ලද ඉතාම වාසනාවන්ත දවසක් අද දවස. ඒක මට ආඩම්බරයක්. ඔබටත් ආඩම්බරයක්. ඒ ගැන සතුටු වෙනවා. මේ සතුට අපි හැමෝම එකට භුක්ති විඳගන්න ඕනෑ. අපි හැම කෙනාම සහෝදරයත්වයෙන්, වර්තමානයේ ඇති වුණු ගැටළු අපි සාකච්ඡා කර විසඳාගෙන මේ පළාත් සභාව ගෞරවනීය පළාත් සභාවක් කිරීමට ගරු ප්‍රධාන ඇමැතිතුමා, විපක්ෂ නායකතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ගේ සහයෝගය මම බලාපොරොත්තුත වෙනවා. ඉතින් ඒ ගැන අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ. මට හැමදාම ඒ සහයෝගය ලබා දුන්නා. දැන් අවුරුදු 10 කට ආසන්න කාලයක් මට ඒ සහයෝගය ලැබුණා. කිසිම ගැටළුවක්, කිසිම ප්‍රශ්නයක් මේ පළාත් සභාවේ ඇති වුණේ නැහැ. ඒක ඉතාම වැදගත් කාරණාවක්.

ඒ වාගේම මම මේ අවස්ථාවේ විශේෂයෙන්ම ගරු ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමාට විශේෂ ස්තුතියක් කරන්න ඕනෑ. ඒ වාගේම ආණ්ඩුකාරතුමාත් මේ සම්බන්ධව නිරන්තයෙන් අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දෙමින්, අමාත්‍ය මණ්ඩලය, ධුරධාරීන්, ප්‍රධාන ලේකම්තුමා ඇතුළු ඒ සියලු දෙනාම දැනුවත් කරමින් එතුමාගේ සහයෝගය ලබා දුන්නා. මම කලින් කිව්වා වාගේ ගරු ප්‍රධාන ඇමැතිතුමා එතුමාගේ නිවසක් නිර්මාණය කරනවා වාගේ එතුමා නිරන්තරයෙන් මේ සභා ගර්භය තුළ රැඳී සිටිමින්, මුළු ශාලාවේම රැඳී සිටිමින් අවශ්‍ය අඩුපාඩු සකස් කරමින්, මේ වාගේ මට්ටම අද මේ සභාව නිර්මාණය කිරීම පිළිබඳව අපි ගරු ප්‍රධාන අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමාටත්, ඒ වාගේම අමාත්‍ය මණ්ඩලයටත්, විපක්ෂ නායකතුමා, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු සියලුම ධුරධාරීන්ට මගේ ගෞරවය, ස්තුතිය මේ අවස්ථාවේ පුද කර සිටිනවා.

ඒ වාගේම ප්‍රධාන ලේකම්තුමා, අමාත්‍යාංශ ලේකම්වරුන්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් සෙසු ආයතන ප්‍රධානීන් ඒ නන් අයුරින් උදව් උපකාර කළ හැමෝටමත් මගේ ස්තුතිය, ගෞරවය පුද කරනවා. විශේෂයෙන්ම සභා ලේකම්තුමා ඇතුළු සභා ලේකම් කාර්යාල මණ්ඩලයේ සියලු දෙනාටත් මගේ සහ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ ස්තුතිය, ගෞරවය මා මේ අවස්ථාවේ පුද කර සිටිනවා.

අවසාන වශයෙන් විශේෂයෙන්ම අපි සිහිපත් කරන්න ඕනෑ මේ ඉදිකිරීම් පිළිබඳව වෙහෙස මහන්සි වූ අපේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්තුමා, රණසිංහ මහත්මයා. එතුමා විශාල කැප කිරීමක් කළා. අපට එතුමාව අමතක කරන්න බැහැ. මගේ මේ සහටන්වල ඇත්තෙත් නැහැ. නමුත් මගේ යුතුකමක් ඒ ටික කියන එක. එතුමා පුදුමාකාර විධියට මේ ගැන මහන්සි වුණා. කැප වුණා. මේ මට්ටමට එන්න එතුමා අවශ්‍ය සම්පූර්ණ සහයෝගය ලබා දුන්නා.

ඒ පිළිබඳව එතුමාට සභාවේම විශේෂ ස්තුතියක් මේ අවස්ථාවේ පිරිනමනවා. එසේම එතුමා සමග කටයුතු කළ අනුබද්ධ ආයතන, පළාත් මාර්ග සංවර්ධන අධිකාරියටත්, ඊට අනුබද්ධව කටයුතු කළ සියලුම පළාත් රාජ්‍ය, පෞද්ගලික ආයතනවලටත්, සේවා දායකත්වය ලබා දුන් සියලු ආයතනවලටත් මම මේ අවස්ථාවේ ස්තුතිය පළ කර සිටිනවා.

එසේම නම් සඳහන් කිරීමට අතපසු වුවත්, නන් අයුරින් උදව් උපකාර කළ සියලු දෙනාටම මගේ කෘතඥතාව පළ කර සිටිනවා. එසේම මෙම අලංකාර සභා ශාලාවේදී පැවැත්වෙන ප්‍රථම සභා රැස්වීමේදීම ගරු මන්ත්‍රීතුමන්ලා වෙතත්, සියලු දෙනා වෙතත් දැනුම් දෙන්නේ මෙම අලංකාර සභා ශාලව වඩාත් අලංකෘත වන්නේ මෙම සභා රැස්වීම් සඳහා සහභාගී වන අප සැවොම මෙම සභා ශාලාව තුළ ගෞරවාන්විත ආකාරයට හා නීතිගරුකව, සභා රීතිවලට ගරු කරමින් කටයුතු කිරීමෙන් හා විනයගරුකව හැසිරීමෙන් පමණක්ම බව සිහිපත් කිරීමට මම මෙය අවස්ථාවක් කර ගන්නවා. මේ පිළිබඳව දැඩි අධිෂ්ඨානයක් ඇති කර ගන්නා මෙන්ද විශේෂයෙන්ම මම ගරු ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. එසේම දැන් අපි අද දින න්‍යාය පත්‍රයට එළැඹෙනවා.

## සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

*i*

*“සභා ගර්භය තුළ ගරු මන්ත්‍රීවරුන්ගේ මේස මත සවි කරනු ලැබ ඇති මයික්‍රෆෝන හා පරිගණක එකම පද්ධතියක් හා සම්බන්ධව ක්‍රියාත්මක වන අතර, එම උපකරණ භාවිතයේදී යම් අපහසුතාවයක් ඇති වුවහොත් ඒ පිළිබඳව සභා ලේකම්තුමාට හෝ කාර්ය මණ්ඩලය වෙත දැනුම් දීමක් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.*

*තවද, ගරු මන්ත්‍රීවරුන්ගේ පැමිණීම සලකුණු කිරීම සඳහා වන ඇඟිලි සලකුණු යන්ත්‍රද මෙම පද්ධතිය තුළ ක්‍රියාත්මක වන බවද කාරුණිකව දන්වන අතර, එම ඇඟිලි සලකුණු යන්ත්‍ර සඳහා තම ඇඟිලි සලකුණ ලබා දී ලියාපදිංචි වන ලෙස දකාරුණිකව ඉල්ලා සිටිනවා.”*

*ii*

*“නියෝජන ක්‍රමයේ හා නියෝජනයේ පවතින අභියෝග පිළිබඳ සංවාද මණ්ඩලය මාතෘකාව යටතේ විවෘත සංවාදයක් පැවැත්වීමට නියමිත බවත්, ඒ සඳහා බස්නාහිර පළාත් සභාවේ නියෝජිතයන් සහභාගී කරවන ලෙසට ඉල්ලා සිටින බවත් සඳහන් කර සහභාගීත්වය පිළිබඳව පූර්ව දැනුම් දීමක් කරන ලෙසට ඉල්ලා කැලණිය විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යයන අංශයේ අංශාධිපති විසින් 2018.10.18 දිනැතිව ලිපියක් ඉදිරිපත් කර ඇත. එම සංවාද මණ්ඩපය සඳහා සහභාගීවීමට අපේක්ෂා කරන්නේ නම් ඒ පිළිබඳව සභා ලේකම්තුමා විමසන මෙන් කාරුණිකව දැනුම් දෙනවා.”*

*iii*

*“ගරු පළාත් සභා මන්ත්‍රීවරුන් හට බැංකුවලින් ණය හා අයිරා පහසුකම් ලබා ගැනීමට අවස්ථාව ඇහිරෙන පරිදි චක්‍රලේඛ නිකුත් කර ඇති බවත්, එමගින් ගරු පළාත් සභා මන්ත්‍රීවරුන් හට විශාල අපහසුතාවයකට මුහුණ පෑමට සිදු වන බවත් සඳහන් කරමින් උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා විසින් 2018.07.03 දින සභා රැස්වීමේදී මතු කරන ලද වරප්‍රසාද ප්‍රශ්නය මගින් ඉදිරිපත් කළ කරුණු පිළිබඳව මාගේ උපදෙස් මත සභා ලේකම්තුමා විසින් මුදල් අමාත්‍යාංශ ලේකම්තුමාගෙන් විමසීමක් කර ඇත. අනතුරුව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කරනු ලැබ ඇති එම ලිපියට පිළිතුරු වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ වැඩ බලන බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් එවා ඇති 2018.10.23 දිනැති ලිපිය මගින් ගරු පළාත් සභා මන්ත්‍රීවරුන් හට බැංකුවලින් ණය සහ අයිරා පහසුකම් ලබා ගැනීම අවහිර වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් චක්‍රලේඛ නිකුත් කර නොමැති බව දැනුම් දී ඇති බව දැනුම් දෙනවා.”*

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය. මම හිතන්නේ අපේ සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමාත් ඒ ගැන කථා කළා. ඒ නිසා තමයි මම විශේෂයෙන් මෙසේ සඳහන් කළේ.

*iv*

*“සභා රැස්වීම් දිනවලදී මහජන ගැලරිය සඳහා අමුත්තන් සහභාගී කරවීම සඳහා ගරු මන්ත්‍රීවරුන් විසින් අමුත්තන්ව නම් කිරීමේදී සභා රැස්වීම් දිනට අවම වශයෙන් දින දෙකකට පෙර එම නම් කිරීම ගරු සභාපතිතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු බවට 2018.11.07 දින පැවැති සභා කටයුතු කාරක සභා රැස්වීමේදී තීරණය කරන ලද බවත්, ඒ අනුව ගරු මන්ත්‍රීවරයෙකු විසින් කරනු ලබන*

*නම් කිරීම අදාළ පරිදි ගරු ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායකතුමා හෝ ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා මගින් සභා රැස්වීම් දිනට දින දෙකකට පෙර ඉදිරිපත් කරන මෙන් කාරුණිකව දැනුම් දෙනවා."*

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, කලින් නිවේදනයට අනුව ඒ ලිපියේ කොපියක් අපට ලැබෙන්න සලස්වනවාද? මහ බැංකුවෙන් එවපු ලිපියේ කොපියක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි.

*v*

*"අද දින සභා රැස්වීමේ පටන් ගරු මන්ත්‍රීවරුන්ගේ භෝජනාගාරය 12 වන මහලේ ස්ථාපනය කර ඇති බවත්, ගරු මන්ත්‍රීවරුන්ගේ රියදුරු කාර්ය මණ්ඩලය සඳහා ආහාර පාර්සල් නිකුත් කිරීම පැරණි සභා ශාලාව පිහිටි යාබද ගොඩනැගිල්ලේ බිම් මහලේදී නිකුත් කරනු ලබන බවත් දැනුම් දෙන අතර, ගරු මන්ත්‍රීවරුන්ගේ භෝජනාගාරය භාවිතා කළ හැක්කේ ගරු මන්ත්‍රීවරුන් හා ගරු සභාපතිතුමාගේ අවසර ලත් විශේෂිත අමුත්තන් සඳහා පමණක් වන බැවින් එම භෝජනාගාරය තුළට බාහිර පුද්ගලයන් කැටුව යාමෙන් වළකින් මෙන් සියලුම ගරු මන්ත්‍රීවරුන් වෙත කාරුණිකව දැනුම් දෙනවා."*

මොකද, පසුගිය දවස්වල අපේ මන්ත්‍රී භෝජනාගාරයේ විවිධ පුද්ගලයෝ ඇවිල්ලා, අපේ මන්ත්‍රීතුමන්ලාත් එක්ක වෙන්න ඇති. වෙනත් වෙනත් ආකාරයෙන් වෙන්න ඇති. ඇවිල්ලා භෝජනාගාරයේ ආහාර ගත්තා. ඒක ප්‍රශ්නයකුත් නොවෙයි. නමුත් එක දවසක පිටින් 25 ක් විතර ඇවිල්ලා -

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

දැන් මෙහෙම එකක් තියෙනවා. මම ඕක කල්පනා කළා. ගරු සභාපතිතුමනි, දැන් අපේ මන්ත්‍රීවරුන්ට විශේෂ අය දෙන්නා තුන්දෙනා ඉන්නවා. සමහර වෙලාවට හදිසියේ හම්බ වෙන්න එන අය. ඒ අයට මොකක් හරි වෙනම කොටසක් දෙන්න වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමනි, ඒක කිසිම ප්‍රශ්නයක් නැහැ. එහෙම අයට නිලධාරී භෝජනාගාරය විවෘතයි. කිසිම ප්‍රශ්නයක් නැහැ. මෙතෙක් කල් අපි ඒක ක්‍රියාත්මක කළා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැත්නම් මම කියන්නේ හදිසියේ කාගේ හරි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක අපි කළා. ඒක අපි තේරුම් අරගෙන ඉන්නේ. හැමදාම අපි ඒ දේ කළා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒ කියන්නේ නිලධාරී භෝජනාගාරයේදී එහෙම කෙනෙකුට දෙන්න පුළුවන් නේද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක ගෞරවාන්විතව -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

හැමදාම කවුරුවත් එක්කරගෙන එන්නේ නැහැ. හැබැයි මන්ත්‍රීවරුත් යම් විනයක් ඇතිව කළා නම් හොඳයි කියන එකත් අපි මතක් කරනවා. ආවට ගියාට ගෙන්වන්නේ නැතුව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නමුත් පාර්ලිමේනතුවේ මන්ත්‍රී භෝජනාගාරයට කිසිම කෙනෙකුට එන්න දෙන්නේ නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මන්ත්‍රීවරුන්ගේ එක දෙන්න කියලා නොවෙයි මම මේ කියන්නේ. ඒ අයට එහෙම නම් නිලධාරීන්ගේ ඒකේ ලැහැස්ති කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතෙක් කල් කරගෙන ආව ක්‍රමවේදය ඒකයි. ඒ හැම කෙනෙකුටම නිලධාරී භෝජනාගරය විවෘතයි.

**ගරු ඉසුරු දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මන්ත්‍රීවරුන්ගේ එකට ගන්න ඕනෑ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒකට බාහිර පුද්ගලයෝ ගන්න ඕනෑ නැහැ.

**ගරු ඉසුරු දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මන්ත්‍රීවරුන් දැන ගන්න ඕනෑ. පාර්ලිමේන්තුවේත් නොවෙයි. අපේ සම්ප්‍රදාය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද පැවැත් වෙන්නේ පළමු මහලේ. ඉදිරියේදී මෙහෙට ගන්න බලාපොරොත්තු වෙනවා. එතකොට ප්‍රශ්නයක් නැහැ.

*vi*

*"අදදිනමෙම අභිනව සභා ශාලාවේ පැවැත්වෙන ප්‍රථම පළාත් සභා රැස්වීම නිසා ඇතැම් විට ගරු මන්ත්‍රීවරුන් වෙත ඇතැම් තාක්ෂණික උපාංග මෙහෙයවීම නුහුරු බවක් ඇති වීම ස්වභාවික තත්ත්වයක්. ඊට ක්‍රමක්‍රමයෙන් අනුගතවීමේ හැකියාව ඉදිරියේදී ලැබෙනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. අවශ්‍ය සහාය නොකඩවා කාර්ය මණ්ඩලය මගින් ලබා ගැනීමට හැකියාව තිබෙනවා. ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ හැසිරවීම පිළිබඳව උපදෙස් පත්‍රිකාවක් ද ඔබතුමන්ලාගේ මේසය මත තබා තිබෙනවා. ඒවාද පරිශීලනය කර ක්‍රමානුකූලව මෙම තාක්ෂණික පහසුකම් ලබා ගැනීමට උත්සාහ කරන මෙන් ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.*

*ඉතා ඉක්මණින් මෙම සභා ශාලාවේ මෙම සභා රැස්වීම පැවැත්වීමට කටයුතු කළ නිසා ඇතැම් විට ඇතැම් පහසුකම් ලබා ගැනීමට නොහැකි වුවත් ඉදිරියේදී ඒ සියල්ල ඉටු කර දීමට උත්සාහ ගන්නා බවත් කාරුණිකව දැනුම් දෙනවා."*

*vii*

*"අද දින සභා ශාලාවේ පවතින නව ආසන සැලැස්ම නිසාත්, ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුගේ ඉල්ලීම මත ආසන වෙනස්වීම නිසාත්, තාවකාලිකව අද දින පනවා ඇති ඇතැම් ආසනවල සුළු වෙනස්වීමක් දැනෙන්නට පුළුවන්. ඒ සම්බන්ධයෙන් කිසියම් අපහසුතාවයක්, නොගැළපීමක් යම් ගරු මන්ත්‍රීවරයෙකුට ඇති වී නම් කරුණාකර ඒ බව මට හෝ සභා ලේකම්තුමාට ලිඛිතව දැනුම් දීමක් කරන මෙන් කාරුණිකව ඉල්ලීමක් කරනවා. එවිට සභා රීති ප්‍රකාරව ලබා දීමට හැකි සෑම සහනයක්ම ලබා දීමට කටයුතු කරන බවත් කාරුණිකව දැනුම් දෙනවා."*

*viii*

*"අද දිනයෙන් පසු එළැඹෙන ලබන මස පැවැත්වෙන සභා රැස්වීම් හී ප්‍රධාන කටයුත්ත වන්නේ වාර්ෂික මුදල් ප්‍රකාශය හා සම්බන්ධ කටයුතු හෙයින් එම දිනවල සභා රැස්වීම ආරම්භ වන්නේ පෙ.ව. 09.00 ට (පෙ.ව. 09.30 ට නොව) බව සටහන් කර ගන්නා මෙන් ගරු මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලීමක් කරනවා.*

*viii*

*"අද දින සභා රැස්වීමේදී තාක්ෂණ අංශයෙන් සහාය දීම සඳහා අදාළ ආයතනයේ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණ ශිල්පීන් කිහිප දෙනෙකුට අවශ්‍ය අවසර ලබා දුන් බවද කාරුණිකව දැනුම් දෙනවා."*

මම එකෙන් අදහස් කළේ යම් කිසි ගැටළුවක් වුණොත් එහෙම අපි ඒ ආයතනයට අවසර දීලා තිබෙනවා ඔබගේ මේසය ළඟට පැමිණ හෝ අනියම් ලෙස ඔබතුමන්ලාට සහාය දක්වන්න.

# කාරක සභා වාර්තා පිළිගැන්වීම
## PRESENTATION OF COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

2018.11.07 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that a copy of the relevant report is placed on the tables of the Hon. Members.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලේකම්තුමනි, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉල්ලීමක් කළා මහ බැංකුවෙන් එවන ලද ලිපිය ලබා දෙන්නය කියලා. එය මන්ත්‍රීවරුන්ට ලැබෙන්න සලස්වන්න.

# පෙත්සම්
PETITIONS

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, කොළඹ 14, ග්‍රෑන්ඩ්පාස්, සිරිමුතු උයන, අංක C/FO/U11හි පදිංචි සුරේකා කුමාරි වීරසිංහ යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ලෝලුවාගොඩ, ගිරිඋල්ලගම, තැපැල්වත්ත, අංක 15/13 හි පදිංචි ඩබ්ලිව්.සී. සඳමාලි ද වාස් යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්න, පෙර සභාවේ අතුරු ප්‍රශ්න හා පිළිතුරු සැපයීම
QUESTIONS, INTERIM QUESTIONS OF PREVIOUS MEETING AND ANSWERS TO SUCH

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය ගරු සෞඛ්‍ය ඇමැතිතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumithlal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව නාම ලේඛනයක් තිබෙනවා. මේක කියවන්න වෙලා යනවා. මම මේක සභාගත කරනවා. ඔබතුමාට මේක බලාගන්න පුළුවන්. ඔබතුමාගේ ප්‍රශ්නයට අදාළ සියලුම විස්තර ටික මේකේ තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මම පැහැදිලිව නාම ලේඛනය පසු අවස්ථාවක අහලා තිබෙන්නේ. නමුත් අංක කිහිපයක් අහලා තිබෙනවා. අ, ආ, ඇ කොටස. ඔබතුමා මේ නාම ලේඛනය කියලා කියන්නේ ඇ කොටසට. අ, ආ, ඇ, ඉ කියන කොටස්වලට ඔබතුමාට දැන් උත්තර දෙන්න පුළුවන් නේ?

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඒක පුළුවන්.

**01.**

**සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**[කල් තබන අවස්ථාවේ අසන ලද ප්‍රශ්නය : ප්‍ර/VI(1)/18/ADG - 07]**

අ. 2017 හා 2018 වසර දෙකේදී පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඩෙංගු මර්දන වැඩ සටහන්වලට කොන්ත්‍රාත් පදනමින් පිරිසක් (දිස්ත්‍රික් වශයෙන්) බඳවා ගත්තේද?

ආ. ඔවුන්ගෙන් දැනට ස්ථිර පත්වීම් ලබා ඇති පිරිස කොපමණද? ස්ථිර නොකළ පිරිස කොපමණද?

ඇ. ඔවුන්ගේ නාම ලේඛන (දිස්ත්‍රික්ක වශයෙන්) සභාගත කරන්නේද? නොඑසේ නම් ඒ මන්ද?

ඇ. 2017 හා 2018 වසරවල මෙතෙක් සෙසු රෝහල් කාර්ය මණ්ඩල පුරප්පාඩු සඳහා කොපමණ සේවක පිරිසක් බඳවාගෙන තිබේද? නම් හා තනතුරු ලේඛන සබාගත කළ හැකිද?

ඉ. 2017 හා 2018 වසරවල මෙතෙක් පළාතේ ආයුර්වේද රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථානවල සේවය සඳහා බඳවාගත් තාවකාලික හා ස්ථිර පත්වීම් සංඛ්‍යා හා නාම ලේඛන (දිස්ත්‍රික්ක වශයෙන්) සභාගත කරන්නේද? නොඑසේ නම් ඒ මන්ද?

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

අ. කොළඹ දිස්ත්‍රික්කය - 44
ගම්පහ දිස්ත්‍රික්කය - 102
කළුතර දිස්ත්‍රික්කය - 82

ආ. ස්ථිර පත්වීම් ලබා ඇති පිරිස - 189
ස්ථිර නොකළ පිරිස - 30

ඇ. ස්ථිර පත්වීම් ලබා ඇති පිරිස - 189
ඇමුණුම් 01[1] (කොළඹ - 33)
ඇමුණුම් 02[2] (ගම්පහ - 85)
ඇමුණුම් 03[3] (කළුතර - 71) දිස්ත්‍රික්ක වශයෙන් වෙන් වෙන්ව අමුණා ඇත.

ස්ථිර නොකළ පිරිස - 30
ඇමුණුම් 04[4] ලෙස අමුණා ඇත.

ඈ. 2017 සඳහා 35 ක් සහ 2018 සඳහා 163 ක් ලෙස 198 ක් බඳවාගෙන ඇත.

තතුරු ලේඛන පහත පරිදි වේ. නාම ලේඛනය ඇමුණුම් 05[5] ලෙස අමුණා ඇත.

**2017 වර්ෂය**

| | |
|---|---|
| සෞඛ්‍ය රියදුරු | 11 |
| තාවකාලික රියදුරු | 15 |
| වෛද්‍ය සැපයුම් සහකාර | 09 |
| එකතුව | 35 |

**2018 වර්ෂය**

| | |
|---|---|
| සෞඛ්‍ය කාර්ය සහායක | 112 |
| උපස්ථායක | 33 |
| දුරකථන ක්‍රියාකරු | 01 |
| රසායනාගාර සේවක | 02 |
| අරක්කැමි | 11 |
| ජනක යන්ත්‍ර ක්‍රියාකරු | 02 |
| පෙදරේරු | 01 |
| වඩු කාර්මික | 01 |
| එකතුව | 163 |

[1] හැන්සාඩ් අංශයේ තබා ඇත.
[2] - එම -
[3] - එම -
[4] - එම-
[5] - එම -

ඉ. ඔව්.
තාවකාලික බඳවා ගැනීම් කර නැත.
ස්ථිර පත්වීම් තනතුරු ලේඛන පහත පරිදි වේ. නාම ලේඛනය ඇමුණුම් 06[6] ලෙස අමුණා ඇත.

| | |
|---|---|
| රියදුරු | 01 |
| ආයුර්වේද සේවා සහායක | 69 |
| උපස්ථායක | 12 |
| ඖෂධ සංයෝජක | 10 |

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ගරු ඇමැතිතුමා දැන් මේ කියපු නාම ලේඛනය අනුව 2017 වර්ෂයේදී 228 ක් බඳවාගෙන තිබෙනවා. මේ පිරිස හැර පසුගිය බදාදා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට එනවා 135 දෙනෙක්. මේ 135 දෙනා බඳවා ගත්තු බව ගරු ඇමතිතුමා දන්නවාද?

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඔව්. මෙහෙමයි. දැන් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් නිතර පැමිණිලි ආවා අපේ සෞඛ්‍ය මධ්‍යස්ථානවල, ඒ වාගේම රෝහල්වල - විශේෂයෙන් ගම්පහ රෝහලේ, දොම්පේ රෝහලේ කම්කරුවෝ නැතුව වාට්ටුවක් වැහුවා. ඒ වාගේ ප්‍රශ්න එනකොට අපි භාණ්ඩාගාරයෙන් ඉල්ලා තිබුණා පත්වීම් 500 ක් අනුමත කරලා දෙන්නය කියලා. අපට පත්වීම් ලැබිලා තිබුණේ 300 යි. 300 න් 225 ක් තාවකාලික පදනම මත බඳවා ගත්තු අට පාස්, සාමාන්‍ය පෙළට පෙනී සිටි අය ස්ථිර කරන්න අපට සිද්ධ වුණා. අවුරුද්දකට වැඩිය ඒ සේවකයෝ වැඩ කරලා තිබුණා. ඒ අයව අපි කොන්ත්‍රාත් පදනම මත ස්ථිර කළා. එතැනට 225 ක් ගියා. තව 75 යි ඉතුරු වුණේ. ඒ 75 ත් තවත් අමතරව උසස්වීම්වලින් උපස්ථායකයන් ලෙස ගියාට පස්සේ ඇති වන ඇබෑර්තුත් එකතු වුණාට පස්සේ තමයි 130 ක් වුණේ. ඒ සඳහා ප්‍රසිද්ධ දැන්වීමක් කරලා, අයදුම්පත් කැඳවලා, සම්මුඛ පරීක්ෂණයක් තියලා තමයි තෝරා ගත්තේ. එහෙම තමයි පත්වීම් දුන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු ඇමැතිතුමා මේ බඳවා ගැනීම් කළේ කවර පුවත්පතකද? වෙබ් අඩවියකද? සඳහන් කළේ.

[6] හැන්සාඩ් අංශයේ තබා ඇත.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

මේක වෙබ් අඩවියේ තමයි. සාමාන්‍යයෙන් -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, සාමාන්‍ය ක්‍රමවේදය අනුව පුවත්පත් දැන්වීමක් පළ කරන්න ඕනෑ. පුවත්පත් දැන්වීමක් පළ නොකළ බව ඔබතුමා දන්නවාද?

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ඔව්. පුවත්පත් දැන්වීමක පළ කරලා නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එතකොට සාමාන්‍ය ක්‍රමවේදයෙන් බැහැර නේද ගරු ඇමැතිතුමා මේක වෙලා තිබෙන්නේ?

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

නැහැ, සාමාන්‍යයෙන් රජයේ හුඟක් ආයතනවල දැන් බඳවා ගැනීම් කරන්නේ වෙබ් අඩවියේ දාලා තමයි. මේකට අයදුම්පත් විශාල ප්‍රමාණයක් ඇවිල්ලා තිබුණා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේ සම්මුඛ පරීක්ෂණය පැවැත් වූ දිනය ගැන ඔබතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ ප්‍රශ්න ඇසීමේ කාලය අවසන් වෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, අන්තිම ප්‍රශ්නය. ගරු ඇමැතිතුමාට කියන්න පුළුවන්ද කවදාද මේ සම්මුඛ පරීක්ෂණ තිබ්බේ කියලා.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

මට දින මතක නැහැ. මම දින මෙතැනට අරගෙන ඇවිල්ලා නැහැ මන්ත්‍රීතුමා.

**ගරු රසික මංජුල බුද්ධදාස**
Hon. Rasika Manjula Buddhadasa

ඒවා හරියට කරලා තිබෙන්නේ. ඒවායේ ප්‍රශ්නයක් නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හරි, හරි. ඔබතුමා ඉන්න කෝ. ඔබතුමාගේ නොවෙයි ප්‍රශ්නය. මගෙයි ප්‍රශ්නය. ඔබතුමා කොහේද ඉඳලා හදිසියේ මෙතැනට කඩා වැදිලා. ඔබතුමා දන්නවාද මොකක් ගැනද අහන්නේ කියලා. එහෙම නම් ඔබතුමාටත් අවස්ථාවක් ලැබෙන්න ඇති. පොඩ්ඩක් ඉන්න. මේක අපේ අයිතිවාසිකම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට රීති අනුව ප්‍රශ්න තුනක් අහන්න පුළුවන්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ප්‍රශ්නයක් අහන්න තිබෙන අයිතියට එතුමා කොහොමද බාධා කරන්නේ? මේ අහසින් පාත් වුණා වාගේ ඇවිල්ලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා. දීර්ඝ වශයෙන් අතුරු ප්‍රශ්න අහන්න දෙන්න බැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ප්‍රශ්නය මගේ. ගරු සභාපතිතුමනි, 2017 බඳවා ගත්තු 228 ට අමතරව 225 ක් බඳවා ගන්න පුළුවන්. සම්මුඛ පරීක්ෂණ පවත්වලා මේ බඳවා ගැනීම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා අවසන් කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, ප්‍රශ්න තුනයි අහන්න පුළුවන්. ප්‍රශ්න හයකට විතර උත්තර දුන්නා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේ පිළිබඳව ගිණුම් කාරක සභාවේ පරීක්ෂණයකුත් කෙරෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විවාදයකට යන්න දෙන්න බැහැ. ප්‍රශ්න අහලා ඉවර වෙලා. ඔබතුමා අතුරු ප්‍රශ්න තුනක් ඇහුවා නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමාගෙන් මම ඉල්ලනවා, අපේ සෞඛ්‍ය ඇමැතිතුමාගෙන් මම මේ අහපු ප්‍රශ්නවලට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා, එතුමාට පස්සේ හරි උත්තරයක් දෙන්න.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, සභාගත කරනවා. අතුරු ප්‍රශ්නවලට උත්තර දුන්නා. තුනක් නොවෙයි. පහකට විතර උත්තර දුන්නා. එතුමාට මේක බලන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා සභාගත කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මගේ ප්‍රශ්න හරි සරළයි. මම ඔබතුමාට ඕනෑ නම් වෙන ඒ ප්‍රශ්න ටික දෙන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, 37 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මෙම බඳවා ගැනීම් ගැන මීට ඉහතත් මේ සභාවේ කථා කළා. එදා මෙතුමා ලොකු ප්‍රකාශයක් කළා මන්ත්‍රීවරුන්ට බෙදා හැරියා කියලා. මේ වනකොට ගිණුම් කාරක සභාවට ඇවිල්ලා තිබෙනවා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒගොල්ලෝ තමයි එහෙම නම් මේ කෑගහන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගියවර 228 දෙනෙක් බඳවා ගත්තු සේවකයන්ට අවුරුද්දේ මුල අයවැයෙන් මුදල් වෙන් නොකර, එක් එක් විෂයයන්වලට වෙන් කළ මුදල්වලින්, මුදල් ඒකරාශී කරගෙන, ඒ කාලසීමාව තුළ ඒ අයට වැටුප් ගෙවලා අධි අයවැයක් හැටියට වෙනත් මුදලක් වැඩිපුරත් ගෙවලා තිබෙනවා. ඒ වාගේම මේ වසරේත් 135 දෙනෙක් නැවත බඳවාගෙන මේ වසරේත් මුදල් වෙන් නොකර මේ වසරේත් වැටුප් ගෙවීමට තවත් ප්‍රශ්න රාශියකට මුහුණ දෙන්න පුළුවන් විධියට අද ගිණුම් කාරක සභාවට මේ පැමිණිලි ටික ලැබිලා තිබෙනවා. ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් අපි මහ ඇමැතිතුමාට මේක යොමු කරනවා. මොකද, මහ ඇමැතිතුමාත් මේක දැක්කා. පසුගිය ගිණුම් කාරක සභාවලට මහ ඇමැතිතුමා සහභාගී වුණු නිසා. කිසිම වසරක අයවැයට සේවකයෝ බඳවා ගැනීම්වලට මුදල් වෙන් නොකර වෙනත් විෂයයන්වලට වෙන් කරපු මුදල්වලින් තමුන්ට ඕනෑ විධියට පත්තරේ දාලා, වෙබ් එකේ දාලා සේවකයෝ බඳවා ගෙන වැටුප් ගෙවන්න පුළුවන් ක්‍රමවේදයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නයක් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගියවර මේ ඔක්කෝම ඉන්න අතරේ මෙතුමා පැහැදිලිව මේ සභාවේ කිව්වා මන්ත්‍රීවරුන්ට මේවා ලබා දුන්නා කියලා. විශේෂයෙන්ම මගේ නම සඳහන් කළා මට පස් දෙනෙක් ලබා දුන්නා කියලා. මම එදා කිව්වා දුන්නා නම්, එතුමාට ඔප්පු කරන්න කියලා. දැන් මේකෙන් හොඳාකාරවම පේනවා මොකද, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පහක් දුන්නා නම් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමා ඇවිල්ලා පැහැදිලිව කිව්වා කාර්යාලය ඉස්සරහා 135 දෙනෙක් ඉන්නවා කියලා. අපිත් දැනගන්න ඕනෑ මොන ක්‍රමවේදයටද මේවාට බඳවා ගත්තේ කියලා. අපටත් අයිතියක් තිබෙනවා බඳවා ගන්න. මන්ත්‍රීවරුන්ට බෙදුවා නම් මොන ක්‍රමවේදයටද, මොන පදනමකින්ද බෙදුවේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ ඉතින් ඕක මෙහෙමයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මොන ක්‍රමවේදයකට බෙදුවේ කියලා අපට දැනගන්න ඕනෑ. 228 දෙනෙක් බඳවාගෙන. 135 ක් එක්ක කියන්නේ 400 කට ආසන්න සංඛ්‍යාවක්. මේක දැනුවත් වෙන්න ඕනෑ. පළාත් සභා මන්ත්‍රීවරු හැටියට අපි කවුරුත් දන්නේ නැහැ. අපව දැනුවත් කරලත් නැහැ. පත්තරේ දාලත් නැහැ. වෙබ් එකේ දාලා තම තමන්ට ඕනෑ විධියට, තම තමන්ගේ හිතවත් අයට මේක බෙදුවා නම් සම්පූර්ණ වැරදියි. ඒ නිසා මේකට තීන්දුවක් ගන්න ඕනෑ.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, මේකට මම උත්තරයක් දෙන්නම්. ගරු සභාපතිතුමනි, ඩෙංගු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතැන දැන් අනවශ්‍ය විවාදයක් යන්නේ.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

මම මේකට උත්තරයක් දෙන්න ඕනෑ. මේ සභාව දැනගන්න. ඒ මොකද දන්නවාද? මේ ප්‍රශ්නය ආවේ තමුන්නාන්සේ දන්නවා පසුගිය අවුරුද්දේ ඩෙංගු උවදුර ඇති වුණු වෙලාවේදී අපේ සේවකයින් - මෙතැන ඉන්නවා නියෝජ්‍ය සභාපතිතුමා. මෙතුමාගෙන් මට බේරෙන්න බැරි වුණා ට්‍රොලිය තල්ලු කරන්න කෙනෙක් නැහැයි කියලා. ලෙඩ්ඩු ගෙනියන්න විධියක් නැහැයි කියලා. ඒ වෙලාවේ තමයි 225 ක් තාවකාලිකව බඳවා ගත්තේ. ඒක තමයි පළාත් සභාවට අමතර මුදලක් දරන්න වුණේ. මම දන්න විධියට. ඒක ගරු ප්‍රධාන ඇමැතිතුමාත් දන්නවා. ඒක නිසා තමයි සේවකයින් මේ විධියට බඳවා ගන්න සිද්ධ වුණේ. නැතුව මට ගෙදර ගෙනියන්න නොවෙයි සේවකයෝ බඳවා ගත්තේ. සමහර මන්ත්‍රීවරු ලියුම් එව්වා. පත්තරේ දැම්මාම දැම්මා. ඒවා කළා. ඉතින් ඒවා එහෙම වුණා. නමුත් මගේ ළඟ ලැයිස්තු තිබෙනවා. මම ඒවා කියන්න යන්නේ නැහැ. දැන් විවාදයකට යන්න අවශ්‍යතාවයක් නැහැ. නමුත් අපි කරන්නේ සේවාවක්. ඒක නිසා මේ සේවාවේදී නීත්‍යානුකූලව ඒ වැඩේ කරලා තිබෙනවා. නීතියට පටහැනිව කරලා තිබෙනවා නම් උසාවිය තිබෙනවා යන්න. එච්චරයි.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව දුන්නා වාගේ මටත් පොඩි අවස්ථාවක් ඕනෑ. මම සෞඛ්‍ය උපදේශක කාරක සභාවේ ඉන්න මන්ත්‍රීවරයෙක් වශයෙන් බස්නාහිර පළාතේ වැඩිපුරම රෝහල් තිබෙන්නේ අපේ යටතේ. රජය යටතේ නොවෙයි. මේ හැම රෝහලකම ප්‍රශ්න තිබෙනවා. සේවකයෝ බඳවා ගත්තු ක්‍රමවේදය මම දන්නේ නැහැ. නමුත් අදටත් සේවක පුරප්පාඩු සෑහෙන සංඛ්‍යාවක් අපේ රෝහල්වල තිබෙනවා කියන එක මම මේ සභාවට මතක් කරනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, දැන් ඔබතුමා පිළිගන්න -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමනි, අපි දැන් න්‍යාය පත්‍රයට යමු.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

225 ක් බඳවා ගත්තේ ඩෙංගු වසංගතය නිසා නම් දැන් මේ 135 බඳවා ගත්තේ ඩෙංගු වසංගතය නිසාද? හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමා, අපි පිළිගන්නවා සේවක පුරප්පාඩු තිබෙනවා ඇති. ඒක හරි. නමුත් බඳවා ගන්න ක්‍රමවේදයක් තිබෙනවා. බඳවා ගන්න කියන්න නියමිත ක්‍රමවේදයට. සේවක පුරප්පාඩු තිබුණා කියලා එහෙම බඳවා ගන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි න්‍යාය පත්‍රයට යමු.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සේවක පුරප්පාඩු තිබෙනවා කියලා බඳවා ගන්න ක්‍රමවේදයට බඳවා ගන්න ඕනෑ. පුරප්පාඩුවලට බඳවා ගන්න එක හරි.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අවශ්‍යතාවය මත බඳවාගෙන තිබෙන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපිත් කියනවා බඳවා ගන්න ඕනෑ කියලා. හැබැයි ක්‍රමවේදයට.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ඒ දවස්වල ක්‍රමවේද තිබුණේ නැහැ නේ?

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ඒක ඔබතුමන්ලා විසඳගන්න. ආණ්ඩු පක්ෂයේ අය නේ? අපි විපක්ෂයේ ඉන්නේ. ඔයගොල්ලෝ ක්‍රමවේදය විසඳගන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

විපක්ෂයෙන් තමයි ප්‍රශ්නය අහලා තිබෙන්නේ. අපි නොවෙයි.

**ගරු පංචරත්නම් රාම්**
Hon. Pancharathnam Ram

ගරු සභාපතිතුමනි, මටත් අවස්ථාව දෙන්න මේ ගැන වචන ස්වල්පයක් කථා කරන්න. එදා ගිණුම් කාරක සභාවේත් මේ ගැන අපි සාකච්ඡා කළා. එතකොට එදා ඒ සභාවට ඇවිල්ලා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමනි, මේක විවාදයක් නේ? න්‍යාය පත්‍රයට යන්න එපැයි.

[සභාවේ ඝෝෂා]

**ගරු හෙක්ටර් බෙත්මගේසභා නායකතුමා -**
Hon. Hector Bethmage - Leader of the House

මේ අනවශ්‍ය ප්‍රශ්නයකට යන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අද මහ ඇමැතිතුමාගේ මුදල් ප්‍රකාශය කියවන්නත් ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම කරන්න එපා. එහෙම හරි නැහැ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ප්‍රශ්නයක් තිබෙනවා නම් උසාවි ගිහිල්ලා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේක සමථයකට පත් කරන්න. ඔබතුමා අතේ තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය ගරු ප්‍රධාන ඇමතිතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඊළඟ ප්‍රශ්නයත් ඔබතුමාගේ. ගරු අධ්‍යාපන ඇමැතිතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

## 03.

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :** **[කල් ගන්නා ලද ප්‍රශ්නය : ප්‍ර/VI/(1)/18/71]**

අ. මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපයේ මීරිගම කොට්ඨාශයේ අංක 3 දෙල්වල ග්‍රාම නිලධාරී වසමේ කලගහවත්ත හෙවත් ඊට්ගහවත්ත නමැති ඉඩමක් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සතුව තිබේද? යන්න සභාවට දන්වන්නෙහිද?

ආ. තිබේ නම් එකී ඉඩමේ මුල් අයිතිකරුවන් කවුරුන්ද?

ඇ. එම ඉඩම කුමන පදනමක් යටතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පවරා දී ඇත්ද? යන්නත්, මේ වන විට ඉඩමේ භාරකාරත්වය දරන්නේ කවුරුන්ද? යන්නත් සභාවට දන්වන්නෙහිද?

ඈ. මේ වන විට එකී ඉඩමේ වාර්ෂික බදු පදනමක් යටතේ හෝ එලදාව රැස් කිරීම පදනම යටතේ බදු දී ඇති බව ඔබතුමා පිළිගන්නෙහිද?

ඉ. එසේ බදු දී ඇත්තේ කාටද? යන්නත්, අවසන් වරට බදු දී ඇති මුදල හා අදාළ අය තෝරා ගැනීමේ දී නිසි ක්‍රමවේදයක් අනුගමනය කළේද? යන්න සභාවට දන්වන්නෙහිද?

ඊ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

අ. දැනට මීරිගම ප්‍රාදේශීය ලේකම් භාරයේ මෙම ඉඩම පවතී.

ආ. දැනට මීරිගම ප්‍රාදේශීය ලේකම් භාරයේ පවතින අතර, ලිපි ලේඛන අනුව පාවුලු සිල්වා අප්පුහාමි යන අය මුල් අයිතිකරු බව පෙනී යයි.

ඇ. ගුරු අභ්‍යාස විද්‍යාලයක් පිහිටුවීම සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පවරා ඇති නමුත්, මේ වන විටත් ගුරු අභ්‍යාස විද්‍යාලයක් පිහිටුවා නොමැති බැවින් දැනට මීරිගම ප්‍රාදේශීය ලේකම් භාරකාරත්වයේ මෙම ඉඩම පවතී.

ඈ. නොදනී.

ඉ. අදාළ නොවේ.

ඊ. අදාළ නොවේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මට ලැබී ඇති තොරතුරු අනුව මෙම ඉඩම මේ වනවිට බදු දීලා තිබෙනවා. මේක රජයේ ඉඩමක්. මේ බදු ගත්තු අය මේ ඉඩම අපහරණය කරමින් තිබෙනවා. ඔබතුමා ඒ පිළිබඳව තොරතුරු නොදන්න බව තමයි මේ සභාවට කිව්වේ. එතකොට ඒ සම්බන්ධව සොයා බලා ගනු ලබන පියවර කුමක්ද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමාගේ අවසරය පරිදි මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා හතර වන ප්‍රශ්නය ඉදිරිපත් කරලා තිබෙනවා. ඒකටත් මෙතැන පිළිතුරක් තිබෙනවා. නමුත් එතුමාගේ ඉල්ලීමට මම පිළිතුරක් දෙන්නම්. ගරු සභාපතිතුමනි, මේ ඉඩම රජයේ ක්‍රියා පටිපාටිය අනුව යම්කිසි ඉඩමක් ප්‍රාදේශීය ලේකම් භාරයේ පවතිනවා නම් අපට සාකච්ඡා කරන්න වෙන්නේ, තොරතුරු ලබා ගන්න වෙන්නේ, ගණුදෙනු කරන්න වෙන්නේ ප්‍රාදේශීය ලේකම්තුමාත් එක්ක හෝ තුමියත් එක්ක. ප්‍රාදේශීය ලේකම් එක්ක. ඒ නිසාවෙන් ඇත්තටම මේ තොරතුරු සොයා බැලුවාම එවැනි දේවල් අපට බාහිරින් දැනගන්න

ලැබුණත්, අපට ගණුදෙනු කිරීමේ අයිතියක් නැහැ. මොකද, අධ්‍යාපන අමාත්‍යාංශයට මේ ඉඩම ලැබිලා නැහැ. යෝජනා විතරයි තිබෙන්නේ. දැනට ප්‍රාදේශීය ලේකම් යටතේ මේ ඉඩම තිබෙන්නේ. රජයේ පවතින සියලුම ගොඩනැගිලි හෝ වෙනත් දේවල් වසා දැමූ වෙලාවක හෝ ක්‍රියාත්මක නොමැති වෙලාවක රජයේ භාරකාරත්වයට පත් වනකොට ඒ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් යටතට යනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තූතියි ගරු ඇමැතිතුමා. හතර වන ප්‍රශ්නයත් මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමාගෙන්මයි. අධ්‍යාපන ඇමැතිතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**04.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :** **[කල් ගන්නා ලද ප්‍රශ්නය : ප්‍ර/VI/(1)/18/72]**

අ. අධ්‍යාපන දෙපාර්ත්මේන්තුවට අයත් මීනුවන්ගොඩ අධ්‍යාපන කලාපයේ මීරිගම කොට්ඨාශයේ අංක 3 දෙල්වල ග්‍රාම නිලධාරී වසමේ කලගහවත්ත හෙවත් ඊට්ගහවත්ත නමැති ඉඩම පවරා දීමට අදාළ කටයුත්තට බාහිර කටයුතු සඳහා භාවිතා කරන බව එබතුමා දන්නෙහිද?

ආ. එකී ඉඩම මුල් අයිතිකරුට පවරා දීමට තීරණය කර ඇත්ද? යන්න ඔබතුමා සභාවට දන්වන්නෙහිද?

ඇ. මේ වන විට එකී ඉඩමෙන් පෞද්ගලික පරිහරණය සඳහා පාරක් කපා ඇති බවත්, ඉඩමේ මායිමෙන් ගලා බසින ඔය රක්ෂිතයට හානිවන පරිදි පෞද්ගලික අවශ්‍යතාව සඳහා ස්ථිර පාලමක් ඉදිකර ඇති බවත් ඔබතුමා දන්නෙහිද?

ඈ. ඒ සඳහා අවසරය ලබා දුන්නේ කවුරුන්ද? යන්න සභාවට දන්වන්නෙහිද?

ඉ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අ. දැනට මීරිගම ප්‍රාදේශීය ලේකම් භාරයේ මෙම ඉඩම ඇති බැවින් බාහිර කටයුත්තකට යොදා ගන්නේ දැයි නොදනී.

ආ. එවැනි පවරා දීමක් පිළිබඳව වාර්තාව වී නැත.

ඇ. නොදනී.

ඈ. අප විසින් එවැනි අවසරයක් ලබා දී නැත.

ඉ. අදාළ නොවේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, දැන් මේ ඉඩම අධ්‍යාපන දෙපාර්තමේන්තුවට තමයි මෙහි මුල් අයිතිකරුවන් විසින් පවරා දී තිබෙන්නේ. එතකොට මේක දැන් වනකොට -

**ගරු හෙක්ටර් බෙත්මගේසභා නායකතුමා -**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්න අහනකොට කරුණු පැහැදිලි කරන්න දෙන්න බැහැ. එක්කෝ අතුරු ප්‍රශ්න අහන්න ඕනෑ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පොඩ්ඩක් ඉන්න කෝ?

**ගරු හෙක්ටර් බෙත්මගේසභා නායකතුමා -**
Hon. Hector Bethmage - Leader of the House

ඒකෙන් නේ මේ සභාව හැම වෙලාවේම නොමග යන්නේ. අතුරු ප්‍රශ්න අහන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් අතුරු ප්‍රශ්නය අහන්න. දීර්ඝ විස්තරවලට යන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

වැඩක් නැති බයිලා ගහන්න සභාවේ කාලය දෙන්න පුළුවන්.

[සභාවේ ඝෝෂා]

ප්‍රශ්න අහන එක තීරණය කරන්නේ මම. ඒක කවුරුවත් තීරණය කරන්නේ කොහොමද?

**ගරු හෙක්ටර් බෙත්මගේසභා නායකතුමා -**
Hon. Hector Bethmage - Leader of the House

ඔබතුමාගේ කරුණු අපට වැඩක් නැහැ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රශ්නය අහන එක මම තීරණය කරන්නේ.

**ගරු හෙක්ටර් බෙත්මගේසභා නායකතුමා -**
Hon. Hector Bethmage - Leader of the House

ප්‍රශ්න අහන්න පුළුවන්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමාට ඕනෑ විධියට මම ප්‍රශ්න අහන්නේ නැහැ. ඒක සභාපතිතුමා තීරණය කරයි. ඔබතුමා කවුද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි මන්ත්‍රීතුමා ඔබතුමා කෙටියෙන් ප්‍රශ්නය අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේක මාර අමාරුවක් තියෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා සභානායකතුමා නේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ සභාවේ මන්ත්‍රීවරු 104 දෙනාටම සමාන අයිතියක් තිබෙනවා. ඒක එක එක්කෙනාට ඕනෑ විධියට පාවිච්චි කරන්න බැහැ. අනෙක් එක අපි ලැහැස්තිත් නැහැ එක එක්කෙනා කියන විධියට ප්‍රශ්න අහන්න. ඔබතුමා කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා අතුරු ප්‍රශ්න අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා යම් බාධාවක් කළොත් මම ඒකට සවන් දෙන්නම්. ඒක වෙනම කාරණයක්. මගේ ප්‍රශ්නය ගරු ඇමැතිතුමා මේ ඉඩම මුලින්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුවට තමයි පවරා තිබෙන්නේ. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය එතකොට මේ වනකොට ප්‍රාදේශීය ලේකම් භාරයේ තිබුණා කියලා, අධ්‍යාපන දෙපාර්තමේන්තුවට වගකීමක් නැද්ද මේ සම්බන්ධයෙන් සොයා බලන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අවසරය මත මම එතුමාට යෝජනා කරන්න කැමැතියි. මේ වාගේ ගැටළු විසඳා ගන්න තිබෙන - සමාවෙන්න මම පැහැදිලි කරනවාට. මටත් චෝදනා එයිද දන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් පැහැදිලි කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මේ වාගේ ගැටළු සහගත තත්ත්වවලදී අපට යන්න තිබෙනවා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව කියලා එකක්. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක තිබෙනවා. මම පිළිගන්නවා එතුමා ඉතාම යහපත් චේතනාවෙන් මේ ප්‍රශ්නය නැඟුවේ. මොකද, පළාත් සභාවකට හෝ අදාළ තැනකට පවරා තිබියදී ඇයි මේ ප්‍රාදේශීය ලේකම් යටතේ මේ ඉඩම තිබෙන්නේ? ඇයි වෙනත් අය මේ ඉඩමට ඇතුල් වෙලා විවිධ කාරණා කරන්නේ කියන කාරණාව එතුමා හදවතින් දැඩි ඕනෑකමකින් ඇහුවා කියන එක මම පිළිගන්නවා. හැබැයි පළාත් සභාවට හෝ මොන ආයතනයට ආවත් ඉදි කිරීමක් නොමැති තැනදී මේ ඉඩමේ භාරකාරත්වය යන්නේ ප්‍රාදේශීය ලේකම්ට. ඒක නිසා මමත් එතුමාට සහාය වෙන්න කැමැතියි. මේ කාරණා විසඳගන්න වෙන්නේ ඒ පළාතේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවෙන්. මීනුවන්ගොඩ. එසේත් නැත්නම් ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙන්. අපි කැමැතියි මේ ප්‍රශ්නය මෙතුමා එහේට දානවා නම්. අපේ අදහස් එතැනදී ඉදිරිපත් කරන්නම්. බොහොම ස්තුතියි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

බොහොම ස්තූතියි. නමුත් දැන් මේ ඉඩමේ මේ වනකොට පාරක් - මම මේ ඉඩම විමර්ශනය කළා. ඒ වාගේම මේකේ පාරක් කපලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට පුළුවන් ගම්පහ DCC රැස්වීමට ඕවා ඉදිරිපත් කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නමුත් මට අවධාරණය කරන්න ඕනෑ අධ්‍යාපන අමාත්‍යාංශයට වගකීමක් තිබෙනවා. මේක පවරා තිබෙන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයට. අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මේ ඉඩමේ කිසිවක් නොකරපු නිසා තමයි අද මෙවැනි වටපිටාවක් උද්ගත වෙලා තිබෙන්නේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, එතුමාට සහාය වෙන්න මම කැමැතියි.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

ගරු සභාපතිතුමනි, මම මීරිගම සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපති හැටියට ඉන්නේ. මීරිගම ආසනයේ. ඒක නිසා මම දන්න නිසා කිව්වේ. ඇත්තටම පළාත් සභාවේ අධ්‍යාපන ඇමැතිතුමාට මේ ඉඩම අයිති නැහැ. මේක අයිති මහ ආණ්ඩුවට. මධ්‍යම රජයට අයිති ඉඩමක් කියලා මේ අවස්ථාවේ කියන්න කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්න ගරු ප්‍රධාන ඇමැතිතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**05.**

**ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : [ප්‍ර/VI/(1)/18/73]**

අ. 2014 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් සභාවේ ස්ථාවර තැන්පත්, විවිධ ආයෝජනයන්, ඉතිරි කිරීම් ඇතුළුව මූල්‍යමය වත්කම් වල මුළු වටිනාකම කීයද?

ආ. එදිනට එහි බැංකු ගිණුම් ශේෂයන් පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

ඇ. 2018 ඔක්තෝබර් 31 දිනට ස්ථාවර තැන්පත්, විවිධ ආයෝජනයන්, ඉතිරි කිරීම් ඇතුළුව මූල්‍යමය වත්කම් වල මුළු වටිනාකම කීයද?

ඈ. එදිනට එහි බැංකු ගිණුම් ශේෂයන් පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරන්නේද?

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

අ. 2014 දෙසැම්බර් 31 දිනට "භාණ්ඩාගාරයේ රිපෝ" යටතේ ආයෝජනය කර ඇති මුදල රුපියල් මිලියන 6,650 කි.

ආ. එම බැංකු ගිණුම් ශේෂයන් පිළිබඳ වාර්තාවක් ඇමුණුම 01 වශයෙන් සභාගත කරමි.

**<u>2014.12.31</u>** <u>දිනට භාණ්ඩාගාරයේ රිපෝ ආයෝජන</u>

**ලංකා බැංකුව ගිණුම් අංකය 0002323302**

**මහජන බැංකුව ගිණුම් අංකය 004100170209804**

| | බැංකුව | තැන්පත් කළ දිනය | කල් පිරෙන දිනය | තැන්පත් කළ මුදල (රු.මි.) |
|---|---|---|---|---|
| 1 | ල/බැ | 2014.11.04 | 2015.05.05 | 400 |
| 2 | ල/බැ | 2014.11.07 | 2015.05.08 | 1,250 |
| 3 | ල/බැ | 2014.11.18 | 2015.05.19 | 1,000 |
| 4 | ල/බැ | 2014.12.02 | 2015.06.03 | 2,000 |
| 5 | ම/බැ | 2014.12.26 | 2015.06.26 | 2,000 |
| | තැන්පත් කළ මුළු මුදල (රු.මි.) | | | **6,650** |

ඈ. 2018 ඔක්තෝබර් 31 දිනට "භාණ්ඩාගාර රිපෝ" යටතේ ආයෝජනය කර ඇති මුදල රුපියල් මිලියන 8,750 කි.

ඇ. එම බැංකු ගිණුම් ශේෂයන් පිළිබඳ වාර්තාවක් ඇමුණුම 02 වශයෙන් සභාගත කරමි.

**2018.10.31** **දිනට භාණ්ඩාගාරයේ රිපෝ ආයෝජන**

**ලංකා බැංකුව ගිණුම් අංකය 0002323302**

| | බැංකුව | තැන්පත් කළ දිනය | කල් පිරෙන දිනය | තැන්පත් කළ මුදල (රු.මි.) |
|---|---|---|---|---|
| 1 | ල/බැ | 2018.05.08 | 2018.11.07 | 1,750 |
| 2 | ල/බැ | 2018.05.15 | 2018.11.13 | 1,000 |
| 3 | ල/බැ | 2018.05.30 | 2018.11.28 | 2,000 |
| 4 | ල/බැ | 2018.06.05 | 2018.12.04 | 2,000 |
| 5 | ල/බැ | 2018.06.26 | 2018.12.26 | 2,000 |
| | **තැන්පත් කළ මුළු මුදල (රු.මි.)** | | | **8,750** |

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අතුරු ප්‍රශ්න සඳහා පිළිතුරු සූදානම් නම් ගරු අමාත්‍යවරුන්ට ඒ සඳහා අවස්ථාව.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, මම ගියවර අධ්‍යාපන ඇමැතිතුමාට ඉදිරිපත් කරපු ප්‍රශ්නයකදී ප්‍රශ්න දෙකකට පිළිතුරු සැපයීම අද කරනවා කියලා කිව්වා. එතුමා සූදානම් නම් මට පිළිතුරු ලබා ගන්න අවශ්‍ය වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා සූදානම්ද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මම අවංකව සමාව ඉල්ලා සිටිනවා. තොරතුරු ගොඩක් රැස් කළ යුතු කාරණාවක් තිබෙනවා. මම ඊළඟ අවස්ථාවේදී උත්තර දෙනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, 37(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මේ නව පළාත් සභාවේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතියි. මම හිතන්නේ මෙච්චර විශාල මුදලක් වැය කරලා, ඉතාමත් අලංකාර, ලස්සන පළාත් සභාවක් අපේ හිටපු ගරු මහ ඇමතිතුමාත්, වර්තමාන ගරු මහ ඇමතිතුමාත් වර්තමානයේ අපට දායාද කරලා තිබෙනවා. එතැනදී මම හිතන්නේ, සමහර කුහකයන්ගේ වැඩ හින්දා මේ පළාත් සභාවට ඔබින පුටුවක් ලබා දීමට නොහැකි වුණා. දැන් අර බලන්න ගැලරියේ ප්ලාස්ටික් පුටුවක් තියලා තිබෙනවා. මම හිතන්නේ මේ තාවකාලිකව ද දන්නේ නැහැ. ඒවා ඉවත් කරලා කවුරු මොනවා කිව්වත් මේවාට ගැලපෙන ආකාරයේ ඒවා ලබා දෙන්නය කියලා ඉල්ලනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, අපි ඉදිරියේදී අනිවාර්යයෙන්ම කටයුතු කරනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මොකද මේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]*
*[Expunged on the order of the chair]*

ඒවා අපට වැඩක් නැහැ. මෙතැනට ඔබින දෙයක් තමයි දෙන්න ඕනෑ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගණන කියන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]*
*[Expunged on the order of the chair]*

ජේ.වී.පි. කාරයෝ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

කුහක මන්ත්‍රීවරු කියන වචනය ඉල්ලා අස් කර ගන්න කියන්න. කුහකයන්ගේ කියන වචනය එතුමාගේ

කැමැත්තක්. ලක්ෂ 6 ½ ක 8 ක පටුවක් මෙතැනට ගේනවාට අපි විරුද්ධ වුණා. අපි කොහොමත් ඒකට විරුද්ධයි. එතුමාගේ හිතේ කුහකකම මොකක්ද කියන එක අපි දන්නේ නැහැ. අපි කිව්වේ මිනිස්සුන්ගේ සල්ලි ටික විනාශ කරන්න එපා කියන එක විතරයි.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මණ්ඩලේ කවල්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

තොප්පිය දාගන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මිනිස්සුන්ගේ සල්ලි විනාශ කරන්න එපා කියපු එක කුහක කමක් කියලා හිතෙනවා නම්, එතුමාගේ දේශපාලනය මොකක්ද කියලා මම දන්නේ නැහැ. මම මේ සම්බන්ධයෙන් සම්පූර්ණයෙන් විරුද්ධ වුණු මිනිහෙක්. සාධාරණ පුටුවක් ගෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ කාලය විනාශ කරන්න එපා. ඔබතුමන්ලා 37(1) කියලා -

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

බංකුවක් දෙන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ලක්ෂ 6 ½ ක් ඕනෑ නැහැ. ගැලපෙන පුටුවක් ගෙන්න.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

කුහක කියන වචනය එතුමාට ඉල්ලා අස් කර ගන්න කියන්න. අපි කුහක කමක් කළේ නැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගැලපෙන පුටුවක් ගේන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය නාස්ති කරන්න එපා. අනවශ්‍ය දේවල්වලට යන්න එපා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අපි කිව්වේ ජනතාවගේ මුදල් විනාශ කරන්න එපා කියන එක විතරයි.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මේකට ගැලපෙන පුටුවක් ගේන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ලක්ෂ 6 ½ ක පුටුවක් ගේන්න එපැයි කියලා විතරයි කිව්වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න. අනවශ්‍ය විවාදවලට යන්න එපා.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අනවශ්‍ය දේවල්වලට ඔබතුමා නේ ඉඩ දුන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි. එතුමාත් අනවශ්‍ය -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

එතුමාට කියන්න ඉල්ලා අස්කර ගන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාත් අනවශ්‍ය දේවල් කිව්වා.

**ගරු චන්දන ජයකොඩි** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Chandana Jayakody - Chief Government Whip

වචනය හරි නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි නේ?

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ඒ වචනය ඉල්ලා අස් කරගන්න කියන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, ඒක ඉල්ලා අස් කර ගන්නවා.

**ගරු චන්දන ජයකොඩි** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Chandana Jayakody - Chief Government Whip

හරි. හරි. වචනය ඉල්ලා අස් කර ගත්තා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, අපේ විපක්ෂ කණ්ඩායමේ රැස්වීමේදී අපි තීන්දු කළා. අපට විපක්ෂයක් වශයෙන් කථා කිරීමට ස්ථානයක් නැහැ. මේ තිබෙන කොරිඩෝ එකේ මැදින් නිලධාරීන් යනවා. ඒ නිසා විපක්ෂයේ කණ්ඩායම ඉල්ලීමක් කළේ - අපට විපක්ෂ නායක කාර්යාලයේත් ඉඩ මදී. අපට ඒ සඳහා ස්ථානයක් ලබා දෙන්න. සභා ලේකම් කාර්යාලයේ හෝ කණ්ඩායම් රැස්වීම තියන්න හරි අපට පුටු හෝ මොකක් හරි සම්බන්ධීකරණයක් කරලා දෙනවා නම් හොඳයි ඔබතුමා මාර්ගයෙන් අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත්, සභා ලේකම්තුමාටත් මේ ඉල්ලීම යොමු කරනවා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ජෝර්ජ් දිගටම විපක්ෂයේ ඉන්න වගේ කල්පනාව.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

කමිටු ශාලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අංග සම්පූර්ණ වුණාට, තවම පොඩි පොඩි ප්‍රශ්න තිබෙනවා. පුටු ප්‍රශ්න තිබෙනවා. පහසුකම් දෙන්න ප්‍රශ්න තිබෙනවා. අපි හදා ගනිමු ඉතින්. හරි.

# පෞද්ගලික ප්‍රකාශ කිරීම්
PERSONAL EXPLANATIONS

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

පෞද්ගලික පැහැදිලි කිරීම. දේශපාලන නොනගතය.

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභා කාර්යපටිපාටි රීතිවලට අනුව මෙම ප්‍රකාශය කිරීම සඳහා ඔබතුමා වෙත මා භාර දිය යුත්තේ, නොවැම්බර් 16 සවස 4.15 ට පෙරය. නමුත් මා මෙය සභාවේ කියැවිය යුත්තේ, නොවැම්බර් මස 19 වැනි දින උදේ වරුව තුළයි. එනම් දින තුනකට පසුවයි. දැන් අප රටේ දින තුනක් යනු දේශපාලන වෙනස්වීම් තත්ත්වයන් ගණනාවක් සිදු ව තිබීමට පුළුවන් කාලයක්. දින තුනක් නොව විනාඩි තුනක් ඇතුළත දී රටේ විධායක ජනාධිපතිවරයාගේ සිතුවිල්ලක අනුහසින් හා අභිමතයෙන් ආණ්ඩු වෙනසක් වීමට හැකි තත්ත්වයක් ඇති වෙන්න පුළුවන්. එහෙයින්, මෙම ප්‍රකාශය ඔබතුමාට භාර දෙන අවස්ථාව වන විට ඔබතුමාම කියන්නා වූ උත්තරීතර පාර්ලිමේන්තුවට අනුව රටේ අගමැතිවරයෙක්, කැබිනට් මණ්ඩලයක් නොමැත. දේශපාලන නොනගතයට මේ තත්ත්වය සමානකමක් ඇත. නමුත් මා මෙය කියවන වේලාව වන විට වසන්තලා, මනූෂලා, වඩිවේල්ලා, ෆවුසිලා, පියසේනලා කැබිනට් අමාත්‍යවරු බවට පත් වී තියෙන්නත් පුළුවන්. නැවත රට හදන්න පටන්ගෙන තියෙන්නත් පුළුවන්. රුපියලේ අගය වැඩි වී ඩොලරය කඩා වැටී තියෙන්නත් පුළුවන්. මහින්ද මහතා අගමැති වූ අවස්ථාවේදීත් පැය කීපයකට රුපියලේ අගය වැඩි වීමක් සිදු වුවා අපට මතකයි.

ගරු සභාපතිතුමනි, මෙම සටහන ඔබතුමා වෙත එවීමට මෙය ලියන මොහොතේ එනම්, 16 වැනි දින දහවල් වන විට

මා සිටින ප්‍රදේශයේ එනම් පිළියන්දල නගරයේ පොහොට්ටු පාක්ෂිකයෝ උද්ඝෝෂණයක නිරතව සිටිනවා. එහි සටන් පාඨවලට අනුව කතානායකතුමාට විරෝධය පා, මහින්ද රාජපක්ෂ මහතාට සහයෝගය පළ කිරීම මූලික වී තිබෙනවා. ප්‍රශ්නය ඇත්තේ, කැස්බෑව නගර සභාවේ සේවකයන් තම සේවා කාලය තුළ සේවාවන් නතර කොට උද්ඝෝෂණයට සහභාගි වී සිටීමයි. සේවකයන් පවසන පරිදි නගර සභා පාලකයන් විසින් එම උද්ඝෝෂණයට සහභාගි වන ලෙස සේවකයන්ට බල කර තිබෙනවා. මා විසින් පෙර කී දේශපාලන නොනගතයේ ස්වභාවය මෙයට බලපානවා ඇති. පසුගිය ඔක්තෝබර් 27 උදේ බොහොම සතුටින් කිරිබත් බෙදීමට සිටි පිරිසක් ද මෙම උද්ඝෝෂණයේ සිටිනවා. කිරිබත් බෙදූ සතුටු වූ මිනිසුන්ට අද පාරට විත් අසතුටෙන් කෑ ගැසීමට සිදු වී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, "පනින්නට පෙර සිතා බලනු" යන ප්‍රස්ථා පිරුළ යල් පැන ඇතැයි බොහෝ අය පවසනවා. ඒ වෙනුවට "කිරිබත් කන්නට පෙර සිතා බලනු" යන්න වඩා හොඳ බවට ඔවුන්ගේ මතය වී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මාගේ මේ විශේෂ ප්‍රකාශයේ ද අවිධිමත්කමක් තිබෙනවා. මේ දේශපාලන නොනගතය එයට හේතු වී ඇතැයි සිතනවා. කෙසේ වෙතත්, ඔබතුමා වෙත අවධාරණය කළ යුතු මේ කරුණු ගැනත්, අවිධිමත්කම අතරම ප්‍රකාශ කළ යුතු වෙනවා.

ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තුවේ වාගේම මෙම පළාත් සභාවේත් ජනතා විමුක්ති පෙරමුණේ නියෝජිතයන් ඉන්නේ හය දෙනෙක් පමණයි. නමුත් අපි අපේ දේශපාලන මතය වෙනුවෙන් ඍජුව පෙනී සිටිනවා. ජනතා අවශ්‍යතාවය වෙනුවෙන්, ජනතාව නියෝජනය කරමින් ඉදිරිපත් වෙනවා. එහෙත් අපට බහුතර බලයක් නැහැ. සමහර විට ජනතාවගේ ඇත්ත උවමනාව තමුන්නාන්සේලාගේ බහුතර බලයේ හැකියාවෙන් යටපත් වෙනවා. එය නිහතමානීව පිළිගැනීමට අපට සිදු වෙනවා. ළඟම උදාහරණය තමයි මීට සභා වාර දෙකකට පෙර මා ගෙන ආ පළමුවැනි ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීමේ චක්‍රලේඛයේ ඇති වැරැදි වගන්ති වෙනස් කර ගැනීම වෙනුවෙන් මා ගෙන ආ රීති අත්හිටුවීමේ යෝජනාව. නමුත් නියෝජ්‍ය සභාපතිතුමාගේ න්‍යාය පත්‍ර යෝජනාව එතුමාට එයට වඩා හදිසි හා ලොකු වුණා. අවසානයේ ඔබතුමා ඡන්ද විමසීමකට ගියා. මා ගෙන ආ කාලීනව හදිසි යෝජනාව ඔබතුමන්ලාගේ එනම්, යූ.ඇන්.පී., ශ්‍රී ලංකා, පොහොට්ටු ලෙන්ගතු බැඳීමෙන් පරාජයට පත් වුණා. නමුත් යෝජනාවේ හරය තේරුම්ගෙන අප සමඟ ඡන්දය පාවිච්චි කළ කුඹවරදන් ගරු මන්ත්‍රීතුමාට අපගේ ගෞරවය ස්තුතිය පුද කරනවා. ඒක තමයි, නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වභාවය. හරි හෝ වැරැදි මහජනතාව මෙම සභාවට තමන්ගේ නියෝජිතයෝ පත් කරලා එවා ඇති ආකාරය. ඒ අනුව බහුතර මතයට ඉඩ දීමට සිදු වෙනවා.

ගරු සභාපතිතුමනි, ප්‍රජාතන්ත්‍රවාදය කියන වචනය උච්චාරණයේ දී පවා වරද්ද වරද්ද තලුමරන පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයෝ එකී බහුතර කැමැත්තට ඉඩක් නොදෙන්නේ මන්ද? විනයානුකූල නොවෙන්නේ මන්ද? පාර්ලිමේන්තුවේ ඡන්දයට ඉඩකඩ නොදෙන මෙම නියෝජිතයන් රටේ ඡන්දයේ දී ස්වාධීනව ඡන්දය ලබා දීමට මහජනතාවට ඉඩක් ලබා දෙයිද? පාර්ලිමේන්තුවේදී මත විමසීමේදී සිදු වන ඇත්ත තත්වය අප අපේ ගෙවල්වල මැද සාලයේ ඇති පුංචි රූපවාහිනී තිරයෙන් යස අගේට ප්‍රදර්ශනය වනු දැක ගන්නා නරඹන්නන් බවට පත්ව ඇති බව පැහැදිලියි නේද?

ගරු සභාපතිතුමනි, මෙම දේශපාලන නොනගතය තවදුරටත් දීර්ඝ වීම පිළිබඳව අප සතුටු නොවෙමු. එය තවත් අප රට වේගවත්ව ව්‍යසනයට පත් වීමක් බවට පත් වනු ඇත. සිංහල හින්දු අලුත් අවුරුදු චාරිත්‍රවලදී නොනගතයේදී හැසිරෙන ආකාරය සඳහන්ව ඇත්තේ, එකී කාලයට පෙර කා බී, සියලු වැඩ අත්හැර පුණ්‍ය කටයුතුවල යෙදිය යුතු බවයි. මෙම දේශපාලන නොනගතයේදී පුණ්‍ය කටයුතු කෙසේ වෙතත්, රාජ්‍ය ආයතන බොහොමයක සියලු වැඩ අත්හැර ඇත. වැඩ අත්හැරීමට අදාළ චක්‍රලේඛන ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දී ඇත. වසර අවසන් වීමට පෙර අවසන් කළ යුතු සංවර්ධන ව්‍යාපෘති ඇනහිටීමෙන් එහි ප්‍රතිලාභ අත්විය යුතු ජනතාවට සිදුවන අසාධාරණය පිළිබඳව වගකීම නොනගතයට භාර දීමට සිදු වී ඇත.

ඒ නිසා ගරු සභාපතිතුමනි, විනයක් නොමැති, ශිෂ්ටසම්පන්න බවක් නැති මිනිසුන්ට ලෝකයට අලුත් දෙයක්, හොඳ දෙයක් ලබා දිය නොහැක. නරක දේ වෙනුවට හොඳ දේ, අශිෂ්ටත්වය වෙනුවට ශිෂ්ටත්වය රටට ඕනෑ කර තිබේ. ඒ වෙනුවෙන් ඇති කැමැත්ත හා සමාජ සාකච්ඡාව ආරම්භ වී ඇත. එකී සාකච්ඡාවට මඟ පාදා දුන් ජනාධිපතිතුමාට ඒ ගැන නම් ස්තුති කළ යුතුය.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, අද රට තුළ ඇති වී තිබෙන අවසනාවන්ත තත්ත්වය අවසන් කරන ලෙස බලධාරීන්ට කරන ආයචනයයි.

ගරු සභාපතිතුමනි, මේ වන විට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ නිර්මාණය වී තිබෙන අවසනාවන්ත අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් රටේ ජන ජීවිතය සහ ආර්ථිකය දැඩි අසීරුතාවයකට පත් වී ඇති බව නොරහසකි. මෙම තත්ත්වය නිර්මාණය වූ හේතුව පිළිබඳව සහ මෙම සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලා හට විවිධ මත තිබෙන්නට පුළුවන්. එහෙත් සත්‍ය කුමක්දැයි තම තමන්ගේ හෘද සාක්ෂිය විමසා බැලීමේදී පසක් වන කාරණය නම් මෙම වැරදි සහගත සිදුවීම නිසා අපේ රටේ කඩාවැටීම වළක්වාගැනීමට අසීරු බවයි. අපේ රට පිළිබඳව ජාත්‍යන්තරය තුළ ඇති වී තිබෙන කළු පැල්ලම මකා ගැනීමට තව බොහෝ කාලයක් ගත වෙනවා ඇත. ඒ සඳහා දැඩි වෙහෙසක්ද ගත යුතු බව අප තරයේ සිහි තබා ගත යුතුය.

ගරු සභාපතිතුමනි, කරුණාකර මෙම වකවානුව දෙස මදක් සිහිනුවණින් සිතා බලන්න. මේ වසර අවසානයේ දහසක් බලාපොරොත්තු මැද විවිධ දුක් කම්කටලු බාධක අතරේ ඉතා අසීරුවෙන් ඉගෙනුම ලැබූ දරුවන් සිය ජීවිතයේ එක් කඩඉමක් තරණය කරන්නට සැරසෙන්නේ මෙම කාලසීමාවේදීය. එනම්, අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය එළැඹෙන දෙසැම්බර් මාසය තුළ පවත්වනු ලබනවා. යහපත් මානසික තත්ත්වයකින් සහ හොඳ පෙර සූදානමකින් යුතුව එම විභාගයට මුහුණදිය හැකි වටපිටාවක්, පරිසරයක් මෙම රට තුළ අද දවසේ තිබෙනවාද? මේ නිර්මාණය වී ඇති අරාජික අර්බුදකාරී තත්ත්වය හමුවේ මෙම කඩඉම පනින්නට, එසේත් නැත්නම් මෙම විභාගයට මුහුණ දෙන්නට යන දරුවන්ගේ හෙට දවසේ වගකීම භාරගන්නේ කුමන දේශපාලනඥයාද?

ගැටුම් ඇති කර බලතන්හාවෙන් කෑමොර දෙන දෙන අශීලාචාර දේශපාලනඥයින්ගේ දරුවන් විදේශීය අධ්‍යාපනය ලබද්දී මන්ත්‍රීවරම ලබන්නට ඔවුන් හට මනාපය ලබා දුන් ජනතාවගේ දරුවන් මෙම අර්බුදයට මැදි වී අසරණව සිටීම මොන තරම් ශෝචනීය තත්ත්වයක් දැයි මදක් සිතා බලන්න. මෙම අවාසනාවන්ත තත්ත්වයට වග කියන්නේ කවුද ?

එසේම, මෙම කාලසීමාව විශේෂයෙන්ම අප රටේ ආර්ථිකයට ශක්තිමත් පදනමක් වැටෙන කාලයයි. සංචාරකයන් බහුලව ශ්‍රී ලංකාව නැරඹීමට පැමිණෙන්නේ මේ කාලයේදීය. සංචාරක කර්මාන්තය නිසා ජීවත්වන පිරිස අද මෙම තත්ත්වය හමුවේ අසරණ වී සිටිති. ඔවුන්ගේ සැලසුම් කඩා වැටී ඇත. මෙම කාලය තුළ සැලසුම් කර තිබූ සියළු කාර්යයත් ඉතා හොඳ පෙර සූදානමකින් සිදු කොට දැන් දැඩි අවිනිශ්චිත තත්ත්වයකින් යුතුව ඔවුන් සැම හිරිවැටී ඇත. සංචාරකයන්ගේ පැමිණීම අවිනිශ්චිත තත්ත්වයක පවතින බැවින්, එය රටේ ආර්ථිකයට දැඩි ලෙස බලපෑම් ඇති කරන බව රටේ පාලකයින් සිහි තබා ගත යුතුය. අප රටට ලැබෙන කෝටි ගණනක ආදායම අහිමි වී යනු ඇත. “මට පෙර රට” යන සංකල්පයට වඩා, තම ආත්මාර්ථය මුදුන් පමුණුවා ගැනීම සඳහා රටට සහ රටේ ආර්ථිකයට හෙණ ගැහුවත් තමක් නැහැ. නීතිය වල්වැදුනත් කමක් නැහැ. සදාචාරය වළපල්ලටම ගියත් කමක් නැහැ. යුක්තිය සාදාරණය අගාධයට ගියත් කමක් නැහැ. කොටින්ම රටට හෙන ගැහුවත් කමක් නැහැ. හොඳින් හෝ නරකින් බලය ලැබෙනවා නම් ඒ හොඳටම ඇති යන අදහස මගේ මාතෘභූමිය යැයි පපුවට ගසා ගනිමින් මහපොළවට වැඳ වැටී එය සිඹින කපටි මිනිසුනෝ අනේ තොපට අත්වන ඉරණම යැයි මේ රටේ ජනතාව සිතන්නට පුළුවන.

මෙහිලා මතු කරන තුන්වන කාරණය, විශේෂයෙන්ම මා ඇතුළු මෙම සභාව නියෝජනය කරන පක්ෂ, විපක්ෂ කිතුනු මන්ත්‍රීවරුන්ට බලපාන කාරණයක්. දෙසැම්බර් මාසය එළඹෙන විට ලොව පුරා කිතුණු බැතිමතුන් දෑස් දල්වා බලා සිටින්නේ, ඒ අසිරිමත් නත්තල උත්සවශ්‍රීයෙන්, සාමයෙන් සමරන්නටයි. විශේෂයෙන්ම මා නියෝජනය කරන වත්තල, ජා-ඇළ, මීගමුව, කටාන සහ මුහුදුබඩ තීරයේ බහුතර ජනතාව මෙම අසිරිමත් මංගල්‍යය සාමකාමීව ජනතාවට සහනයක් ලබාදෙන අයුරින්, උත්සවශ්‍රීයෙන් සමරන ලබන බව නොරහසකි. එහෙත් එසේ කිරීමට සුදුසු වාතාවරණයක් අද දිනයේ අපේ රට තුළ නිර්මාණය වී තිබෙනවාද? රටට කුමක් සිදු වේ දැයි අවිනිශ්චිත භාවයකින් යුතුව කිතුණු ජනතාව වික්ෂිප්තව බලා සිටී. එම නිසා තන්හාධික, බලලෝභී, ආත්මාර්ථකාමී බලධාරයිනි, ලොවට සාමයේ පණිවිඩය ගෙන ආ ජේසු සමිඳුන්ගේ උත්පත්තිය සමරන මෙම නත්තල් සමයේදීවත් හෝ ආපසු හැරී බලා සිත්සාමය ඇති කරන ලෙස ගරු ජනාධිපතිතුමා ඇතුළු මෙම අර්බුදය නිර්මාණය කිරීමට දායක වූ හා එයට දායක වී සිටින අතලොස්සක් වන පිරිසගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිමි. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තූතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මට 37(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. අපි මේ පළාත් සභාවට පත් වුණේ එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන්. අපේ මන්ත්‍රීවරු කණ්ඩායමක් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න. ඔබතුමා 37(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් අහන්න -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ රීති පොතේ කොහෙවක්වත් නැහැ පක්ෂයක් මාරු වුණාම එහා පැත්තේ වාඩි වුණාම seat එකක් දෙන්නේ කොහෙන්ද කියලා. දැන් වර්ණසිංහ මහත්මයාට ඉස්සරහාම seat එකක් දීලා තිබෙනවා. මේ රීති පොතේ කොතැනද තිබෙන්නේ කියලා මට කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙහෙමයි එතුමා -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පාර්ලිමේන්තුවේ ක්‍රමයක් තිබෙනවා. මොකක් හරි ක්‍රමයක් එපැයි. එතුමා අපේ සන්ධානයේ මන්ත්‍රීවරයෙක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා හිටපු අමාත්‍යවරයෙක්. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි නේ. අනේ සමාවෙන්න. බාධා කිරීම් නම් කරන්න එපා. අද මේ සභාවේ ආරම්භක දවස.

**ගරු හෙක්ටර් බෙත්මගේ සභා නායකතුමා -**
Hon. Hector Bethmage - Leader of the House

එතුමාට දීලා තිබෙන්නේ හිටපු අමාත්‍යවරයෙක් නිසා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද ආරම්භක දවස නිසා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මාතෘකාවක් නැතිව කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොඩිකාර ගරු මන්ත්‍රීතුමා එහෙම කථා කරන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

කළබල වෙන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට ප්‍රශ්නයක් නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පළාත් සභාව යන්නේ රීති පොත අනුව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීති පොත නොවෙයි. එතුමා හිටපු අමාත්‍යවරයෙක්. ඒ අනුවයි Seat එක වෙන් කළේ. ඔබතුමාට ප්‍රශ්නයක් නැහැ නේ? ප්‍රශ්නය එහෙට නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

සභාපතිතුමා හැටියට ඔබතුමා තීරණයක් ගන්න. අපේ ඡන්දයෙන් නේ ආවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, අපි ඕක ප්‍රශ්නයක් කරගන්න ඕනෑ නැහැ. ආණ්ඩු පක්ෂයේ ප්‍රශ්නයක් නොවෙයි නේ ඒක. ඒක විපක්ෂයේ ප්‍රශ්නයක්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුනි, ඒකෙන් කොහොමද උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද කැඩෙන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපට ප්‍රශ්නයක් නැත්නම් ඔබතුමාට ප්‍රශ්නයක් වෙන්නේ කොහොමද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක විපක්ෂයේ ප්‍රශ්නයක්. ඒගොල්ලෝ බේර ගනියි ඒක.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම ඉල්ලනවා ඒක -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

විපක්ෂයට ප්‍රශ්නයක් නැත්නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොඩිකාර ගරු මන්ත්‍රීතුමා, ඒක ඔබගේ ප්‍රශ්නයක් නොවෙයි. ඒක විපක්ෂයේ ප්‍රශ්නයක්. වෙන කෙනෙක් කථා කළා නම් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ගනුදෙනුව ඒ අය බේරගනියි. ඔබතුමාට ඒක අදාළ නැහැ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඒක අපි විපක්ෂය බේරගන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා හිටපු ඇමතිවරයෙක් . ඔබතුමා 37(1) කියලා හැම වෙලේම සභාව අවුල් කරනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

අර මහින්ද මහත්තයාට මළ බත දෙන්න ලැහැස්ති වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මහින්ද මහත්තයාට -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මළ බත දෙන්න ඕනෑ මහින්ද මහත්තයාට නොවෙයි.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

පාඨලීට තමයි මළ බත කන්න වෙන්නේ.

[සභාවේ ඝෝෂා]

බලාගෙන ඉන්න. තව දවස් දෙක තුනක් යන කොට පාඨලී මළ බත කන හැටි බලා ගෙන ඉන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මළ බත දෙන්න ලැහැස්ති වෙන්න.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

පාඨලීට තමයි මළ බත හම්බ වෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මහ බැංකුවේ අර්ජුන මහේන්ද්‍රන්ගේ -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මළ බත හම්බ වෙන්නේ -

[සභාවේ ඝෝෂා]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

රට විනාශ කළා. බේරුවල ගිහිල්ලා මුස්ලිම් මිනිස්සු විනාශ කරලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

සුදු රෙද්ද ඇඳලා පුළුවන්තරම් බොරු කියලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි න්‍යාය පත්‍රයට යමු.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මහින්ද මහත්තයාට පින්සිද්ධ වෙන්න -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ජාතිවාදියා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අද පාර්ලි ඉන්නෙත් මහින්ද හින්දා. කථා කරනවා මහ ලොකුවට. හක් ගෙඩියයි, සිවුරයි විකුණන් ආවේ.

[සභාවේ ඝෝෂා]

හක්ගෙඩියයි, සිව්රයි විකුණන් ආවේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

බැසිල් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයට යමු. වාඩි වෙන්න. ගරු ප්‍රධාන අමාත්‍යතුමා මූලා ප්‍රකාශය ඉදිරිපත් කරන්නත් ඕනෑ.

[සභාවේ ඝෝෂා]

කරුණාකර නිශ්ශබ්ද වන්න. ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න. ඒක ඒ පැත්තේ ප්‍රශ්නයක්.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

ගරු සභාපතිතුමනි, ඉක්මණට නිශ්ශබ්ද කරලා පටන් ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, අපි න්‍යාය පත්‍රයට යමු. කරුණාකර නිශ්ශබ්ද වන්න. මොහොමඩ් ෆායිස් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

පවයා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

රස්තියාදුකාර දේශපාලනයේ -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

රෙද්ද කඩලා දාන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොරු කාරණා අල්ලගෙන කෑ ගහන්න එපා. බොරුවට නිකන් අනවශ්‍ය ඝෝෂා කිරීම් කරලා වීරයෝ බවට පත් වෙන්න එපා. අද මේ මංගල සභාව. අපි හොඳට යමු. ආරම්භක රැස්වීම. මොනවද අනේ ඔබතුමන්ලා අද මේ කථා කරන්නේ?

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

කලකට හොඳයි. කලකට නරකයි.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඒක ඉල්ලා අස් කර ගන්න කියන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, ඔබතුමා තමයි මේ සභාවේ -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔබතුමා එහෙම උපදෙස් දෙන එක වැරැදියි. මහින්ද රාජපක්ෂ මහත්තයාට මළ බත දෙන්න කියලා කියන්න මෙතුමාට අයිතියක් නැහැ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඔබතුමාට එක කණක් ඇහෙන්නේ නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

මහින්ද මහත්මයාට මළ බත දෙන්න ඕනෑය කියලා කියන්න මෙතුමාට අයිතියක් නැහැ, ගරු සභාපතිතුමා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමා, මෙයාව එළියට දාන්න.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ඒක ඉතාමත්ම වැරදි ප්‍රකාශයක්.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

සභාවෙන් එළියට දාන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඇමතිකම රැකගන්න බැරිව කොහොමද මහින්ද රාජපක්ෂට අභියෝග කරන්නේ.

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, මෙයාලා පසුගිය ආණ්ඩුවේ ආවේ, මහින්ද මහත්මයාට පින් සිද්ධ වෙන්න තමයි. එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් ආවේ.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු සභාපතිතුමනි, මෙතුමන්ලා මිනිස්සු රැවැට්ටුවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

දරුවන් ගැන, රටක් ගැන මුංට කැක්කුමක් නැහැ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මහින්ද මහත්මයාට පිං සිද්ධ වෙන්න මේ සභාවට ආවේ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

මහින්ද මහත්තයාගේ රෙද්ද අස්සේ සිටියේ. පොන්න වර්ණසිංහ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු සභාපතිතුමනි, -

[සභාවේ ඝෝෂා]

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

මීනී මැරුවේ පාඨලී.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සාටකයේ එල්ලිලා ආවේ. පාඨලීගේ කොල්ලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

බූලත් කොළේ එල්ලිලා ඇවිල්ලා, එහෙට මෙහෙට පැනලා -

[සභාවේ ඝෝෂා]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මහින්ද මහත්තයාගේ කළිසම ගැලවිලා තිබෙන්නේ පාර්ලිමේන්තුවේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජාතිවාදියා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොඩිකාර ගරු මන්ත්‍රීතුමා -

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

එන්නෙත් නැහැ, පාර්ලිමේන්තුවට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි න්‍යාය පත්‍රයට යමු.

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සාටකයේ එල්ලිලා ආවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා. පොඩි වේදනාවක් තිබෙනවා, අපේ අගමැතිතුමාට අනවශ්‍ය ප්‍රකාශ කරන කොට.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

CIA ඔත්තුකාරයෝ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු සභාපතිතුමනි, ඒ වචනය ඉල්ලා අස්කර ගන්න කියන්න.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

උසාවියට බොරු සාක්ෂි දුන්න එවුන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රසන්න ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න කෝ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සාටකයට පින් සිද්ධ වෙන්න ආවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, හරි, දැන් -

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

හෙළ උරුමේ නොවෙයි. හෙළ කරුමේ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

හෙළ කරුමේ.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

හෙළ කරුමේ. ජාතිවාදියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, හරි, කෝකිලා ගරු මන්ත්‍රීතුමිය. මම දන්නවා. වේදනාවක් තිබෙනවා. මට ඒ ටික ඇහුණේ නැහැ. ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න. ඉස්සෙල්ලා එතුමාගේ ආසනයේ ප්‍රශ්නයක් නේ කොඩිකාර ගරු මන්ත්‍රීතුමා ඇහුවේ. ආසනය ප්‍රශ්නය නිසා මම කිව්වේ ඒක විපක්ෂයේ ප්‍රශ්නයක් කියලා. අපේ ප්‍රශ්නයක් නොවෙයි. නමුත් ඔබතුමා එහෙම බරපතළ ප්‍රකාශයක් කළා නම් මම කනගාටු වෙනවා. මොකද ඔබතුමා බුලත් කොළයෙන් මේ පළාත් සභාවට ආවේ. ඔබතුමා මහින්ද මහත්තයාගෙන් නේ ඡන්දය ඉල්ලුවේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සාටකයට පින්සිද්ධ වෙන්න ආවේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමනි, මෙයාව එළියට දාන්න ඕනෑ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

අපේ පක්ෂය ගැන තීරණය කරන්නේ කොහොමද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මේ දන්න දේ ගැන කියන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, ඉල්ලා අස්කරගන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මිනිස්සුන්ට අපහාස කරන්න එපා. රටේ නායකයන්ට අපහාස කරන්න එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වචනය ඉල්ලා අස්කර ගන්න කියන්න.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු සභාපතිතුමනි, ඇමතිකම හරියට කරගන්න බැරි වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා තේරුම් ගන්න. අපේ ජනාධිපතිතුමා ඔබතුමාට අමැතිකම දුන්නෙත්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

වාසි වෙනවා නම් හොඳයි නේද? එතකොට බුලත් කොළේ අලියා නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අද පළමුවැනි දවස. වැදගත් විධියට ඉන්නයි අපි තීන්දු කළේ. මූලික වැරැද්ද කළේ ඔබතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම කියන්නේ කවුරු වුණත් අපේ රටේ නායකයින්ට අගෞරව කරන්න එපා. (බාධා කිරීමක්) මහින්ද රාජපක්ෂද? මෛත්‍රීපාල සිරිසේනද? රනිල් වික්‍රමසිංහ ද කියලා නැහැ. නායකයින්ට අගෞරව කරන්න එපා. එහෙම කියන්න එපා. ඒවා විඳවන්න වෙනවා. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ පුටුවෙන් -

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

බුලත් කොළෙන් ආවට අලියාගෙන් ඡන්දය ඉල්ලුවා. ආවද?

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය විවාදවලට යන්න එපා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පොහොට්ටුවෙන් ඡන්දය ඉල්ලයි වගේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා රටේ නායකයන්ට අපහාස කරන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක මහින්ද රාජපක්ෂද, රනිල් වික්‍රමසිංහ ද මට අදාළ නැහැ. එහෙම කථා කරන්න දෙන්න බැහැ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

මළබත කනවා කියන එක මොකක්ද? අසභ්‍යය එකක්ද?

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

මළ බත පාඨලීට දෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පාර්ලිමේන්තුවට මළ බත දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මොහොමඩ් ෆායිස් ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ ප්‍රකාශය ඉදිරිපත් කරන්න.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

දවස් පහයි ඇමතිකම කළේ. මළ බත දුන්නේ අපි.

[සභාවේ ඝෝෂා]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

අර ගෑණියෙක් නිසා ඇමතිකමත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා දැන් ඉවර කරන්න. ඇති නේ දැන්. හිතේ අමාරුවට කියෙව්වා නේ දැන්. හිතේ අමාරුවට කෑ ගැහුවා. දැන් නවත්වන්න. කාලය නැහැ. මයික් off කරන්න. හරි. ගරු මන්ත්‍රීතුමා දැන් ඔබතුමා කථා කරන්න

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු සභාපතිතුමනි, පසුගිය මාසයේ, පසුගිය 06 වැනිදා සවස 04.00 ට පමණ මා මාළිගාවත්ත පෙදෙසේ මගේ වාහනය අලුත්වැඩියා කර නිවසට යමින් සිටියදී ජුම්මා මස්ජිද් කලර් ලයිට් එක අසළ රථ වාහන අංශයට අයත් පොලිස් නිලධාරියෙක් මගේ වාහනය නතර කරන්න සංඥාවක් දුන්නා. මම එවිට මගේ වාහනය නතර කොට වාහනයෙන් බැස එතුමා ළඟට ගිහිල්ලා ඇහුවා, ඇයි රාළහාමි නැවැත්තුවේ කියලා. එතුමා එක පාරටම කිව්වා, ලයිසන් එක ගන්න කියලා. මම ඊට පස්සේ වාහනයට ගිහිල්ලා මගේ වාහනයට අයත් ලියකියවිලි ලබා දෙන කොට, ඒ වෙලාවේ වාහනය ගරාජ් එකේ තිබුණ නිසා මගේ ලයිසන් එක වාහනය තුළ අස්ථානගත වෙලා තිබුණ නිසා මම කිව්වා, ලයිසන් එක නැහැ. ලයිසන් එකට මට දඩ කොළයක් දෙන්න. එහෙම නැත්නම් තාවකාලිකව දඩ කොළයක් දෙන්න. එහෙම නැත්නම් මාව උසාවියට යොමු කරලා මට දඩ කොළයක් දෙන්නය කියලා මම එතුමාට පැවසුවා. එතුමා එක පාරටම මාත් එක්ක බහින් බස් වෙලා, එතුමා අනවශ්‍ය විධියට මට බණින්න පටන් ගත්තා. එවිට එතුමා මාළිගාවත්ත පොලිසියට දුරකථනයෙන් කථා කරලා තවත් නිලධාරීන් දෙදෙනෙක් එතැනට ගෙන්න ගත්තා. ඒ නිලධාරියා එක පාරටම ඇහුවා, උඹලා බීලද ඉන්නේ? උඹලා කොහේ බයියෝද? කියලා නොයෙකුත් වචනවලින් කථා කළා. මෙතැන කියන්නට බැරි පහත් විධියට එතුමා කථා කළා. එතුමාට මම කිව්වා, මගේ ලයිසන් එක නැහැ. එතුමාගෙන් මම දඩ කොළයක් ඉල්ලුවා කියලා. එතුමා එක පාරටම කිව්වා, මම එතුමාට ගහන්න ආවා කියලා.

ගරු සභාපතිතුමනි, මාත් එක්ක තවත් තුන් දෙනෙක් මගේ වාහනයේ සිටියා. යුනිෆෝම් ඇඳපු පොලිස් නිලධාරියෙකුට ගහන්න තරම් මම මන්ද බුද්ධිකයෙක් නොවෙයි. එතුමා ඊට පස්සේ ආයේ පටන් ගත්තා. මගේ වාහනය පොලිසියට අරගෙන යන්න ඕනෑය කියලා කිව්වා. මම කිව්වා හරි, පොලිසියට යමු. එතුමාත් නැග්ගා. සර්, මමත් එක්ක යාළුවෝ දෙන්නටත් නගින්නද කියන කොට නැහැ, නැහැ, එකෙක් නඟින්නේ නැහැ. (බාධා කිරීමක්) එතුමා ඊට පස්සේ මාව පොලිසියට අරගෙන ගියා. පොලිසියට වාහනය අරගෙන ගියාම එතැන රථවාහන අංශයේ SI කෙනෙක් සිටියා නිශ්ශංක කියලා කෙනෙක් මම හිතන්නේ. එතුමාට ගිහිල්ලා කිව්වා, මොකක් හරි ඒ සාජන් මහත්තයා ගිහිල්ලා වෙනත් වචනයක් කිව්වා. එතුමා එක පාරටම සෑහෙන්න විධියට ඉතාමත් පහත් අන්දමින් බණින්න පටන් ගත්තා. මම කිව්වා, SI මහත්තයා මම මහජන නියෝජිතයෙක්. මම කරපු වැරැද්ද මොකක්ද? නැහැ, නැහැ, උඹ අර විධියට අරකද මේකද කියලා සෑහෙන්න විධියට කියලා අන්තිමට එතුමා මට තුන් පාරක් ගහන්න අත ඉස්සුවා. ඊට පස්සේ මම දුරකථනයෙන් මා මිත්‍ර මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාටත්, අර්ෂාඩ් මන්ත්‍රීතුමාටත් කථා කළා. මෙවැනි සිදුවීමක් සිදු වුණා. එයාලත් ඒ වෙලාවේ පොලිසියට ආවා. නමුත් මෙතුමා ඕනෑ නැති දේවල් කියනවා. ආණ්ඩුව හදන්නෙත් අපි. ආණ්ඩුව පෙරලන්නෙත් අපි. එතුමා මනස විකෘති වුණ පුද්ගලයෙක් හැටියට ඉතාමත් පහත් අන්දමට එතුමා කටයුතු කළේ. මගේ බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රී ධූරය සනාථ කරන නිල හැඳුනුම්පතත් දුන්නා. මේවා වැඩක් නැහැ පකයා කියලා එතුමා ඒක විසික් කරලා -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ඒක පාර්ලිමේන්තුවෙත් කිව්වා. ඒක එලය. කුණුහරපයක් නොවෙයි. මනූෂ නානායක්කාර මන්ත්‍රීතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. ඔබතුමා කථා කරන්න.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

එතුමා පහත් විධියටම කථා කළා. එතුමා කථා කරපුවා මට කියන්න ලැජ්ජයි. ඒ තරම් පහත් අන්දමට මට කථා කරලා, තුන් වතාවක් මට ගහන්න ඇවිල්ලා එතුමා අන්තිමට මට මරණ තර්ජන එල්ල කළා. මාව මරනවා. එතුමාට අක්කර පහක ඉඩමක් තිබෙනවා. ඉඩමේ පොල් විකුණලා නඩු කියනවා. මම උඹව මරලා හංගනවා කියලා පොලිස් ස්ථානයේදී කිව්වා. ඒකට සාක්ෂි තිබෙනවා. මාත් එක්ක ආපු සියලුම යාළුවෝ එම ස්ථානයේ සිටියා. ඒ නිසා මේ වාගේ මන්ද බුද්ධිකයන් මේ මාළිගාවත්ත රථවාහන අංශයේ සිටිනවා නම් මම හිතන්නේ, මේක විශාල ප්‍රශ්නයක්. මට ඒ වෙලාවේ එතුමන්ලාට කියන්න තිබුණේ, දඩ කොළයක් ලබා දීලා මාව නිදහස් කරන්න. නමුත් හතරේ ඉඳලා හත වනතුරු මාව තියාගෙන සිටියා. ඉන් පසුව මාව උසාවියට යොමු කළයි කියලා කිව්වා. මම හතෙන් පස්සේ කෙලින්ම IGP හම්බ වෙන්න ගියා. පොලිස්පතිතුමා ඒ වෙලාවේ සිටියේ නැහැ. මම ගිහිල්ලා, එතැන පැමිණිල්ලක් සටහන් කරලා, මම නැවත ආවා. ඒ නිසා මාළිගාවත්ත වැනි ප්‍රදේශයක පොලිස් නිලධාරීන් මේ වාගේ හැසිරෙන එක, මහජන නියෝජිතයෙකුටත් මේවිධියට හැසිරුණා නම් සාමාන්‍ය පුද්ගලයෙකුට මොන ආකාරයට හැසිරෙයිද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, මම ඉල්ලා සිටිනවා මේ තුන් දෙනා සම්බන්ධයෙන් වහාම පරීක්ෂණයක් කැඳවන්න කියලා. පොලිස්පතිතුමා මාර්ගයෙන් හෝ කුමන හෝ ආකාරයකින් අපට සාධාරණයක් ඉෂ්ට කරලා දෙන්න. මගේ රියදුරු බලපත්‍රය නැතිවීම හේතුවෙන් මම උසාවියට ගිහිල්ලා දඩ කොළයක් ගෙව්වා. ඒක වෙන ප්‍රශ්නයක්. නමුත් සාමාන්‍ය පුද්ගලයෙකුට හරි අපට මෙහෙම බණින්න පටන් ගන්නවා නම් - මේකේ මම ලිඛිතව ලියලා තිබෙනවා. මම මේක ඔබතුමාට සභාගත කරනවා. අනික් එක මෙතැන කියන්න ලැජ්ජයි එතුමා මට කථා කරපු ක්‍රමවේදය. ඉතාමත් පහත් අන්දමට, පිස්සන්ටත් වැඩිය පහත් අන්දමට මට එතුමා ඒ වෙලාවේදී සැලකුවේ. මහජන නියෝජිතයෙක් හැටියට එතුමාට මගේ හැඳුනුම්පත දුන්නාම එතුමා හැඳුනුම්පතත් විසි කළා. මට කියපු සියලු කරුණු මම පොලිස්පතිතුමාගේ ස්ථානයේ පොලිස් පැමිණිල්ල දාලා තිබෙනවා. ඒකෙත් මම සටහන් කරලා තිබෙනවා. මගේ ලිපි ශීර්ෂයෙත් මේක ඔබතුමාට පෞද්ගලිකව ලියලා තිබෙනවා. ඒක නිසා මම මේ අවස්ථාවේදී මේක සභාගත කරනවා.[7] මට මේ සම්බන්ධයෙන් වහාම ගරු මහ ඇමතිතුමා ඇතුළු ඔබතුමා මට සාධාරණයක් ඉෂ්ට කර දෙයි කියලා මම විශ්වාස කරනවා. ස්තුතියි.

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඉවර කරමු. එතුමාගේ ප්‍රශ්නය.

**ගරු අර්ෂාද් නිසාම්ඩීන්**
Hon. Arshad Nisaamdeen

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මේකට මාත් මැදිහත් වුණා. මේක සම්පූර්ණ ඇත්ත. අනිවාර්යයෙන්ම මේකට පිළියමක් ගන්න. හැම මන්ත්‍රීවරයෙකුගේම වරප්‍රසාද ප්‍රශ්නයක්. හැම මන්ත්‍රීවරයෙකු වෙනුවෙන්ම කථා කරන්නේ. අනිවාර්යයෙන්ම මේකට ක්‍රියා මාර්ගයක් ගත්තේ නැත්නම් අපි මන්ත්‍රීවරු වශයෙන් ඉඳලත් වැඩක් නැහැ. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි. මේ පිළිබඳව ඔබතුමා පොලිස්පතිතුමාට පැමිණිලි කරලා තිබෙනවා. මම ඉදිරියටත් අපේ සභා ලේකම්තුමාට උපදෙස් දෙනවා. ඔබතුමා සභාවේ කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් පොලිස්පතිතුමාවත්, ආරක්ෂක අංශ දැනුවත් කරලා වහාම කඩිනම් පරීක්ෂණයක් කරන්න කියලා. අදම අපි ඒ අදාළ කටයුතු ඉටු කරනවා. මොකද පොලිස්පතිව ගෙන්වන්න බලතල මට නැහැ. කථා නායකතුමාට වාගේ. කථා

[7] හැන්සාඩ් අංශයේ තබා ඇත.

නායකතුමා නම් ගෙන්නලා අහන්න පුළුවන්. ඒ අදාළ බල ප්‍රදේශයේ නියෝජ්‍ය පොලිස්පතිව ගේන්න පුළුවන්. නමුත් පළාත් සභාවේ සභාපතිතුමාට එවැනි බලතල දීලා නැහැ. නමුත් අපි පුළුවන් විධියට ඔබතුමා වෙනුවෙන් පෙනී සිටිනවා. ගරු ප්‍රධාන අමාත්‍යතුමාත් පෙනී සිටීවි ප්‍රධාන අමාත්‍යතුමා වශයෙන්. ගරු මන්ත්‍රීතුමා අපි අනිවාර්යයෙන්ම ඒ ගැන සොයා බලනවා.

## වරප්‍රසාද
## PRIVILEGES

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මේ මගේ ළඟ තිබෙනවා, නොවැම්බර් 08 වැනිදා සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්ට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් එවලා තිබෙනලිපියක්. මේ ලිපි දෙකම මම සභාගත කරනවා. මේකේ තිබෙන්නේ, නැවත දැනුම් දෙන තුරු සියලුම සංවර්ධන වැඩ නතර කරන්නය කියලා. එස්. අමරසේකර කියලා. අග්‍රාමාත්‍ය ලේකම්වරයා. නොවැම්බර් 08 වැනිදා. “දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් පත් කරන තෙක් සංවර්ධන වැඩ සඳහා මුදල් ප්‍රතිපාදන බෙදා දීම සහ විවිධ භාණ්ඩ බෙදා දීම් වැඩ සටහන් තාවකාලිකව නතර කරන්නය” කියලා. මෙයින් කියන්නේ ගරු සභාපතිතුමනි, අපි මේ යවන යෝජනා අරහේ මෙහේ ඔක්කොම සැලසුම් කරලා ඉවරයි. මෙවැනි චක්‍රලේඛයක් ආපු ගමන් නිලධාරින් වැඩ කරන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩි ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, මේවා සැලසුම් කරපුවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඒවා - මම කොළඹ දිස්ත්‍රික්කය සම්බන්ධීකරණය කරන්නේ. ඒ කිසි වැඩක් කරගන්න බැහැ. අපි දැක්කා ජනාධිපතිතුමා රූපවාහිනියට ඇවිල්ලා නිලධාරීන් ගෙනැල්ලා, අමාත්‍යාංශ ලේකම්වරු ගෙනැල්ලා කියනවා කිසි වැඩක් නොකර ඉන්න එපා. සංවර්ධන වැඩ නතර කරන්න එපා. සංවර්ධන වැඩ කරන්න කියලා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඒ ජනාධිපති. විමධ්‍යගතවලට අවුලක් නැහැ. අනික් ඒවා එහෙම බැහැ. විමධ්‍යගත වලට අවුලක් නැහැ. අනික් ඒවා එහෙම බැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මොකක්ද?

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

විමධ්‍යගතවලට අවුලක් නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔයාද මේක යැව්වේ?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඔව්. ඔව්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔයා කොහොමද ඒක කියන්නේ?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

හැම එකකටම කථා කරන්න එනවා. දන්න මඟුලකුත් නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

සමාවෙන්න ගරු මන්ත්‍රීතුමා. මම ඔබතුමාගෙන් අහන්නේ නැතිව අරයාගෙන් ඇහුවා නම් ඉවරයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා, ඕක යවලා තිබෙන්නේ අර මෆට් අගමැතිගේ ලේකම්ද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ආන්න හරි. එයා නීත්‍යානුකූල ලේකම් නොවෙයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අපට මේක සොයා ගන්නත් බැහැ. ඇමතිවරු ඇත්තෙත් නැහැ රටේ. මොකක්ද මේ?

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ඒ කියන්නේ තමුන්නාන්සේලාගේ රනිල් අගමැතිද?

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

පරණ එකක් ගැන කියන්නේ. දැන් ඒක ප්‍රශ්නයක් නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

ඕක පරණ එකක්. දැන් පුළුවන් කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

දැන් ගරු මහ ඇමතිතුමා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපති. මහ ඇමතිතුමා ඉන්නවා නේ?

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

මේ ජේ.වී.පී. එක හිතේ අමාරුවෙන් ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා පිළිගන්නවා.

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

ගරු මන්ත්‍රීතුමා දැන් ඒක පුළුවන්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

සභාවල කවුරු සභාපති දැම්මත් -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

රනිල් අගමැතිතුමා නැතිව ජනතා විමුක්ති පෙරමුණ හිතේ අමාරුවෙන්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අපි ගිහිල්ලා තමයි ඒ වැඩ කටයුතු කරන්නේ. ප්‍රාදේශීය ලේකම්ගේ මූලිකත්වයෙන්.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

මොකද කරන්නේ?

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි දැන් පුළුවන්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, නැවත දීලා තිබෙනවා දෙසැම්බර් 31 න් ඉස්සෙල්ලා ඉවර කරන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒවා ප්‍රශ්නයක් නැහැ දැන්. දැන් පුළුවන්. ගැටලුවක් නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, කොයි අමාත්‍යාංශයද, කොයි ලේකම්තුමාද ඕක යවලා තිබෙන්නේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

අමරසේකර කියලා අගමැතිගේ නීති විරෝධී ලේකම්වරයෙක්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

නිලධාරීන් අසරණයි. නිලධාරීන් භයයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් ඒ ප්‍රශ්නයක් නැහැ. දැන් ඡන්දයක් නැහැ නේ. ඒ නිසා දැන් ක්‍රියාත්මකයි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

නිශාන්ත වර්ණසිංහ ජනාධිපති උපදේශක.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එක්කෝ මේ ජනාධිපති මේ ඔක්කොම කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක වෙනවා. කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එයා ඔක්කොම කළා නම් ඉවරයි.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

කොඩිකාර අගමැතිතුමාට කියන්න.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon. O. W. Prasanna Sanjeeva

ඒ චක්‍රලේඛය අහෝසියි. දැන් වැඩ කරගෙන යනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

පළාත් සභාව ඕනැත් නැහැ. මොකුත් ඕනෑ නැහැ. විධායක ජනාධිපති හිටියාම ඇති එතකොට.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

අපි නොවෙයි නේ පත් කළේ. ඕගොල්ලො නේ.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

අපිද කඩේ ගිහිල්ලා පත් කළේ?

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

හරියට අපි පත් කළා වාගේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ මම මෙහෙම කියනවාට සමාවෙන්න. එතුමා කථා කළේ කාටත් බලපාන ප්‍රශ්නයක්. දැන් ඒ ප්‍රශ්නය නැහැ. දැන් ඒක ක්‍රියාත්මක වෙනවා. වැඩ කරනවා. ගිවිසුම් අත්සන් කරනවා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

පළාත් සභාවේ සියලු වැඩ කෙරීගෙන යනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපේ මන්ත්‍රීවරු තුන් හතර දෙනෙක් ඉන්නවා. අනවශ්‍ය බාධා කිරීම් දිගින් දිගටම කරනවා. එහෙම කරන්න එපා. අපට න්‍යාය පත්‍රයට යන්න බැහැ. ඕනෑ එකටයි එපා එකටයි කෑ ගහනවා. එහෙම කරන්න එපා. කට තිබ්බාට එහෙම කෑ ගහන්න එපා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

එක වෙලාවකට මහින්ද කඩේ බඩු හොඳ නැහැ. තව වෙලාවකට මෛත්‍රීගේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඕක නේ මම කිව්වේ. ඊළඟට මහ ඇමතිතුමාගේ මුදල් ප්‍රකාශයට වෙලාව නැහැ. ඔබතුමන්ලා වීරයෝ වාගේ මේක ඇතුළේ කෑ ගහනවා. මම මෙහෙම කිව්වාට සමාවෙන්න. නිතරම මයික් on කරගෙන කෑ ගහනවා.

# පළාත් සභාවේ රැස්වීම - I
PROVINCIAL COUNCIL MEETING - I

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, *"මෙතැන් පටන් එනම්, 2018.11.19 දින පටන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ සභා ශාලාව යනුවෙන් සඳහන් කරනු ලබන සියලු තැන්හිදී, ඉන් අදහස් කරනු ලබනුයේ බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා කාර්යාල පරිශ්‍රයේ නව ගොඩනැගිල්ලේ 12 වන මට්ටම (12 වන මහල) හි ස්ථාපිත මෙම අභිනව සභා ශාලාවම බවත්, බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් කැඳවනු ලබන රැස්වීමක් පිළිබඳව මෙන්ම පළාත් සභාව වෙනත් තීරණයක් ගන්නා අවස්ථාවකදී හැර අන් සියලු අවස්ථාවන්හිදී ඉහත කී සභා ශාලාව බස්නාහිර පළාතේ පළාත් සභාව රැස්වන ස්ථානය ලෙස සලසා කටයුතු කළ යුතු බවත්, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ රැස්වීම - II
PROVINCIAL COUNCIL MEETING - II

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, *"මෙම පළාත් සභාව වෙනත් තීරණයක් නොගන්නා තෙක්, 2018.10.23 හා 2018.11.07 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එකඟතාවය පළ කළ පරිදි 2018 නොවැම්බර් මස 19 වන දින, 2018 දෙසැම්බර් මස 04, 05, 06, 07, 10 හා 11 යන දිනයන් 2019 වර්ෂයේ මුදල් ප්‍රකාශය හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන් විය යුතුය."*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳව සභාවේ එකඟතාවය?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, විපක්ෂයත් එකඟ වෙනවා නම් මම යෝජනා කරන්න කැමැතියි මෙවර අයවැය දින තුනකට සීමා කරමුයි කියලා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අපි සභාවෙන්ම තීන්දුවක් ගමු. ඒක හොඳ අදහසක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවෙන් තීන්දුවක් ගමු.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

විපක්ෂ නායකතුමාට, ඔබතුමා කථා කරලා තිබෙනවා. අපේ කණ්ඩායමේදීත් එකඟ වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇයි අපි එහෙම කරන්නේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා? හේතුව ඇයි අපි එහෙම යන්න? අමාත්‍යවරු ලැහැස්තියි නේද බජට් එකට.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපි ලැහැස්තියි. දින තුනකට සීමා කර ගනිමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම නම් හිතන්නේ ඒක - ඡන්දෙත් දැන් නැහැ නේ ඇමතිතුමා? මැතිවරණයත් නැහැ නේ?

**ගරු හෙක්ටර් බෙත්මගේ** -සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, සභාවේ මත විමසුමකට යන්න ඕනෑ එහෙම කල් දානවාද කියලා. ඔබ දෙපල සාකච්ඡා කළයි කියලා බැහැ.

**ගරු සුමිත්ලාල් මැන්දිස්** - අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

සභාවේ එකඟතාවය ගත්තා නම් හරි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

හතර, පහ, හය, හත

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, අපි දැන් මේ සැලසුම් කරලා සභා කටයුතු කාරක සභාවේ සියලු දේවල් හදලා තිබෙන්නේ. ඔබතුමාට මොකක් හරි ප්‍රශ්නයක් තිබෙනවාද දවස් තුනකට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මගේ ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එහෙමනම් මොකක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නමුත් සභාව යෝජනා කරනවා නම්, සභාව එකඟ නම්, විපක්ෂය -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

අපි ඒකට එකඟ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව තමයි මෙතැන උත්තරීතර. සභා කටයුතු කාරක සභාව නොවෙයි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ලක්ෂ්මන් ගරු මන්ත්‍රීතුමා කියන්නේ මොකක්ද?

**ගරු හෙක්ටර් බෙත්මගේ** -සභා නායකතුමා
Hon. Hector Bethmage - Leader of the House

කරූ ජයසූරිය මහත්මයා කිව්වෙත් ඒකයි. සභාව උත්තරීතරයි. සභාවේ වැඩි මතයට යන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මහ ඇමතිතුමා යෝජනා කළා. විපක්ෂයත් එකඟ වුණා. දින තුනකට යන්න.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඕක බෙදිලා තීන්දුවක් ගන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එතකොට දැන් දින කීයද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දවස් හයයි. දැන් න්‍යාය පත්‍රය සකස් කරලා තිබෙන්නේ. ඒක වෙනස් කරන්න වෙනවා. පොඩි අර්බුදයක් වෙනවා ඒකේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

හරි නම් මේකේ දින ප්‍රමාණය වැඩි කරන්න ඕනෑ. මොකද, දැන් පසුගිය කාලයේ කෙරුවාව සම්බන්ධව අපට කථා කරන්න තිබෙන්නේ මේකේදී තමයි.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ගරු සභාපතිතුමනි, කෙරුවාව කථා කරන්න දවස් තුන ඇති. දවස් තුනට අපි එකඟයි. අපි දවස් තුනකට යන්.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මම හිතන්නේ දින හතරකට මම යෝජනා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා යෝජනා කරනවා, අයවැය විවාදය දින හතරක් කරන්නය කියලා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ඒකට අපි විරුද්ධයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමනි, ඒකට අපි එකඟ නැහැ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

එක දිනෙන් පුළුවන් නම්, ඒත් කමක් නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

සභා කටයුතු කාරක සභාවෙන් දැනට සැලසුම් කරලා හදලා තිබෙන යෝජනාවට තමයි අපි එකඟ.

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

උදේන විජේරත්න ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අපි එකඟ නැහැ ඒකට.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

මහ ඇමතිතුමා එක දිනෙන් ඉවර කරමු.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

හේතුව මොකක්ද? ඇයි මේ සැලසුම් කරලා තිබෙන විධියට යන්න බැරි? හේතුව මොකක්ද? මොකක් හරි ප්‍රශ්නයක් තිබෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමන්ලාගේ ගරු මන්ත්‍රීතුමන්ලා කියන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ලක්ෂ ගණනක් වියදම් කරලා, පුහුණුවක් ලබලා -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

වියදම් අඩු කරන්න.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

අරහේ වගේ මෙහෙත් වෙයි කියලා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

වියදම් අඩුකරන්න.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, දැන් සභාවේ තීන්දුවක් ගත්තා නේ? විවාදයකට යන්න අවශ්‍යතාවයක් නැහැ. සභාවේ තීන්දුව හැටියට ඊළඟ සභා කටයුතු කාරක සභාවට දාලා මේක අනුමත කර ගනිමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා කටයුතු කාරක සභාවට යන්න අවශ්‍ය නැහැ. සභාව තීරණය වෙනවා නම් එහෙම. නමුත් එතුමා අහන්නේ ඇයි අපි එහෙම තීරණය කරන්නේ කියලා. හේතුව මොකක්ද කියලා අහන්නේ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු සභාපතිතුමනි, වියදම් අඩු කිරීම සඳහා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

දින හයක් හතක් තිබුණත් කවුරුත් එන්නෙත් නැහැ. මේක වේලෙනවා.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

අපරාධයක්. කාලයයි, -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ජේ.වී.පී. එකේ කට්ටියට වැඩ නැහැ නේ ඉතින්. මේකේ ඇවිල්ලා හරි ලගින්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

යෝජනා කීපයක් තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ප්‍රගතිය බලලා තීන්දු ගන්නවා නම් ඇත්තටම මේක නතර කරලාම දාන්න ඕනෑ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

පුටු වාගේ නේද? සභාවට දුන්නු පුටු ටික වාගේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ජේ.වී.පී. එකට ඉතින් බත් වේලක් කන්න පුළුවන් නේ.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

දැන් පේනවා නේ පුටුවල හැටි.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

බෝම්බයක් ගැහුවා නම් ඉවර කළහැකි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මහ ඇමතිතුමා දවස් හතරකට යෝජනා කරනවා. ඒ පිළිබඳව -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු සභාපතිතුමනි, 87 වාගේ බෝම්බයක් ගැහුවා නම් ඉවර කරන්න තිබුණා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපි එකඟයි.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, සභා කටයුතු කාරක සභාවෙන් තීන්දු කරපු දින ටික තමයි මේ දාලා තිබෙන්නේ. අද අයවැය කථාව කළාට පසු නැවත සභා කටයුතු කාරක සභාවේදී තීන්දුව ගන්න පුළුවන්. දින කීයක් විවාද කරනවාද කියලා. මේ විවාදය නතර කරලා අයවැය කථාවට ඉඩ දෙන්න ඊට පස්සේ අපි සභා කටයුතු කාරක සභාවේ තීන්දුවක් ගනිමු.

**ගරු චන්දන ජයකොඩි - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. Chandana Jayakody - Chief Government Whip

අනිද්දා නේ තිබෙන්නේ.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

අනිද්දාට සභා කටයුතු කාරක සභාව තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා කටයුතු කාරක සභාවටම යන්න ඕනෑ නැහැ, දින නියම කරන්න. මේ මන්ත්‍රීවරුන්ට පුළුවන්.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

හරි දැන් විපක්ෂ නායකතුමාත් එකඟ නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා එකඟද විපක්ෂ නායකතුමා

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා එකඟ නැහැයිලු.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

දවස් හතරකට සීමා කරමු.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

හතරකට සීමා කරමු. ඒක හොඳයි.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ සම්බන්ධයෙන් අපේ විරෝධය ප්‍රකාශ කරනවා. ජනතා විමුක්ති පෙරමුණේ කණ්ඩායමේ විරෝධය ඒ සඳහා ප්‍රකාශ කරනවා.

**ගරු උදේන විජේරත්න**
Hon. Udena Wijerathne

එක්කෙනයි නේ විරුද්ධ වෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇයි අපි හතරට යන්නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

අපි ඡන්දයකට යන්.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

සභා කටයුතු එකේ තීන්දුවක් අරන් දැනුම් දෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. අපි එහෙමනම් මුදල් ප්‍රකාශය ඉදිරිපත් කරන්න එතුමාට අවස්ථාව ලබා දෙමු. සභා කටයුතු කාරක සභාවේදී තීරණය කරමු. මොකද මේකේ ප්‍රශ්නයක් තිබෙනවා නේ. ජේ.වී.පී. මන්ත්‍රීතුමන්ලා විරුද්ධයි. අරගොල්ලොත් විරුද්ධයි. මන්ත්‍රීතුමියන්ලා -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

මුදල් ප්‍රකාශය ඕනෑත් නැහැ. මුදල් ප්‍රකාශය රෝනියෝ කරලා මන්ත්‍රීවරුන්ට බෙදන්න. එතකොට මේ සභාවේ සල්ලි ඉතුරු කරගන්න පුළුවන්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මෙහෙමයි. බස්නාහිර පළාත කියන්නේ වැදගත් ජනතාවක් ඉන්න පළාත් සභාවක්. ඉතින් කථා කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා රැස්වීම් තුන යෝජනාව ගරු ඇමතිතුමා ඉදිරිපත් කරන්න. කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න. මම නොවෙයි මේ කිසි දෙයක් තීරණය කරන්නේ. සභාව. මෙතැනදී සාමූහික - විපක්ෂය එකඟයි කියනවා. ඉතින් මම මොකද කරන්නේ? ජෝර්ජ් පෙරේරා සංවිධායකතුමා කියනවා දින තුනකට යමු කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමන්ලාගේ ප්‍රශ්නය පක්ෂය ඇතුළේ බේර ගන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේසභා නායකතුමා -**
Hon. Hector Bethmage - Leader of the House

සිරිකමල් ගරු මන්ත්‍රීතුමා, මොකද, මළ පැනලා වාගේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

සභා කටයුතු එකේදී තීන්දුවක් ගමු. සභා කටයුතු එකේ කට්ටිය ඉන්නවා නේ?

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

ගරු සභාපතිතුමනි, වැඩමුළු පවත්වලා ඉවර වෙලා දැනුවත් කරලා තිබෙනවා.

[සභාවේ ඝෝෂා]

එහෙම එකක් නැහැ. අපි මේ සභාවත් එක්ක සක්‍රීයව දායක වන මන්ත්‍රීවරු. අපට මේ අමාත්‍යාංශ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අයියෝ. විපක්ෂය බෙදිලා නේ. විපක්ෂයේ මත දෙක තුනක්. ඒ ඇයි?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හතරවැනි යෝජනාව.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, හරියට මේ ප්‍රශ්නය එක්සත් ජාතික පක්ෂයේ ඉහළ තිබෙන ප්‍රශ්නය වාගේ තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා ඔබතුමා අනවශ්‍ය ප්‍රකාශ කරන්න එපා. දැන් යෝජනාව ගේන්න කෝ.

[සභාවේ සෝෂා]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු සභාපතිතුමනි, මත දෙක තුනක් තිබෙනවා නම්, මතය විමසන්න කෝ? ඔච්චර මත තිබෙනවා නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා යෝජනාව ඉදිරිපත් කරන්න. හතර වැනි යෝජනාව.

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

යෝජනාව ගේන්න දෙන්නේ නැහැ. ඒකයි මම මේ කිව්වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා නේ අනවශ්‍ය ඒවා ඇද ගන්නේ.

# පළාත් සභාවේ රැස්වීම : III
PROVINCIAL COUNCIL MEETING : III

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි, *"මින් පෙර කිනම් තීරණයක් ගෙන තිබුණද, ඒ කිසිත් නොතකා අද දින (2018.11.19 දින) න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයෙහි වැඩ කටයුතු සඳහා රීති අංක 49 (3) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිසිදු බාධාවක් සිදු නොවිය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය"*යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ රැස්වීම : IV
PROVINCIAL COUNCIL MEETING : IV

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි,*"2019 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා කාර්ය පටිපාටි රීති අංක 49 (5) හි සඳහන් කාල පරාසයන්ගෙන් කිනම් හෝ බාධාවක් සිදු නොවිය යුතුය"*යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ කටයුතු
PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු සුමිත්ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumithlal Mendis - Minister

ගරු සභාපතිතුමනි,*"2018.11.07 දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී එකඟතාවය පළ කළ පරිදි, අද දින සභා රැස්වීමේදී වැඩ කටයුතු සඳහා රීති අංක 15 (2) (ඇ) හා රීති අංක 15 (3) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිසිදු බාධාවක් සිදු නොවිය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය"* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# 2018 පරිපූරක ඇස්තමේන්තුව - 03
SUPPLEMENTARY ESTIMATE - 03 - 2018

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි,*"2018 වර්ෂය සඳහා බස්නාහිර පළාත් සභාවේ ආයතනවල මතු දැක්වෙන අවශ්‍යතා වෙනුවෙන් අමතර ප්‍රතිපාදන සලසාදීම සඳහා එනම්,*

- *සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව*
  - *i. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නව බඳවා ගැනීම්, උසස් කිරීම් හා ස්ථාන මාරු වී පැමිණීම් වෙනුවෙන් වැටුප් හා දීමනා ගෙවීමට 2018 වර්ෂයට අවශ්‍ය අමතර ප්‍රතිපාදන. - රු. 729,247,000/-*

ii. *උස්සවීම් හා රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව වැඩි වූ රේඛයන් අනුව අතිකාල ගෙවීම් කිරීමට 2018 වර්ෂයට අවශ්‍ය අමතර ප්‍රතිපාදන.* - *රු. 715,145,000/-*

- *ආයුර්වේද දෙපාර්තමේන්තුව*

i. *ආයුර්වේද දෙපාර්තමේන්තුවේ නව බඳවා ගැනීම් සහ ස්ථාන මාරුවීම් සඳහා වැටුප්, දීමනා හා විදුලි සංදේශ සේවා වෙනුවෙන් 2018 වර්ෂයට අවශ්‍ය අමතර ප්‍රතිපාදන.* - *රු. 63,034,000/-*

- *අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය*

i. *පාසල් අධ්‍යාපන දැනුමේ කේන්ද්‍රස්ථානයේ පදනම බවට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රජයෙන් ලද ප්‍රදාන වියදම් දැරීම වෙනුවෙන් 2018 වර්ෂයට අවශ්‍ය අමතර ප්‍රතිපාදන* - *රු. 21,000,000/-*

- *ඉංජිනේරු කාර්යාංශය*

i. *නව බඳවා ගැනීම් සඳහා වැටුප්, දීමනා ගෙවීමට හා හිඟ වැටුප් ගෙවීම සඳහා අවශ්‍ය අමතර ප්‍රතිපාදන සැලසීම.* - *රු. 15,493,000/-*

ii. *පරිපූරක ඇස්තමේන්තු යෝජනා අනුව ඉටු කළ යුතු ඉදි කිරීම් කටයුතුවල අතිරේකව විශාල වැඩ කොටසක් ඉටු කිරීමට සිදු වීම නිසා ප්‍රාදේශීය ඉංජිනේරු හා තාක්ෂණ නිලධාරීන් සඳහා අමතර නිවාඩු දින වැටුප් ගෙවීමට සිදු වීම.* - *රු. 9,855,000/-*

*එකතුව* *රු. 1,553,774,000/-*

යනාදී අවශ්‍යතා වෙනුවෙන් 2018 වර්ෂය සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතුව ඇති හෙයින්, ඒ සඳහා වූ 2018 පරිපූරක ඇස්තමේන්තුව - 03 සඳහා අවශ්‍ය රුපියල් එක් බිලියන පන්සිය පනස්තුන් මිලියන හත්සිය හැත්තෑ දහසක් (රු. 1,533,774,000/- ක්) වන ප්‍රතිපාදනය :

| | | | |
|---|---|---|---|
| i | *පළාත් සභා ආදයමින්* | - | *රු. 350,000,000/-* |
| ii | *පළාත් අධ්‍යාපනය දැනුමේ කේන්ද්‍රස්ථානයේ පදනම බවට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා* | - | *රු. 21,000,000/-* |
| iii | *රජයෙන් ලබා ගැනීමට අපේක්ෂිත ප්‍රදාන* | - | *රු. 1,182,774,000/-* |
| | *එකතුව* | | *රු. 1,553,774,000/-* |

*වන පරිදි පියවා ගැනීමට අපේක්ෂිත වන අතර, ඉහත කී රජයෙන් ලබා ගැනීමට අපේක්ෂිත ප්‍රදාන ලෙස සඳහන් රු. 1,182,774,000/- ක් වූ ප්‍රදානය ලබා දීම පිළිබඳව එකඟතාව අපේක්ෂාවෙන් යුතුව මෙම පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරන අතර, ඉහත සඳහන් සියලු කාරණා අනුව පිළියෙල කරන ලද 2018 පරිපූරක ඇස්තමේන්තුව - 03 අනුමත කළ යුතුය"යන යෝජනාව ඉදිරිපත් කරනවා.*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා ඉදිරිපත් කළ පරිපූරක ඇස්තමේනතුව සඳහා සභාවේ එකඟතාවය. සාකච්ඡා කරන්න අවශ්‍ය නැහැයි කියලා එතුමාත් කියනවා. විපක්ෂයත් ඒක පිළිගන්නවා. එහෙමනම් ඒ සඳහා එකඟතාවය?

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු සභාපතිතුමනි, මම විරුද්ධයි. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නව බඳවා ගැනීම් සහ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ නව බඳවා ගැනීම් පිළිබඳව පරිපූරකය හරහා මුදල් වෙන් කිරීම සම්බන්ධයෙන් මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, අර ගරු මන්ත්‍රීතුමා සඳහන් කරන කාරණාවලට මේ ගෙවීම් අදාළ නැහැ. සභාව දැනුවත් වෙන්න ඕනෑ. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ගරු මන්ත්‍රීවරුන්ගේ දැන ගැනීම සඳහා එතුමා මතු කරන කාරණාව මේකට සම්බන්ධයක් නැහැ. මේ ගෙවීම් නර්ස්ලාට සහ වෛද්‍යවරුන්ට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා, මන්ත්‍රීතුමා දැන් විරුද්ධ වුණා. රීති අනුව දැන් ඡන්දයකට යන්න ඕනෑ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එතුමාගේ විරුද්ධවීම ගැටළුවක් නැහැ. නමුත් එතුමාගේ ප්‍රකාශයත් එක්ක ඒ පිළිබඳව උනන්දු වන මන්ත්‍රීවරුත් නොමඟ යනවා නේ? තේරුණාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නමුත් විරුද්ධ නම් ඡන්දයකට යන්න ඕනෑ. එතුමා විතරයි ඉන්නේ. කරුණාකරලා සීනුව නාද කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු හෙක්ටර් බෙත්මගේනායකතුමා සභා -**
Hon. Hector Bethmage - Leader of the House

ගරු සභාපතිතුමනි, එක්කෙනෙක් විරුද්ධ වුණු පළියට අපට මේක -

**ගරු චන්දන ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Chandana Jayakody - Chief Government Whip

එක්කෙනෙක් විරුද්ධ වුණත් ඡන්දයකට යන්න වෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

රීති අනුව ඡන්දයකට යන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2018 පරිපූරක ඇස්තමේන්තුව - 03 පිළිබඳව බෙදීමක් තිබුණු නිසා ඒ පිළිබඳව ඡන්ද විමසීමේදී පක්ෂව ඡන්ද බහුතරයක් තිබුණා. ඒ ප්‍රමාණය මම සඳහන් කරන්න අවශ්‍ය නැහැ. විපක්ෂව එක මන්ත්‍රීතුමයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

විපක්ෂව දෙකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න. විපක්ෂව දෙන්නෙක් හිටියා. ඡන්දය දීමෙන් වැළකී සිටි මන්ත්‍රීවරු 07 දෙනෙක් හිටියා. ඒ අනුව බහුතරයෙන් සම්මත වූ බව මම ප්‍රකාශ කර සිටිනවා.

## 2018 පරිපූරක ඇස්තමේන්තුව - 03 ට අදාළ විසර්ජන ප්‍රඥප්තිය

APPROPRIATION STATUTE RELEVANT TO THE SUPPLEMENTARY ESTIMATE - 03 - 2018

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, *“2018 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තුව - 03 සඳහා අවශ්‍ය රුපියල් එක් බිලියන පන්සිය පනස්තුන් මිලියන හත්සිය හැත්තෑ හතර දහසක් (රු. 1,553,774,000/-) වූ මුදල බස්නාහිර පළාත් සභා අරමුදලින් ගෙවීමටත්, එකී බස්නාහිර පළාත් සභා අරමුදලට ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ප්‍රදාන වශයෙන් හෝ වෙනත් ආකාරයකින් ලැබෙන මුදල් භාර ගැනීමටත් බලය දෙනු ලබන 2017 අංක ....... දරන විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය”* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## අපද්‍රව්‍ය කළමනාකරණ විශේෂ විධිවිධාන ප්‍රඥප්තිය : පළමුවන වර කියැවීම
WASTE MANAGEMENT SPECIAL PROVISIONS STATUTE OF WESTERN PROVINCE: FIRST READING

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ විශේෂ විධිවිධාන ප්‍රඥප්තිය"* මම ඉදිරිපත් කරන ලදී.

**[පූර්විකාව ]*
*[Preamble]*

**හේමන්ත සමරකොන් - සභා ලේකම්**
Hemantha Samarakoon - Council Secretary

ගරු සභාපතිතුමාගේ නියමය පරිදි ප්‍රඥප්තියේ පූර්විකාව වූ,

*"බස්නාහිර පළාත තුළ අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළව බස්නාහිර පළාතේ 2007 අංක 1 දරන බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරී ප්‍රඥප්තියෙන් සංස්ථාපිත බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ක්‍රමෝපායන් පළාත් පාලන ආයතන මට්ටමින් බලගැන්වීම සඳහා ද පළාත් පාලන ආයතන විසින් එක්රැස් කළ යුතු වීථිවල තිබෙන අපද්‍රව්‍ය, නිවාසවල තිබෙන අපද්‍රව්‍ය නිසි හා යෝග්‍ය ක්‍රියාමාර්ග යටතේ බැහැර කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද පළාත් පාලන ආයතන විසින් එක්රැස් කළ යුතු වීථිවල තිබෙන අපද්‍රව්‍ය, නිවාසවල එක්රැස් වන අපද්‍රව්‍ය හැර වෙනත් අපද්‍රව්‍ය පළාත් පාලන ආයතන විසින් භාර ගැනීම සම්බන්ධයෙන් මිලක් නියම කිරීම හා ප්‍රමිති තීරණය කිරීම සඳහා විධිවිධාන සැලසීමට ද බස්නාහිර පළාත තුළ අපද්‍රව්‍ය කළමනාරකණ අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමෝපායන් නියාමනය වෙනුවෙන් ගාස්තු නියම කිරීම සඳහා ද විධිවිධාන සැලසීම පිණිස පනවනු ලබන ප්‍රඥප්තියකි"*යන පාඨය මම මෙම සභාව හමුවේ ප්‍රකාශ කරනවා. ස්තුතියි.

***අනතුරුව, ප්‍රඥප්තිය ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන ලෙස නියෝග කරන ලදී.***
*Accordingly, it was ordered that the Statute be forwarded to the Committee on Statutes and Laws.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොදු කටයුතු යටතේ මීළඟට ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අවස්ථාව අයවැය කථාව පවත්වමින් 2019 වර්ෂයට වෙන් වූ මුදල් ප්‍රකාශය හා ඊට අදාළ විසර්ජන ප්‍රඥප්තිය ඉදිරිපත් කිරීමට ඊළඟට තිබෙන්නේ.

මුදල් ප්‍රකාශය පිළිබඳ යෝජනාව ඉදිරිපත් කිරීමට ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ආරාධනා කරනවා.

## වාර්ෂික මුදල් ප්‍රකාශය 201 -9 වසර
ANNUAL FINANCIAL STATMENT - 2019

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

***"2019** වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශය අනුමත කළ යුතුය.**"***

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

## අයවැය කථාව201 -9 වසර
BUDGET SPEECH – YEAR 2019

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, ගරු අමාත්‍යවරුනි, ගරු මන්ත්‍රීවරුනි, පළාත් සභාවේ මුදල් විෂයය භාර අමාත්‍යවරයා වශයෙන් මෙය මා විසින් මෙම සභාවට ඉදිරිපත් කරනු ලබන සිවුවැනි අයවැය යි. ඉදිරි වර්ෂයේ පැවැත්වෙතැයි අපේක්ෂිත පළාත් සභා මැතිවරණය අභිමුව තබාගෙන සංවර්ධනාත්මක අයවැයකට අදාළ කෙටුම්පත් මුදල් ප්‍රකාශය සහ විසර්ජන ප්‍රඥප්තිය ඔබතුමන්ලා හමුවේ තබනුයේ ඉතාමත් ගෞරවයෙනි.

2018 වර්ෂය පළාත් සභාවේ ඉතා වැදගත්, සුවිශේෂ වර්ෂයක්.පළාත් සභා ඉතිහාසයේ සංවර්ධනය සඳහා වැඩිම මුදලක් වෙන්කළ වර්ෂය 2018 වර්ෂය යි. පසුගිය වර්ෂ 8 ක් තුළ සංවර්ධනයට වෙන්කළ මුදල් පිළිබඳ ලැයිස්තුවක් මේ සමග පළමුවන උපලේඛනය ලෙස ඉදිරිපත් කරනවා. ඒ අනුව 2018 වර්ෂයට වෙන්කළ මුදල රුපියල් මිලියන 15,435 ක් වන අතර සමස්ත අයවැයෙන් එය සියයට 20.5 ක්. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව

පළාත් සභාවක මුදල් විෂයය පැවරිය නොහැකි විෂයයක්.එය දැරිය යුත්තේ ප්‍රධාන අමාත්‍යවරයා පමණයි. වෙනත් විෂයයන් පැවරිය හැකි වුවත් මුදල් බලය වෙන කෙනෙකුට පවරන්න බැහැ.මා ප්‍රධාන අමාත්‍ය ධූරය දැරූ කාලය තුළ මුදල් විෂයය භාර අමාත්‍යවරයා වශයෙන් ජනතා පරමාධිපත්‍යය නිසි පරිදි ක්‍රියාත්මක කළා යැයි මා විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි,අද මා මුදල් ප්‍රකාශය ඉදිරිපත් කරන සභා ශාලාව ඇතුළත් මෙම ගොඩනැගිල්ල නිර්මාණය කළේ දිගුකාලීන, අනාගත ඉදිරි දැක්මක් ඇතිවයි. නවීන තාක්ෂණයෙන් සහ ගුණාත්මකභාවයෙන් පිරි මෙවැනි ගොඩනැගිල්ලක් අග නගරයේ පමණක් නොවෙයි මුළු දිවයිනේම නොමැති බව වෙනත් චේතනාවලින් තොරව මේ දෙස බලන ඕනෑම අයෙකුගේ අවංක පිළිගැනීම විය යුතුයි.සාර්ථක හොඳ දෙයක් පිටුපස අතිශයෝක්තියෙන් කරනු ලබන විවේචන පැවතීම ස්වභාවික තත්ත්වයක්. ජාතියේ යහපත උදෙසා ක්‍රියාවට නැංවීමට උත්සාහ කළ සමහර දෑ, දේශපාලන වෙනස්කමක් මත පමණක් විරුද්ධ වීම නිසා නතර කළ අවස්ථා පිළිබඳ අතීතය සාක්ෂි දරනවා.ඒවා නිර්මාණය කර තිබුණේ නම් කෙතරම් හොඳද යන්න අද අපට සිතෙන වාර අනන්තයි.දැනට වර්ෂ කිහිපයකට පෙර, එදා මුදල් විෂයය භාර අමාත්‍යවරු විජේරාම මාවතේ කුළියට ගත් රැස්වීම් ශාලාවක අයවැය ඉදිරිපත් කළ අයුරු මාගේ මතකයට එනවා.මෙම සභාවේ මංගල අයවැය මා ඉදිරිපත් කළද, තව ශත වර්ෂ ගණනාවක මුදල් අමාත්‍යවරුන්ට ගෞරවනීය ලෙස අයවැය ඉදිරිපත් කිරීමට හැකියාවක් නිර්මාණය කර දීම පිළිබඳ ගරු මන්ත්‍රීතුමන්ලා කවුරුත් අවංකව සතුටු වන බව මාගේ විශ්වාසය යි.

*ගරු සභාපතිතුමනි, අද මම හිතන්නේ පාර්ලිමේන්තුවට පමණක් නොදෙවැනි මෙවැනි සභා ශාලාවක උරුමය අපි බස්නාහිර පළාත් සභාවට අනාගතයේ පත් වන මන්ත්‍රීවරුන්ට ලබා දීලා තිබෙනවා. මම හිතන්නේ, පසුගිය දවස්වල මේ අපේ අලුත් ගොඩනැගිල්ල සම්බන්ධයෙන් සහ නව සභා ශාලාව සම්බන්ධයෙන් මහජනතාව තුළ, මාධ්‍යවල නොයෙකුත් මත පළ වුණා. නමුත් අද මෙය මාධ්‍යයට විවර කිරීම තුළින් මේ සභාවට ප්‍රවිශ්ට වුණු මන්ත්‍රීවරුන්ට වුණත් අද මේ සභා ශාලාවට පැමිණීම තුළින්, මේ සභා ශාලාවේ ඉඳ ගැනීම තුළින්, ඒ අයට තේරෙනවා අද කොයි තරම් වටිනා සම්පතක් අපි බස්නාහිර පළාතට ලබා දීලා තිබෙනවාද කියන වග. මේක අපි මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. හිටපු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා මුල්ගල තියලා ඒ කැබිනට් මණ්ඩලය ආරම්භ කරපු - එදා අපි මන්ත්‍රීවරුසහභාගී වුණා. අද අපි මේක විවෘත කරනවා.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා, සමාවෙන්න. ගරු අමාත්‍යවරු එළියට යන්න එපා. අමාත්‍යතුමන්ලා සභා ගර්භයේ ඉන්න. මෙතුමා මුදල් ප්‍රකාශය ඉදිරිපත් කරන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

*කොහොම වුණත් අද මන්ත්‍රීවරුන්ට විතරක් නොවෙයි. මහජනතාවටත් අපි අද මේක ප්‍රදර්ශනය කරන්න, අද ඉඳන් කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා මම හිතනවා, මේ පිළිබඳව අවබෝධයක් නැතිව මෙතෙක් කරපු විවේචනවලට සාධාරණයක් ඉෂ්ට කරන්න පුළුවන් වුණාය කියලා මා ඇතුළු අමාත්‍ය මණ්ඩලයත්, පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුත් විශ්වාස කරනවා.*

ගරු සභාපතිතුමනි,මෙම අයවැය ඉදිරිපත් කිරීමේදී රට තුළ පවතින දේශපාලන වාතාවරණය කෙරෙහි ද මාගේ අවධානය යොමු කිරීමට සිදු වුණා.මීට පෙර පැවති සම්ප්‍රදාය වූයේ, රජයේ අයවැය ඉදිරිපත් කළ පසු පළාත් සභාවේ අයවැය ඉදිරිපත් කිරීමයි. එමගින් පළාතට ලැබෙන ප්‍රදානයන් පිළිබඳව නිශ්චිතවම දැන ගැනීමට හැකියාවක් ලැබුණා.නමුත් මෙම වර්ෂයේ එම තත්ත්වය වෙනස් වූ බව අප කවුරුත් දන්නා සත්‍යයක්. මුදල් කොමිෂන් සභාව සමග සාකච්ඡා කර ප්‍රදානයන් පිළිබඳ ලබා ගත් දත්ත මත මෙම අයවැය සැකසීමට සිදු වුවත් එම සංඛ්‍යාවන්හි වෙනසක් වේ යැයි අප බලාපොරොත්තු වන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි,2019 වර්ෂයේ මුදල් ප්‍රකාශයේ ඇස්තමේන්තුගත මුළු වියදම රුපියල් මිලියන 81,281ක් වන අතර, එය පෙර වර්ෂයට වඩා රුපියල් මිලියන 9,635 ක, එනම් සියයට 13.4 ක වැඩිවීමක්. ඉන් රුපියල් මිලියන 8,465 ක් පුනරාවර්තන වියදම් වන අතර රුපියල් මිලියන 1,170 ක් ප්‍රාග්ධන වියදම් ය. මුළු වියදම පියවා ගැනීම සඳහා රජයෙන් ලැබේ යැයි අපේක්ෂිත ජාතිය ගොඩනැගීමේ බදු සහ මුද්දර ගාස්තුව රුපියල් මිලියන 30,624 ක්. රජයේ ප්‍රදාන වශයෙන්

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

රුපියල් මිලියන 22,217 ක් බලාපොරොත්තු වෙනවා. පළාත් සභාව රැස් කිරීමට බලාපොරොත්තු වන ආදායම රුපියල් මිලියන 26,180 ක් වන අතර පෙර ඉතිරිවීම්වලින් රුපියල් මිලියන 2,260 ක් ආයෝජනය කරනවා.පුනරාවර්තන වියදම, ආදායම සහ අපේක්ෂිත ප්‍රදාන පිළිබඳ විස්තර පිළිවෙලින් දෙවන, තුන්වන සහ හතරවන උපලේඛන වශයෙන් මේ සමග ඉදිරිපත් කරනවා.

## පුනරාවර්තන වියදම්

ගරු සභාපතිතුමනි, **2019** වර්ෂයේ අපේක්ෂිත පුනරාවර්තන වියදම රුපියල් මිලියන 68,460 ක් වෙනවා.මෙය වර්ෂයේ දැරීමට අපේක්ෂිත මුළු වියදමින් සියයට 84**.23** ක්.පෙර වර්ෂයේ වෙන්කළ පුනරාවර්තන වියදමට වඩා සියයට 14ක වැඩිවීමක්.පුනරාවර්තන වියදමෙනුත්, පෞද්ගලික පඩිනඩි සඳහා යන වියදම සියයට 61 ක් පමණ වෙනවා.

සෞඛ්‍ය අංශයේ පුනරාවර්තන වියදම කෙරෙහි ද අපගේ විශේෂ අවධානය යොමු කළ යුතුයි.සෞඛ්‍ය සේවයේ අතිකාල හා නිවාඩු දින වැටුප් සඳහා මුල් ඇස්තමේන්තුව යටතේ රුපියල් මිලියන 2,575 ක් වෙන් කළා.නමුත් එම මුදල ප්‍රමාණවත් නොවී, තවදුරටත් රුපියල් මිලියන 715 ක් ඉල්ලුම් කරනවා.2019 වර්ෂයට රුපියල් මිලියන 5,186 ක් වෙන් කරන්න සිදු වෙලා.මෙය විශාල වැඩිවීමක්. 2018 වර්ෂයේ වෙන්කළ මුදලට වඩා රුපියල් මිලියන 2,611 ක් වෙන් කරන අතර එය පෙර වර්ෂයට වඩා සියයට 101 ක වැඩිවීමක්.

*සාමාන්‍යයෙන් පළාත් සභාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන් කරන මුදල මිලියන 5,186 ක් වන කොට අනෙකුත් අය සඳහා වෙන් කරන්න උවමනා වෙන්නේ කෝටි 12 ක විතර මුදලක්. මිලියන 112 ක විතර මුදලක් තමයි අනික් ඒවාට අතිකාල වශයෙන් යන්නේ. නමුත් සෞඛ්‍ය අංශයට මිලියන 5,186 ක මුදලක් වෙන් කරන්න වෙලා තිබෙනවා.*

2014 වර්ෂයේ සිට සෞඛ්‍ය අංශයේ අතිකාල හා නිවාඩු දින වැටුප් වියදම වර්ධනය වූ ආකාරයත්, 2017 වර්ෂයේ සමස්ත අතිකාල හා නිවාඩු දින වැටුප් වියදමෙන් සෞඛ්‍ය අංශයේ වියදම කොපමණ ද යන්නත් පිළිබඳ විස්තර පස්වන උපලේඛනයෙන් මේ සමග ඉදිරිපත් කරනවා.ඒ අනුව 11,853 ක් වූ කාර්ය මණ්ඩලයක් සිටින සෞඛ්‍ය අංශයේ අතිකාල හා නිවාඩු දින වැටුප් වියදම, සමස්ත අතිකාල වියදමෙන් සියයට 98ක් වනවිට, 47,351 ක් වූ අනෙකුත් සියලු කාර්ය මණ්ඩලයන්හි අතිකාල හා නිවාඩු දින වැටුප් වියදම සියයට 2 යි.වෛද්‍යවරුන් ද ඇතුළුව සෞඛ්‍ය අංශයේ සියලු සේවකයන් දැඩි කැප කිරීමකින් කටයුතු කර ඉතා ඉහළ ගුණාත්මක සේවයක් ලබා දෙන බව අප කවුරුත් අවිවාදයෙන් පිළිගන්නා කරුණක්.එසේ වුවද වෙන් කරන ප්‍රතිපාදන ප්‍රමාණය ද සැලකිල්ලට ගෙන, ගුණාත්මක සේවය තවත් වර්ධනය වේ යැයි යන්න පොදු ජනතාවගේ අපේක්ෂාව බව අපි කවුරුත් තේරුම් ගත යුතුයි.

*සාමාන්‍යයෙන් Day's pay තුනකුත් ඇතිව මාසයකට පැය 120 ක් වන විට සාමාන්‍යයෙන් විශේෂඥ වෛද්‍යවරයෙකුගේ අතිකාල දීමනාව මාසයකට 150,000 ක් පමණ වන බව මම මේ අවස්ථාවේදී අවධාරණය කරන්න කැමැතියි.*

## ප්‍රාග්ධන වියදම්

ගරු සභාපතිතුමනි,2019 වර්ෂයේ අපේක්ෂිත ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන 12,820 ක් වෙනවා.එය වර්ෂයේ දැරීමට අපේක්ෂිත මුළු වියදමින් සියයට 15.77 ක්. 2018 වර්ෂයේදී මුදල් කොමිෂන් සභාව පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සහ උපමාන පාදක ප්‍රදාන යටතේ රුපියල් මිලියන 1,560 ක් ලබා දුන් අතර 2019 වර්ෂය සඳහා මේ යටතේ ලබා දීමට එකඟ වී ඇති මුදල රුපියල් මිලියන 1,717 ක්.පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ ප්‍රතිපාදන ලබා දීමේදී රජය සහ පළාත් සභා අතර විශාල ගැටළු සහගත තත්ත්වයන් පවතිනවා.පළාත් සභාව වෙත සම්පූර්ණයෙන්ම වෙන් වූ විෂයයන් සඳහා අවශ්‍ය ප්‍රාග්ධන පළාත් සභාවට වෙන් නොකර, රජයේ අමාත්‍යාංශ යටතේ වෙන් කිරීම සංවර්ධනයට බාධාවක් වගේම මුදල් නාස්තියට ද හේතුවක්.රජයේ අමාත්‍යාංශවලට වෙන් කළත් ඒවා නැවත පළාත් සභාවලට ලබා දීමෙන් පෙනී යන්නේ එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සහ වියදම් කිරීමේ ක්‍රමවේදයක් එම අමාත්‍යාංශවලට නොමැති බවයි.වර්ෂයෙන් අඩක් ගෙවූ පසු මෙම ප්‍රතිපාදන ලබා දීමෙන් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඵලදායිව ප්‍රයෝජනයට නොගෙන වර්ෂය අවසන් වනවිටත් මෙම ප්‍රතිපාදන ඉතිරි වීම

ජනතාවට කරන අසාධාරණයක්.මෙම ක්‍රමය සම්පූර්ණයෙන් වැරදියි.වැරදි ක්‍රමවේද දිගටම පවත්වාගෙන යාම පිළිබඳ මුදල් කොමිෂන් සභාවේත්, භාණ්ඩාගාරයේත් අවධානය යොමු විය යුතුයි.

*ඒ අනුව මේ සැරෙත් මට එක්කෙනෙකුට ලක්ෂ 25 ක් දෙන්න වෙනවා. ඒ නිසා ඡන්දය දෙන කොට ඒ ගැනත් හිතන්න කියලා කියන්න ඕනෑ.*

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

බොහොම ස්තුතියි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, කෙසේ වුවත් රජයෙන් -

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ගිය පාර වගේ -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

*නැහැ. අපේ අයවැයේදී අපේ අයගේ ප්‍රශ්නයක් තිබුණේ නැහැ නේ? ඔයගොල්ලන්ගෙත් ප්‍රශ්නයක් තිබුණේ නැහැ. දැන් කොහොම වෙයිද දන්නේ නැහැ ඉතින්.*

ගරු සභාපතිතුමනි,කෙසේ වුවත්, රජයෙන් ලබාදෙන ප්‍රාග්ධන ප්‍රදානයන්ට වඩා වැඩි මුදලක් පළාත් සභා ආදායම්වලින් පළාත් සංවර්ධන සැලැස්ම යටතේ පසුගිය වර්ෂ ගණනාව පුරා වෙන් කිරීමට අපට හැකි වුණා. ඒ අනුව 2019 වර්ෂය සඳහා ද පළාත් සංවර්ධන සැලැස්ම යටතේ රුපියල් මිලියන 5,835 ක් ආයෝජනය කිරීමට අපේක්ෂා කරනවා.

අප මුහුණ දෙන ආර්ථික හා සමාජමය ගැටළු, ජනතාවගේ අපේක්ෂාවන්, රජයේ ආර්ථික ප්‍රතිපත්ති අපේ සැලසුම්වල කොටසක් කරගත යුතු වුවත්, වෙනත් පළාත්වලින් ජනගහනය සංක්‍රමණය වීම, අපද්‍රව්‍ය ජනනය සීඝ්‍රයෙන් ඉහළ යෑම, ජනප්‍රිය පාසල් සඳහා ළමුන් ඇතුළත් කිරීමේ තරගය, මත්ද්‍රව්‍ය සහ සමාජ විරෝධී කටයුතු ඉහළ යෑම,බෝවන සහ බෝ නොවන රෝගවල පැතිරීම වැනි අපේ පළාතට ආවේනික වූ සංවර්ධන අභියෝග ද සැලසුම් සකස් කිරීමේදී අවධානයට ගත යුතු කරුණු බවට පත්වෙලා.

පවතින යෝජනාවන්ට අමතරව සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීමේදී මෙකී කරුණු කෙරෙහි ද තමුන්නාන්සේලාගේ සැලකිල්ල යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් මා ඉල්ලා සිටිනවා.

**පළාත් පාලන සංවර්ධනය**

ගරු සභාපතිතුමනි**,**2017 සහ 2018 වර්ෂ පළාත් පාලන විෂයය සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභාව ඉමහත් අවදියෙන් යුතුව කටයුතු කළ වර්ෂ වශයෙන් හඳුන්වන්න පුළුවන්. 2018 වර්ෂයේ පමණක් පළාත් පාලන දෙපාර්තමේන්තුව යටතේ රුපියල් මිලියන 775 ක් වැයකොට ව්‍යාපෘති 1,006 ක් ක්‍රියාත්මක කරනවා. ඒ යටතේ මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 625 ක් ද, ප්‍රජාශාලා සඳහා රුපියල් මිලියන15 ක් ද, පළාත් පාලන සේවා ආයතන නවීකරණය සඳහා රුපියල් මිලියන 43 ක් ද, වෙනත් කාර්යයන් සඳහා රුපියල් මිලියන 92 ක් ද ආයෝජනය කෙරෙනවා.

මීට අමතරව බේලින් යන්ත්‍ර 19 ක් පළාත් පාලන ආයතන වෙත ලබා දුන් අතර ඒ සඳහා වැයකළ මුදල රුපියල් මිලියන 10.4 ක්. එම යන්ත්‍ර 19 ත් සමඟ පළාත් පාලන ආයතන සතුව පවතින මුළු බේලින් යන්ත්‍ර සංඛ්‍යාව 53 ක්. එම යන්ත්‍රවලින් බේල් ලෙස සකසන ලද පොලිතීන් මෙට්‍රික් ටොන් 500ක් පමණ වසරකට පුත්තලමේ පිහිටි සිමෙන්ති කම්හලට ලබා දෙනවා.

පළාත් පාලන ආයතනවල සමස්ත මහජන නියෝජිතයින් සංඛ්‍යාව 886 සිට 1,759 දක්වා වැඩි වෙලා.මෙම සියලු දෙනාගේත් සියලු සේවකයන්ගේත් වැටුප් සඳහා විශාල මුදලක් පළාත් සභාවෙන් වැය කරනවා. එම නිසා සිය ආදායම් එකතු කරගැනීමට ඔවුන් ප්‍රමාණවත් උනන්දුවක් දක්වන්නේ නැහැ.මේ වනවිට හිඟ වරිපනම් බදු ආදායම රුපියල් මිලියන 2,372 ක්.මේවා එකතු කර ගැනීමට ඉක්මන් වැඩ පිළිවෙලක් අනුගමනය කරන ලෙස සියලුපළාත් පාලන ආයතන වෙතින් මා ඉල්ලා සිටිනවා. දේපළ තක්සේරු කිරීම ද පළාත් පාලන ආයතන මුහුණ

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

දෙන ප්‍රබල ගැටළුවක්.වැඩි දේපළ සංඛ්‍යාවක් අවුරුදු ගණනාවක් තක්සේරු කර නැහැ.රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මෙම කාර්යය කළයුතු වුවත් එය ඉෂ්ය කර ගැනීම ඉතාම දුෂ්කර කාර්යයක් බවට පත් වෙලා. එයට පිළියමක් වශයෙන් පළාත් සභාවේ තක්සේරු දෙපාර්තමේන්තුවක් පිහිටුවීමට දැනටමත් කටයුතු කරලා අවසන්.කාර්ය මණ්ඩලයට අනුමැතිය ලැබූ විගස එය පිහිටුවීම අපේ බලාපොරොත්තුවයි. ඉන්පසු පළාත් පාලන ආයතනවලට දේපළ තත්සේරු කිරිම පිළිබඳ ගැටළුවක් මතුවන්නේ නැහැ. එය මෙම දෙපාර්තමේන්තුව යටතේ කරගන්න පුළුවන්.

සෑම වර්ෂයකම පළාත් පාලන ආයතන වෙනුවෙන් අපි විශාල මුදලක් වෙන් කරනවා.ඒ අනුව 2019 වර්ෂයට වෙන්කළ මුදල රුපියල් මිලියන 8,465 කි.

*අපි සියලුම පළාත් පාලන ආයතන අලුතින් පිහිටුවලා තිබෙන්නේ. අපි ඉදිරියේදී ඒ අය සම්බන්ධ කර ගෙන මේ සියවසට ගැළපෙන විධියට පළාත් පාලනය ශක්තිමත් කරන්න අවශ්‍ය පසුබිමක් යටතේ ක්‍රියා කරන්නටත් අපි අරමුණු කර ගෙන තිබෙනවා.*

**අපද්‍රව්‍ය කළමනාකරණය**

ගරු සභාපතිතුමනි,**බ**ස්නාහිර පළාත තුළ අවධානය යොමු කළයුතු ප්‍රබල කරුණක් තමයි අපද්‍රව්‍ය කළමනාකරණය. මා බලයට පත් වූ දා සිට මෙය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා.දිවයිනේ සමස්ත අපද්‍රව්‍යවලින් සියයට 60 ක් අපේ පළාත තුළ ජනනය වෙනවා. විශාල ජනතාවක් දෛනිකව අපේ පළාතට පැමිණෙන නිසා අනෙක් පළාත්වල අපද්‍රව්‍යයත් අපේ පළාතට කළමනාකරණය කරන්න සිදු වෙලා.

මෙහි තිබෙන ප්‍රධානම අභියෝගය තමයි පළාත් පාලන ආයතන මට්ටමින් කළමනාකරණය කරගත හැකි අපද්‍රව්‍ය අපහරණය සඳහා පොදු ව්‍යාපෘති ස්ථාපනය ප්‍රමාද වීම.මෙයට බස්නාහිර පළාතේ ජනතාවද වගකිව යුතුයි.1996 වර්ෂයේ සිට මේ දක්වා අපද්‍රව්‍ය ව්‍යාපෘති ස්ථාපනය කිරීමට විරුද්ධව පැවති පදනම් විරහිත විරෝධතා මෙයට ප්‍රධාන වශයෙන් බලපෑවා. 2011 වර්ෂයේ කඩුවෙල ප්‍රදේශයේ විදුලිය නිෂ්පාදනය කිරීමට කරනු ලැබූ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ඉඩ ලබා දුන්නේ නැහැ.

දැන් මේ තත්ත්වය යම් මට්ටමකින් වෙනස් වෙලා.රජයත් සමඟ එකතු වී ඍජු වැඩපිළිවෙළකට එළඹීම එයට හේතුවයි.කොළඹ දිස්ත්‍රික්කයේ එවැනි මහා පරිමාණ ව්‍යාපෘති තුනකට සහ ගම්පහ දිස්ත්‍රික්කයේ එක් ව්‍යාපෘතියක් සඳහා ගිවිසුම් අත්සන් කර තිබෙනවා.බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය මගින් මහා පරිමාණ ව්‍යාපෘතිවලට එක් විකල්ප ව්‍යාපෘතියක් වශයෙන් අරුවක්කාලු සනීපාරක්ෂක බිම් පිරවීම ක්‍රියාත්මක කරනවා.එහි ඉදි කිරීම් වැඩ මේ වනවිට සිදු කරමින් පවතින අතර පළමු අදියර මේ වර්ෂයේ අග භාගය වනවිට අවසන් කිරීමට නියමිතයි.එහි දිනකට මෙට්‍රික් ටොන් 600 ක් පමණ තැන්පත් කරන්න පුළුවන්.

ගරු සභාපතිතුමනි**,** කරදියාන පාලිත බිම් පිරවීම පිළිබඳවද යමක් සඳහන් කළ යුතුයි. කරදියාන බිම් පිරවීම දිගින් දිගටම විවෘත බිම් පිරවීමක් වශයෙන් පවත්වාගෙන යෑමට අපේ කිසිදු බලාපොරොත්තුවක් නැහැ.දිනකට මෙට්‍රික් ටොන් 500 ක්කළමනාකරණය කළහැකි විදුලිය ජනනය කිරීමේ ව්‍යාපෘතිය ඉදිරි වසර එකහමාර තුළ වැඩ අවසන් කර දැනට සිදු කරන විවෘත බැහැර වීම සම්පූර්ණයෙන් නතර කරනවා. මේ වනවිට කරදියාන බිම් පිරවීම පිළිබඳව පූර්ණ තාක්ෂණික අධ්‍යයනයක් විද්වත් මණ්ඩලයක් මගින් සිදු කරනවා. ඔවුන්ගේ නිර්දේශ අනුව බිම් පිරවීමේ ඉදිරි පරිසර ආරක්ෂණ කටයුතු සිදු කිරීම අපේ බලාපොරොත්තුවයි.

මේ වනවිට කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා යොමු කරන දිරන අපද්‍රව්‍ය ප්‍රමාණය මෙට්‍රික් ටොන් 258 ක්. අපද්‍රව්‍ය අධිකාරිය ඍජුවම මැදිහත් වී කරදියාන, පොහොරවත්ත සහ දික්ඔවිට කොම්පෝස්ට් නිෂ්පාදනය කරන අතර ඒවා *"මිහිසරු"* කොම්පෝස්ට් නමින් මාසිකව මෙට්‍රික් ටොන් 300 ක් 400 ක් අතර ප්‍රමාණයක් අලෙවි කරනවා. මින් සියයට 50 ක් පමණ මාලදිවයිනට සහ ඩුබායි රාජ්‍යවලට අපනයනය කරනවා.

පසුගිය මුදල් ප්‍රකාශය ඉදිරිපත් කරමින් මා ප්‍රකාශ කළ පරිදි *"මිහිසරු"* ක්ෂේත්‍ර පර්යේෂණ පුහුණු මධ්‍යස්ථානය රුපියල් මිලියන 160 ක් වැය කරමින් ඉදි කරමින් පවතින අතර ලබන වර්ෂය අවසන් වීමට පෙර එහි වැඩ කටයුතු අවසන් කර විවෘත කිරීම අපේ ඉලක්කය යි.

මෙම සියලු කාර්යයන් තවදුරටත් ඉදිරියට ක්‍රියාත්මක කිරීමට, අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු වෙනුවෙන් 2019 වර්ෂය සඳහා රුපියල් මිලියන47 ක් අපි වෙන් කරනවා.

*ඒ වාගේම ගරු සභාපතිතුමනි, විශේෂයෙන් මතක් ඕනෑ. මේ ගොඩනැගිල්ල විවෘත කිරීමත් සමඟ අපට විවිධ මට්ටමේ චෝදනා එල්ල වුණා. පසුගිය දවස්වල මාධ්‍යවලින් වැරදි මතයක් ප්‍රකාශ වුණා, පුවත්පත්වලින් දැක්වුවා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් කාරක සභාවට අපිව කැඳෙව්වා කියලා විශේෂයෙන්ම අපි කියන්න ඕනෑ. රාජ්‍ය ගිණුම් කාරක සභාවෙන් අපට සම්මාන 16 ක් ලැබුණා. 2018 සැප්තැම්බර් මස 05 වන දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම්කාරක සභාව විසින් රාජ්‍ය ආයතන ඇගයීම සඳහා පවත්වනු ලැබූ ජාතික සම්මාන ප්‍රදානෝත්සවයේදී රාජ්‍ය ආයතනවල මූල්‍ය කාර්ය සාධනය ඇගයීමේදී බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශය හා සීතාවක ප්‍රාදේශීය සභාව රන් සම්මානයෙන් ද, මිනුවන්ගොඩ නගර සභාව හා මදුරාවල ප්‍රාදේශීය සභාව රිදී සම්මානයෙන් ද, පළාත් භාණ්ඩාගාරය, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය සහ පළාත් පාලන ආයතන 10 ක්, අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය ද සහතික පත් ප්‍රදානයක් ලබා ගැනීම, අපේ අධිකාරියට ලැබීම අපට මහත් ආඩම්බරයක්. ඒකෙන් පැහැදිලි වෙනවා, අපේ විගණන විමසුම් පිළිබඳව මාධ්‍ය විසින් ජනගත කරන්න යෙදුණු කාරණා වැරදි බව, මා විසින් හැම වෙලාවේම කියූ පරිදි මාධ්‍ය හැම විටම පළාත් සභා සම්බන්ධයෙන් මතු කරපු කාරණා වැරදියි කියන කාරණාවත්, මේ අපි ලබපු ජයග්‍රහණයන් එක්ක ඔප්පු වෙනවාය කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.*

## විදුලිබල හා බලශක්ති

ගරු සභාපතිතුමනි,බස්නාහිර පළාතේ හැර අනෙකුත් සියලු පළාත්වල විදුලි පාරිභෝජනයෙන් වැඩි ප්‍රමාණයක් ගෘහස්ථ පාරිභෝජනය යි.බස්නාහිර පළාතේ එම තත්ත්වය වෙනස්.ගෘහස්ථ පරිභෝජනයට වඩා වාණිජමය හා කාර්මික කටයුතු සඳහා විදුලි පාරිභෝජනය වැඩියි.

2017 වර්ෂය අවසන් වනවිට රටේ සමස්ත ජනගහනයෙන් සියයට 99කට විදුලි සම්බන්ධතා පවතින අතර බස්නාහිර පළාතේ එය සියයට සියයකට ආසන්නයි.

මහා මාර්ග සහ අතුරු මාර්ග පුළුල් කිරීමේදී විදුලි කණු විතැන් කිරීමටත් අළුතින් ඇතිවන නිවාසවලට විදුලිය සැපයීමේදී අඩු විදුලි ධාරිතාව වැඩි කිරීම සඳහාත්, එකලා විදුලි මාර්ග තෙකලා කිරීම සඳහාත් සහ තෙකලා මාර්ග දීර්ඝ කිරීම සඳහාත්, පළාත් සභාව යටතේ ප්‍රතිපාදන සලසනවා.

නෙට් මීටර් ක්‍රමය යටතේ පළාත් පාලන ආයතන දෙකක සූර්ය බල විදුලි පද්ධති ස්ථාපනය කිරීම සඳහා ප්‍රතිපාදන මෙම වර්ෂයේ ලබා දී ඇති අතර 2019 වර්ෂයේදී ද මෙම කාර්යය සඳහා මුදල් ප්‍රකාශය යටතේ ප්‍රතිපාදන සලසනවා.

## සංචාරක කටයුතු

ගරු සභාපතිතුමනි,රජය විසින් සංචාරක ප්‍රජා සහභාගීත්වය වර්ධනය කිරීම සහ සංචාරක කර්මාන්තයේ විවිධාංගීකරණය අරමුණු කරගෙන විශේෂිත සංචරණයන් හඳුන්වා දීම ඉතා වැදගත්.ඒ අතරින් ආගමික සංචරණය, විශ්මය ජනන සංචරණය, විවාහ මංගල සංචරණය, ආයුර්වේද සංචරණය, ව්‍යාපාරික සංචරණය ප්‍රමුඛ අංශයන්.

ජාතික සංචාරක ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පළාතක් වශයෙන් අපෙන් ඉටුවිය යුතු වගකීම් හා යුතුකම් රාශියක් තිබෙනවා.බස්නාහිර පළාත කේන්ද්‍ර කරගෙන සංවර්ධනයවන යටිතල පහසුකම් මගින් සහ කොළඹ නගරයේ ඉදිවෙමින් පවතින ලෝකයේ ප්‍රධාන ජාල සංචාරක හෝටල් හරහා බස්නාහිර පළාතට විශාල ප්‍රතිලාභ ගන්න පුළුවන්.

බස්නාහිර පළාත සංචාරක කළාප දොළහකට බෙදා ඇති අතර ඊට අනුකූලව හඳුනාගන්නා ලද ප්‍රමුඛ පරාස තුනක් යටතේ 2018 වර්ෂයේ ව්‍යාපෘති 33 ක් සඳහා රුපියල් මිලියන 56.4 ක් ආයෝජනය කර තිබෙනවා.

විශේෂ පුහුණු චාරිකා සංවර්ධන වැඩසටහන යටතේ සංචාරක මාර්ගෝපදේශකයින් 24 දෙනෙකු පුහුණු කර 2018 වර්ෂයේ බලපත්‍ර ලබා දී ඇති අතර පුහුණු කරනු ලැබූ කුලී රථ රියදුරන් ගණන 35 ක්.සංචාරක ක්ෂේත්‍රයේ ඍජු රැකියා සඳහා වැඩසටහන් තුනක් පවත්වා රැකියා ගතකළ පිරිස 100 ක් වන අතර 2018 වර්ෂයේ දැනටමත් 139 දෙනෙක් රැකියා ගතකර අවසන්.

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

ගමනාන්තයන්හි දර්ශනීයභාවය හා තොරතුරු සංචාරකයන් හට ලබා දීම සඳහා *"Our West"* නමින් *"Coffee Table"* වර්ගයේ ග්‍රන්ථයක් පළකල අතර, සංචාරක ගමනාන්ත පිළිබඳ ත්‍රෛභාෂික අත්පොත් තුනක් ද දිස්ත්‍රික් තුන පදනම් කර නිර්මාණය කිරීම 2019 වර්ෂයේ ඉලක්කය යි.මෙකී කටයුතු සඳහා සංචාරක අංශය වෙනුවෙන් රුපියල් මිලියන 24 ක ප්‍රතිපාදන ලබන වර්ෂයට වෙන් කරනවා.

*විශේෂයෙන්ම සංචාරක අමාත්‍යාංශය මා භාර ගන්නා විට බස්නාහිර පළාතට පිටින් තිබුණු පෞද්ගලික ආයතනයක් වගේ තිබුණේ. අද පළාත් සභාවේ ආයතනයක් වශයෙන් අපි ඒක ශක්තිමත් කරලා පළාතේ සංවර්ණයට අවශ්‍ය කටයුතු සිද්ධ කරලා තිබෙනවාය කියන එකත් මේ අවස්ථාවේදී මම මතක් කරන්න කැමැතියි.*

### ආර්ථික ප්‍රවර්ධන කටයුතු

ගරු සභාපතිතුමනි,ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය මගින් පවත්වා ගෙන යනු ලබන වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය, වෙස්ප්‍රෝ මුද්‍රණාලය සහ වෙස්ප්‍රෝ කාර්යාල පරිශ්‍ර ආශ්‍රිත සෞඛ්‍යාරක්ෂක සේවය ඉදිරි පස් වසර තුළ සැලසුම් සහගතව ප්‍රවර්ධනය කිරීම එහි මූලික ඉලක්කය යි. පළාතේ රාජ්‍ය ආයතන සඳහා ඉහළ ගුණාත්මක සේවයක් සපයමින් වෙස්ප්‍රෝ ආරක්ෂක සේවය රඳවා ගෙන සිටින කීර්තිනාමය අනෙක් ආයතන දෙක ද ළඟාකර ගත යුතුයි. මෙහිදී වෙස්ප්‍රෝ මුද්‍රණාලය පිළිබඳව මා විශේෂයෙන් යමක් කිව යුතුයි.එහි මුද්‍රණ පිරිවැය වැඩියි යන්න බොහෝ දෙනෙකුගේ විවේචනය යි. සමහර යන්ත්‍ර නොතිබීමත්, එම කාර්යයන් පිටින් ගාස්තු ගෙවා කරවා ගැනීමට සිදුවීමත් මෙම පිරිවැය වැඩි වීමට හේතුවයි.අවශ්‍ය සියලු යන්ත්‍ර හා උපකරණ දැනට ඇණවුම් කර ඇති අතරඒ සඳහා වැය කරන මුදල රුපියල් මිලියන 95.7 ක්.මෙම යන්ත්‍ර ලබාගත් පසු ලබන වර්ෂයේ සිට අඩු පිරිවැයකට ඉහළ ගුණත්වයෙන් යුතු සේවාවක් සැපයීමට හැකි වේ යැයි මා විශ්වාස කරනවා.

*ඒ වාගේම විශේෂයෙන් අපි මතක් කරන්න ඕනැ. මේ ගොඩනැගිල්ලේ ආරක්ෂක සේවය ඇතුළු විශාල කාර්යයන් ප්‍රමාණයක් මේ ආර්ථික ප්‍රවර්ධන අංශය හරහා ක්‍රියාත්මක කිරීම තුළින් පිටට යන්න ගිය මුදලක් අපටම ලබා ගන්න පුළුවන් වුණාය කියන එකත් මේ අවස්ථාවේදී මම මතක් කරන්න ඕනැ.*

2018 වර්ෂයේ මෙම ආයතන තුන රුපියල් මිලියන 397.34 ක ආදායමක් ඉපයීමට අපේක්ෂා කළ අතර මේ වනවිටත් උපයා ඇති ආදායම රුපියල් මිලියන 201.79 ක්. ආදායමටත් වඩා වැදගත් වන්නේ මේ තුළින් ජනිත වන රැකියා ප්‍රමාණය යි.දැනට 920 දෙනෙකු රැකියා කරන අතර 2019 වර්ෂය වනවිට 1030 දෙනෙකුට රැකියා ලබා දීමට අපි අපේක්ෂා කරනවා. රැකියා උත්පාදනයත් සමග වැදගත්වන තවත් කරුණක් තිබෙනවා. එනම් රජයේ රෙගුලාසි අනුව ඔවුන්ට හිමිවිය යුතු නියම වැටුප් හා දීමනා ඔවුන්ට ලබා දීමයි.

### ජල සම්පාදනය

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත තුළ සියයට 99 කට ආරක්ෂිත පානීය ජලය සඳහා ප්‍රවේශයන් පවතින අතර ඉන් සියයට 62.5 කට පානීය නළජල පහසුවත් පවතිනවා. මුළු ජල අවශ්‍යතාවයෙන් සියයට 70 කට වැඩි ප්‍රමාණයක් ගෘහස්ථ පාරිභෝජනය යි. වර්තමානයේ ගෘහස්ථ ජල අවශ්‍යතාවය වර්ධනය වෙමින් පවතින අතර පානීය ජලයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අපතේ යෑම ද ප්‍රබල ගැටළුවක්.ඒ වගේම ආදායම් නුපදවන ජල සැපයුම ද වඩාත් හොඳින් කළමනාකරණය කිරීමේ වැදගත්කම ඉහළ යමින් පවතිනවා.එය සමස්ත දිවයිනේ සියයට 25.2 ක් වනවිට කොළඹ නගරයේ සියයට 43.1 ක්.

අප පළාතේ විශාල ජල ඌණතාවය පැවතියේ කටාන ප්‍රදේශයේ.පසුගිය කාලය තුළ දිගටම බවුසර් මගින් ජලය සැපයීමට සිදුවුණා.දැනට රජය මගින් මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන අතර එම ප්‍රදේශයේ ජල ගැටළුව එමගින් විසඳේ යැයි අපි බලාපොරොත්තු වෙනවා.

පළාත් සභාවක් වශයෙන් ජල සම්පාදනය සඳහා අප වෙන් කරන මුදල ප්‍රමාණවත් නොවුනත් 2018 වර්ෂයේ රුපියල් මිලියන 25.8 ක් වෙන්කර තිබූ අතර 2019 වර්ෂය සඳහා ඊට වැඩි ප්‍රතිපාදන මුදලක් වෙන් කිරීමට බලාපොරොත්තු වෙනවා.

## පරිසර කටයුතු සහ ආපදා කළමනාකරණය

ගරු සභාපතිතුමනි**,**බස්නාහිර පළාත, ශ්‍රී ලංකාවේ වැඩිම ජනගහනයක් කේන්ද්‍රගතව සිටින පළාතයි. පළාත වෙත සිදුවන ජනගහනයේ සංක්‍රමණය පරිසරය කෙරෙහි විවිධ බලපෑම් ඇති වීමට හේතු වෙලා.වනාන්තර විනාශ වීම්, ගංවතුර තත්ත්වයන්, කෘෂි රසායන ද්‍රව්‍ය සහ කාර්මික ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් ජලයේ සහ පසෙහි ගුණාත්මකභාවය අඩුවීම, ජෛව විවිධත්වය විනාශ වීම, වායු දූෂණය වැනි හේතු නිසා පාරිසරක පද්ධතිය බිඳ වැටෙනවා. සමහර බලපෑම්වලට ප්‍රතිකර්ම සෙවීම ද ඉතා අපහසු කාර්යයක්.

අත්තනගලු ඔය හා කැළණි ගඟ පළාතේ ප්‍රජාවට, ජලජ ජීවීන්ට සහ අනෙකුත් සත්ත්ව හා ශාක ප්‍රජාවට ඉතා වැදගත්.මානව ක්‍රියාකාරකම් හේතුවෙන් මෙය දූෂණයට ලක්වන බව දැනගත් පසු ගරු මන්ත්‍රීතුමන්ලා, විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන්, රාජ්‍යනොවන ආයතන සහ පළාත් පාලන ආයතන සම්බන්ධ කරගෙන වැඩමුළු දෙකක් පැවැත්වූවා. එහි වාර්තාව දැනට සකස් කරමින් පවතින අතර ලබන වර්ෂයේදී එහි නිර්දේශ පරිදි අවශ්‍ය කටයුතු කරනවා. ඊට අමතරව එම වැඩමුළුවල තීරණය පරිදි අත්තනගලු ඔය දෙපස කුඹුක් පැළ 500 ක් අපි විසින් දැනටමත් රෝපණය කරලා අවසන්.

ස්වාභාවික විපත් සිදුවීමේ ලෝක අවදානම් දර්ශකයේ (World Risk Index) රටවල් 171 ක් අතරින් ලංකාව ඉන්නේ 63 වන ස්ථානයේ.ස්ථානය අඩුවන විට අවදානම් මට්ටම ඉහළ යෑම මෙම දර්ශකයේ මූලික හරයයි.ඉන්දියාව, පකිස්ථානය සහ නේපාලය පිළිවෙලින් 75,73 සහ 107 වන ස්ථාන වල රැඳී සිටිනවා.මින් පෙනෙන්නේ කළාපීය සම මට්ටමේ රටවල් සමඟ සැසඳීමේදී ශ්‍රී ලංකාව ඉහළ ආපදා අවදානම් මට්ටමක පවතින බවයි. රටතුළ පවතින දුර්වලතා, ආපදාවලට සාර්ථකව මුහුණ දීමේ හැකියාව සහ ඒවාට අනුවර්තනය වීමට ඇති හැකියාව ආපදා කළමනාකරණයේදී ඉතා වැදගත්. ආපදාවලට සාර්ථකව මුහුණ දීමේ හැකියාව අතින් ශ්‍රී ලංකාව ඉන්නේ ඉතා අඩු මට්ටමකයි. ඒ නිසා සුළු ආපදා තත්ත්වයකදී වුවද විශාල ගණනක් මිය යන අතර විශාල දේපළ ප්‍රමාණයකට හානි සිදු වෙනවා. බස්නාහිර පළාතට ද මෙම තත්ත්වය පොදුයි. එමනිසා ආපදාවලට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කිරීමට සහ යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම සඳහා ලබන වර්ෂය තුළ අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමට මා බලාපොරොත්තු වෙනවා.

*ඒ අනුව අපි පසුගිය දවස්වල විශේෂයෙන්ම සුළු වැස්සකදී පවා ගං වතුර තර්ජනයට පත් වන ප්‍රදේශ වලට අවශ්‍ය අඟුළු, බෝට්ටු සහ අවශ්‍ය උපකරණවලට අපි ප්‍රතිපාදන වෙන් කරලා පළාත් පාලන ආයතනවලට ලබා දුන්නාය කියන එකත් අපි මේ අවස්ථාවේදී සිහිපත් කරනවා.*

## අධ්‍යාපනය

ගරු සභාපතිතුමනි,2018 වර්ෂය බස්නාහිර පළාතේ අධ්‍යාපන ක්ෂේත්‍රයට සුවිශේෂ වර්ෂයක්. *ඔන්න දැක්කද තාක්ෂණය.* 2018 වර්ෂය බස්නාහිර පළාතේ අධ්‍යාපන ක්ෂේත්‍රයට සුවිශේෂ වර්ෂයක්. පුනරාවර්තනප්‍රතිපාදන හැර පළාත් සභා ඉතිහාසයේ පාසල් සංවර්ධනය වෙනුවෙන් වැඩිම මුදලක් වෙන්කළ වර්ෂය මෙම වර්ෂය යි. මුදල් ප්‍රකාශය යටතේ අධ්‍යාපන සංවර්ධනය වෙනුවෙන් රුපියල් මිලියන 708 ක් වෙන් කළා. පරිපූරක ඇස්තමේන්තු එක සහ දෙක යටතේ වෙන්කළ මුදල රුපියල් මිලියන 2,747 ක්. පාසල් ඩෙස් සහ පුටු ලබා ගැනීම සඳහා රුපියල් මිලියන 150 ක් වෙන් කළා. "*ළඟම පාසල හොඳම පාසල*" යටතේ රුපියල් මිලියන 4,000 ක් වෙන් කරලා, රුපියල් මිලියන 1,264 ක දැනටමත් වැඩ අවසන් කර තිබෙනවා. මීට අමතරව ගරු මන්ත්‍රීතුමන්ලා ද තමන්ට වෙන්වන උපමාන පාදක ප්‍රතිපාදන යටතේ මුදල් වෙන් කරනවා.එම මුදල් හැර වුවද රුපියල් මිලියන 7,455 කට ආසන්න මුදලක් අධ්‍යාපනයට වෙන්කළ වෙනත් වර්ෂයක් ඇතැයි මා විශ්වාස කරන්නේ නැහැ.

ජනප්‍රිය පාසල් යැයි කියා ගන්නා පාසල්වලට ඇති ඉල්ලුම ඊට අදාළ සියලුම පාර්ශවකරුවන්ට ගැටළු නිර්මාණය කරලා.මෙම සංකල්පය ඇති වෙලා තියෙන්නේ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය අතින් නොවෙයි.භෞතික සම්පත්වලින්. බස්නාහිර පළාතේ රජයේ පාසල්වල ඉන්න ගුරුවරු 45,825 කින් 45,366 ක්, එනම් සියයට 99 ක් උපාධිධාරී හෝ පුහුණු ගුරුවරු.එයින් අදහස් වෙන්නේ සෑම පාසලකම සේවය කරන්නේ උපාධිධාරී හෝ පුහුණු ගුරුවරු යන්නයි. එසේනම් මෙම ජනප්‍රිය පාසල් සංකල්පය ඇතිවෙලා තියෙන්නේ කෙසේද?භෞතික සම්පත්වල පවතින විෂමතාවය එයට හේතුවයි. එම නිසා මෙම වර්ෂයේ අපි මේසා විශාල මුදලක් වියදම් කරන්නේ මෙම භෞතික සම්පත්වල විෂමතාවය අවම කරන්නයි. 2019 වර්ෂයට ද, පරිපූරක එක හා දෙකෙන් හඳුන්වා දුන් ව්‍යාපෘති නිම

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

කරන්න රුපියල් මිලියන 1,500 ක් සහ අනෙකුත් ව්‍යාපෘති වෙනුවෙන් රුපියල් මිලියන 954 ක් වශයෙන් රුපියල් මිලියන 2,454 ක් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරනවා. ඊට අමතරව "*ළඟම පාසල හොඳම පාසල*" යටතේ වෙන් කරන මුදල රුපියල් මිලියන 3,500 ක්.

දිවයින පුරා පාසල් 150 ක ඩිජිටල් උපාංග සහිත සුහුරු පන්ති කාමර (Smart Class Room) 300 ක් ස්ථාපිත කිරීමට රජය සැලසුම් කර තිබෙනවා. එම රාජ්‍ය ප්‍රතිපත්තියට අනුගත වෙමින් සෑම කලාපයකටම 10 බැගින් සුහුරු පන්ති කාමර 110 ක් පළාත තුළ ස්ථාපිත කිරීම අපේ සැලැස්මයි. මෙම පන්ති කාමරයකට සුහුරු අන්තර් ක්‍රියාකාරී එලකය (Interactive Display) යන උපාංගයද ඇතුළත්.එය පරිගණක යන්ත්‍රයක් වාගේම ඩිජිටල් වයිට් බෝඩ් එකක් වශයෙන් ද භාවිතා කළ හැකි උපාංගයක්.එහි වින්ඩෝස් සහ ඇන්ඩ්‍රොයිඩ් යන පහසුකම් දෙකම තිබෙනවා.එමගින් තමයි දරුවන්ට ඩිජිටල් ක්‍රමවේද කියා දෙන්නේ. *අර පසුගිය දවස්වල අපට ගැහුවේ අඩි අටේ ටීවී හයි කරලා කියලා. ඒ වාගේ ඒවා ඉස්කෝල 110 කටත් අපි දීලා තිබෙනවා.* එසේ නොමැතිව එය අඩි 8 ක රූපවාහිනී යන්ත්‍රයක් නෙමෙයි. නවීන තාක්ෂණය යොදා ගනිමින් අධ්‍යාපනය ලබා දීමට අපේ ගුරුවරුන් ද පුහුණු කළ යුතුයි. ඒ සඳහා ගුරුවරු සූදානම් කිරීම අපි ආරම්භ කළේ මේ වර්ෂයේ මුල සිටයි. ඒ සඳහා ගුරුවරුන්ගේ තොරතුරු තාක්ෂණ හැකියාව මැන බැලීමේ සමීක්ෂණයක් ද පැවැත්වූවා. ඒ අනුව අපේක්ෂිත පරිසාධන මට්ටමට ළඟා නොවූ ගුරුවරුන් 1,500 ක් හඳුනාගෙන ඔවුන්ට දින 3 ක පුහුණුවක් ද ලබා දී තිබෙනවා.

පාසල් සහභාගීත්ව අනුපාතය ඉහළ නැංවීමට මෙන්ම ශ්‍රම වෙළෙඳපොළ තුළ පවතින අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රය සකස් කිරීම සඳහා වසර 13 ක අනිවාර්යය අධ්‍යාපනයක් ලබා දීමේ ප්‍රතිපත්තියක් රජය විසින් ආරම්භ කර තිබෙනවා. පාසලට ඇතුළත් වන සෑම දරුවෙක්ම, ඔහු සාමාන්‍ය පෙළ සමත් වුවත්, අසමත් වුවත්, වසර 13ක් පාසලේ රඳවා ගනිමින් වෘත්තීය විෂයයන් 26 ක් යටතේ තමා කැමති විෂයයන් තෝරාගෙන වැඩ ලෝකයට ප්‍රවිශ්ට වීමට හෝ උසස් අධ්‍යාපනයට යොමු වීමට මෙමගින් අවස්ථාව සැලසෙනවා.දැනට පළාතේ පාසල් 29 ක මෙය ආරම්භ කරලා. 2019 වසර අවසාන වනවිට පාසල් 58 ක මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර, එයට අවශ්‍ය වෘත්තීය විෂයයන්වලට අදාළ උපාධිධාරී ගුරුවරුන් 104 දෙනෙකු බඳවා ගෙන මේ වනවිටත් පාසල්වලට අනුයුක්ත කරලා අවසන්.

බස්නාහිර පළාතේ රජය අනුමත පෞද්ගලික පාසල් 48 ක් සහ පිරිවෙන් 148 ක් තිබෙනවා. පසුගිය කාලයේ පෞද්ගලික පාසල්වලට ඇතුළත්වන ශිෂ්‍ය සංඛ්‍යාව ක්‍රමයෙන් ඉහළ ගියත්, පිරිවෙන් අධ්‍යාපනයට යොමුවන සිසුන් සංඛ්‍යාව අඩුවෙලා. 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ පෞද්ගලික පාසල්වලට යොමුවන සංඛ්‍යාව සියයට 1.6කින් වර්ධනය වනවිට, පිරිවෙන් අධ්‍යාපනයට යොමුවන ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 6.3 කින් අඩුවීම එතරම් හොඳ තත්ත්වයක් නොවෙයි. මෙය අධ්‍යාපන බලධාරීන්ගේ විශේෂ අවධානය යොමු විය යුතු කරුණක්. දරුවා ආගම දහමින් ඈත්වන කරුණ වගේම, පෞද්ගලික පාසල්වල ගුණාත්මකභාවය පිළිබඳ කරුණ ද සොයා බැලිය යුතුයි.

ගරු සභාපතිතුමනි, 2019 අයවැයට විශේෂ යෝජනා වශයෙන් පළාතේ දිස්ත්‍රික්ක තුනෙහි පාසල් තුනක් තෝරා ගෙන ඒවා උසස් මට්ටමකට පත් කිරීමට මා බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා කොළඹ දිස්ත්‍රික්කයෙන් තෝරාගත් විද්‍යාලය නාරාහේන්පිට ශ්‍රී පරාක්‍රමබාහු විද්‍යාලය යි. මෙය 1947 වර්ෂයේ ආරම්භ කළ පාසලක්. අක්කර 4 කට ආසන්න භූමි ප්‍රමාණයක් තිබෙනවා.වර්තමානයේ සිසුන් ඉන්නේ 165 ක් පමණයි. *අර ඒ දවස්වල මට ගැහුවේ රාහුලේ හදනවා කියලා. ළමයි 100 ක පාසලක්.* මෙය දියුණු කළහොත් අවට පාසල් තදබදය ද අඩු කරන්න පුළුවන්. මේ ආකාරයට අනෙක් දිස්ත්‍රික්ක දෙකෙහි ද පාසල් දෙකක් තෝරාගෙන ඒවා අංගසම්පූර්ණ පාසල් බවට පත් කිරීම අපේ අරමුණයි.

ගරු සභාපතිතුමනි, පළාතේ ජනතාවටත්, විශේෂයෙන් ගරු මන්ත්‍රීතුමන්ලාටත් හිසරදයක්ව පැවති අධ්‍යාපන අමාත්‍යාංශය සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුව දුරස්ථ ස්ථාන දෙකක පැවතීම, අධ්‍යාපන දෙපාර්තමේන්තුව "*රන්මගපාය*"ගොඩනැගිල්ලට ගෙන ඒමත් සමඟ අවසන් වී ඇතැයි මා විශ්වාස කරනවා. ගරු ආනන්ද කුමාරස්වාමි ශ්‍රීමතාණන් අධ්‍යාපන කාර්යයන් සඳහා පවරා දී ඇති ග්‍රීන්පාත් ගොඩනැගිල්ලේ අධ්‍යාපන පර්යේෂණ හා සංවර්ධන ඒකකයක් පිහිටුවීම අපේ සැලැස්මයි.ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ද ඉදිරියේදී වෙන් කරනු ලබනවා.

අතීත සෑම වර්ෂයකම වගේ රුපියල් මිලියන 31,033 ක් වෙන් කරමින් ලබන වර්ෂයට ද අධ්‍යාපනය වෙනුවෙන් වැඩිම මුදලක් වෙන් කරනවා. එය මෙම වර්ෂයට වෙන් කළ මුදලට වඩා සියයට 11 ක වැඩිවීමක්.

*අපි කොයි තරම් බස්නාහිර පළාතේ කථා කළත් අධ්‍යාපනයේ මානව හා භෞතික, සම්පත්වල ඌණතාවයන් තිබෙනවා. අපි ඒවා හඳුනාගෙන තිබෙනවා. ඒ අනුව තමයි අපි මාදිවෙල රාහුලෙත් සම්පූර්ණ දරුවන්ට අවශ්‍ය අධ්‍යාපන හා බාහිර ක්‍රියාකාරකම්වලට අවශ්‍ය පසුබිමක් සකස් කළේ. ඒ අනුව තමයි ජාත්‍යන්තර මට්ටමේ - දැන් අපි මාදිවෙල රාහුලේ ඉදි කරන පිහිනුම් තටාකය ඔලිම්පික් ක්‍රීඩා තරගයකට යන මට්ටමේ පිහිනුම් තටාංගනයක්. ඒ වාගේම ජාත්‍යන්තර මට්ටමේ වොලිබෝල් ක්‍රීඩා පිටියක් නැහැ. මීටර් 400 සියලු පහසුකම් සහිත ක්‍රීඩා පිටියක් නැහැ. ඒ නිසා මම හිතන්නේ, අර මාදිවල රාහුලේ අපි හදනවා වාගේම දිස්ත්‍රික් තුනේත් අපි එවැනි පහසුකම් ඇති කරන්න ඕනෑ කියන එකයි මම යෝජනා කරන්නේ. ඒ වාගේම විශේෂයෙන්ම අපේ පළාත් සභා පාසල්වල ඉන්න අහිංසක දුප්පත් දරුවන්ට තිබෙන ලොකුම අභියෝගය තමයි ඉංග්‍රීසි භාෂාව හා දෙමළ භාෂාව. මම විශ්වාස කරන්නේ නැහැ, ඒක පාසලේ පන්ති කාමරයෙන් පමණක් උගන්වන්න පුළුවන් කියලා. මම හිතනවා, ඒ සඳහා අපි සුදුසු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑය කියලා. ඒ නිසා ඒ සඳහා අපට ව්‍යාපෘති ක්‍රියාත්මක කළ හැකියි. ඉදිරියේදී අධ්‍යාපන බලධාරීන් එක්ක සාකච්ඡා කරලා කරන්න බලාපොරොත්තු වන බවත් මම මේ අවස්ථාවේදී සිහි ගන්වනවා.*

**සංස්කෘතිය සහ කලාව**

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත කියන්නේ ලංකාවේ දියුණුම පළාත බව ඔබ අපි කවුරුත් දන්නවා. ඒ වාගේම වැඩිම ජනාකීර්ණ මෙන්ම වැඩිම කාර්යබහුල ජීවන රටාවක් ගෙවන ජනතාවක් ජීවත් වෙන්නේත් මේ පළාතේමයි. ඒ නිසා ඔවුන් දිනෙන් දින යාන්ත්‍රික මිනිසුන් බවට නිරායාසයෙන් පත්වෙනවා. මෙකෙන් මිදෙන්න මිනිසුන්ට සංස්කෘතිය සහ කලාව ඉතාම අත්‍යවශ්‍ය කරුණක්.මනසට විවේකයක් ලබාදීම අරමුණු කරගෙන විවිධ රසවින්දන වැඩසටහන් පැවැත්වීම අවශ්‍ය වුවත්, එම කාර්යය ප්‍රමාණවත් අයුරින් කෙරෙන්නේ ද යන්න පිළිබඳව අපේ අවධානය යොමු විය යුතුයි.රූපවාහිනී නාලිකා මගින් ද ප්‍රමිතියකට අනුව එම කාර්යය සිදුවන්නේ නැහැ.එම නිසා ලබන වර්ෂයේදී පළාතේ විවිධ ස්ථානවල වරින්වර රසවින්දන වැඩසටහන් පැවැත්වීමට මා යෝජනා කරන අතර ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ද මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනවා.

*ඒ වාගේම ගරු සභාපතිතුමනි, ගරු අධ්‍යාපන ඇමතිතුමනි, මා විසින් ප්‍රතිපාදන වෙන් කර අපේ කලාපයේ පාසල් අතර මෙවැනිම විශේෂඥයන් ලවා කරන ලද පාසල් රසවින්දන වැඩ සටහන මම හිතන්නේ අද ජනප්‍රිය වැඩ සටහනක් බවට පත් වෙලා තිබෙනවා. මේ වැඩ සටහන නරඹපු විශ්ව විද්‍යාල ආචාර්යවරු සහ අධ්‍යාපනය සම්බන්ධ ඉන්න අය පෞද්ගලිකව මට දුරකථනයෙන් කථා කරලා ස්තුති කළා. මම කවදාවත් දේශපාලඥයෙකුව අගය කරන්නේ නැහැ. නමුත් ඔබතුමාගේ ඒ වැඩ සටහන මම දැක්කා. ඒක දැක්කාම මට ආස හිතුනා. ඒක හොඳ වැඩ සටහනක්. මේක දිගටම ක්‍රියාත්මක කරන්න කියලා එක මහාචාර්යවරයෙක් සහ ආචාර්යවරු කිහිප දෙනෙක් මාත් එක්ක මේ සම්බන්ධයෙන් කථා කළා. ඒකත් මම මේ අවස්ථාවේදී අවධානය යොමු කරනවා.*

වාර්ෂික පෙරහැරවල්, ගම්මඩු, දෙවොල් මඩු, පාස්කු නාට්‍ය, රාමසාන් උත්සව වැනි සංස්කෘතික උත්සව සඳහා ජාතිභේදයකින් තොරව ආධාර ලබා දෙනවා.ඒ වගේම දහම් පාසල් ත්‍යාග ප්‍රදානෝත්සව, වෙස් මංගල්‍යයන්, කළඑළි මංගල්‍යයන්, ප්‍රදර්ශන, වැඩමුළු වැනි සංස්කෘතික අංග රාශියක් සඳහාත් බහුතරයක් අපෙන් ආධාර ලබා ගන්නවා.මෙම වර්ෂයේ වාගේම ලබන වර්ෂයට ද ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනවා.

සංස්කෘතික අංශයෙන් සහ කලාවෙන් මිනිසුන් අපරාධවලට සහ නරකට යොමුවීම වළක්වා ගන්න පුළුවන්. සංස්කෘතික දෙපාර්තමේන්තුව ඒ කෙරෙහි ද අවධානය යොමු කළ යුතුයි.පසුගිය වර්ෂයේ සිර මැදිරිවල සිටි සිරකරුවන් 22,833 කින් 12,709 දෙනෙක් එනම් සියයට 55 ක් බස්නාහිර පළාතේ අයයි.කලාව මගින් මින් කිහිපදෙනෙකු හෝ යහමගට යොමු කරවා ගැනීමට හැකි වූයේ නම් එය ඉතා වැදගත් දෙයක් හැටියට මා දකිනවා.

2019 වර්ෂයට සංස්කෘතික කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 64 ක් වෙන් කරන අතර එය පසුගිය වර්ෂයේ වෙන්කළ මුදලට වඩා සියයට 10ක වැඩි වීමක්.

**ක්‍රීඩා කටයුතු**

ගරු සභාපතිතුමනි, 2015, 2016 වර්ෂවලදී මෙන් 2017 වර්ෂයේදී ද අප පළාතේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික මහා ක්‍රීඩා උළෙලේදී සමස්ත ශූරතාවය දිනා ගනිමින් 2018 දීත් ගත්තා නේ? නේද?2015, 2016, 2017 හා 2018. පළාතේ ගෞරවය ආරක්ෂා කිරීමටසමත් වී තිබෙනවා. ඒ අනුව එහිදී රන් පදක්කම් 102 ක්, රිදී පදක්කම් 81 ක් සහ ලෝකඩ පදක්කම් 76 ක් වශයෙන් දිනාගත් සමස්ත පදක්කම් සංඛ්‍යාව 259 ක්.

මෙම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට උපහාර පිදීම ජාතික වගකීමක් සේ සලකා රුපියල් මිලියන 18 කට අධික මුදලක් වියදම් කරමින් උපහාර උළෙලක් පැවැත්වූ අතර එහිදී ක්‍රීඩකයින් 1,200 ක් පමණ උපහාර ලැබුවා. ක්‍රීඩකයෙකුට ජීවිතයේ එක්වරක් පමණක් ලබාදෙන විශේෂිත සම්මානයක් සමඟ රුපියල් ලක්ෂයක් ලබා දීම අගය කළයුතු කරුණක් සේ මා දකිනවා. පෙර වර්ෂවල මෙවැනි කාර්යයන් කර තිබුණේ නැහැ.වෙනත් පළාත් සභාවල නොමැති ක්‍රීඩා විද්‍යායතනයක් අප පළාතේ තිබෙනවා. මෙහි ස්වේච්ඡා පුහුණුකරුවන් පුහුණු කිරීම, තාක්ෂණික නිලධාරීන් පුහුණු කිරීම සහ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා අය කිරීමකින් තොරව ආහාර පාන සහිතව නේවාසික විශේෂ වැඩසටහන් පැවැත්වීම සිදු කරනු ලබනවා. මෙම විද්‍යායතනයෙන් මේ වනවිට පුහුණුව ලැබූ 1,500 කට වැඩි පිරිසක් බස්නාහිර පළාත තුළ සහ පළාතේ පාසල්වල ක්‍රීඩා පුහුණු කටයුතුවල නිරත වන බව කියන්න පුළුවන්. ඒ වාගේම කාය වර්ධන මධ්‍යස්ථාන ද, ඇරොබික් මධ්‍යස්ථාන ද මෙම පුහුණුලාභීන් විසින් පවත්වාගෙන යනවා. මෙම විද්‍යායතනයේ කටයුතු තවදුරටත් දියුණු කිරීම සඳහා පරිපාලන ගොඩනැගිල්ල සහ නේවාසිකාගාරයක් ඉදි කිරීම සඳහා රුපියල් මිලියන 100 ක් වෙන්කර ඇති අතර එහි ඉදි කිරීම් කටයුතු මේ වනවිටත් සිදු කෙරෙනවා.

*ඒ වාගේම මේ සඳහා අවශ්‍ය ඉඩමක් ද අපි ඒ ඉඩමට මායිමෙන් මිලදී ගන්නට කටයුතු කරලා තිබෙනවා.*

ක්‍රීඩා කටයුතු සඳහා 2019 වර්ෂයට ද මෙම මුදල් ප්‍රකාශය යටතේ රුපියල් මිලියන 124 ක් වෙන් කරනවා.

*ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. පසුගිය ශිෂ්‍යත්ව විභාගයේදී ලංකාවේ පළමුවැනි ස්ථාන දෙකක්, දෙවැනි ස්ථානයක් සහිත හතර වන ස්ථාන 08 ක් සහිතව අපේ පළාතේ දරුවන් ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළම සාමාර්ථයක් ලැබුවා. ඒ වාගේම පසුගියදා නිම වුණු නෙට් බෝල් තරඟයට කණ්ඩායමට අපේ පළාතේ ගැහැණු ළමයින් දෙදෙනෙකු සම්බන්ධ වුණා. ගරු ඇමතිතුමායි අපියි කථා කරලා දැන් මේ වන කොට ශිෂ්‍යත්වය විභාගයේ ලංකාවේ පළමුවැනියා සහ දෙවැනියා හා හතර වන ස්ථාන ගත් දරුවන්ට පළමු වැනි දෙදෙනාට පිළිවෙළින් ලක්ෂ 05 බැගින් ද, දෙවැනියාට ලක්ෂ 04 බැගින් ද, හතර වන ස්ථාන ගත් දරුවන්ට ලක්ෂ 02 බැගින් ද, ඒ වාගේම නෙට් බෝල් ක්‍රීඩිකාවන් දෙදෙනාට ලක්ෂ 05 බැගින් මුදල් ප්‍රදානය කිරීමටත්, ඒ වාගේම ශිෂ්‍යත්ව විභාගයේ දරුවන්ට ඉගැන්වූ 1, 2 පන්තියේ ගුරුවරියන්ටත්, 3, 4 පන්තියේ ගුරුවරියන්ටත්, 5 ගුරුවරියන්ටත්, ඒ කියන්නේ ගුරුවරු තුන් දෙනෙකුට සහ විදුහල්පතිටත් අපි රන් පදක්කම් ලබා දීමට මේ වන විට අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කරලා තිබෙනවා. ඉදිරි දිනයකදී සියලු පළාත් සභා මන්ත්‍රීවරු දැනුවත් කරලා ඒ බෙදා දීම කරන්නට සැලසුම් කරලා තිබෙනවා.*

**ගරු රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ටියුෂන් ගුරුවරුන්ටත් දෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

*ටියුෂන් ගුරුවරුන්ට දෙන්න විධියක් නැහැ. මොකද, දෙමව්පියෝ ළමයා අර ගෙන ටියුෂන් ගියාට අපට කරන්න දෙයක් නැහැ. අපි විශ්වාස කරන්නේ නැහැ ශිෂ්‍යත්ව ප්‍රතිඵලය පිටුපස ටියුෂන් ගුරුවරු ඉන්නවා කියලා. මොකද, ටියුෂන් යන එක පුද්ගලික අයිතියක්. නමුත් ශිෂ්‍යත්වය ඉගෙන ගන්න අපේ ප්‍රාථමික - ඒක විශේෂයෙන්ම කියන්න ඕනෑ. ඇති හැකි අයට වඩා ශිෂ්‍යත්ව විභාගයේ වැඩිම ප්‍රතිඵල තිබෙන්නේ පළාත් සභා පාසල්වල. වැතර කියන්නේ ඉතා කුඩා පාසලක්. ළමයෙකු ඇතුළු වෙන්නේ නැහැ. ඒ වාගේම කුඩා පාසල්වල දරුවෙක් ශිෂ්‍යත්වය සමත්. මම හිතන්නේ නැහැ ඒ දෙමව්පියන්ට සමහර මන්ත්‍රීවරු කරන ටියුෂන් පන්තිවලට ගිහිල්ලා ශිෂ්‍යත්වය පාස් වෙන්න පුළුවන් කියලා ගරු සභාපතිතුමනි, මම විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා මම විශ්වාස කරන්නේ ශිෂ්‍යත්ව ප්‍රතිඵලය අපේ ගුරුවරුන්ගේ හැකියාවක්. අපේ විදුහල්පතිවරුන්ගේ හැකියාවක්.*

*ගුරුවරු විතරක් නොවෙයි. මම විශේෂ ස්තුතියක් කරන්න ඕනෑ. ගුරුවරුන්ට විතරක් නොවෙයි. අපේ පළාත් සභා මන්ත්‍රීවරුන්ට. දැන් උදාහරණයක් විධියට ගත්තොත් ගාමිණී තිලකසිරි ඇමතිතුමා අවුරුදු 14 ක් තිස්සේ ශිෂ්‍යත්ව වැඩ සටහන් කරනවා. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, ගුණසිරි ජයනාත් මැතිතුමා, ඔය වාගේ මෙතැන ඉන්නවා නම් වශයෙන් කිව්වොත් විශාල පිරිසක්. මම මේක කියනවා. මේ ගෞරවය ගුරුවරුන් වාගේම, විදුහල්පතිවරුන් වාගේම අපේ අධ්‍යාපන බලධාරීන් වාගේම මේ පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීවරුන් දිනා ගන්න ඕනෑ. මොකද, ඒගොල්ලෝ වාර්ෂිකව නිලධාරීන් එක්ක හැප්පෙමින් - දැන් ඒ වගකීම මම ගන්නේ. කවදා හරි FCID යන්නේ මම. අපේ මන්ත්‍රීවරු කොපමණ මගේ අනුමැතිය අරගෙන කොයි තරම් වැඩ සටහන් කරනවාද? ඒ නිසා මේකේ ගෞරවය අපේ පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ටත් ලැබෙන්න ඕනෑය කියලා මම මේ අවස්ථාවේදී මතක් කරනවා.*

**තොරතුරු තාක්ෂණය**

ගරු සභාපතිතුමනි, වර්තමානයේ, පරිගණකයක් සහ අන්තර්ජාල සබඳතාවන් පවතී නම් ඕනෑම තොරතුරක් තම අභියසට ගෙන්වා ගැනීම ඒ තරම් අපහසු කාර්යයක් නොවන බව අපි කවුරුත් දන්නවා. තොරතුරු තාක්ෂණය මුළු ලෝකයේම පුද්ගලයින්ගේ දෛනික කටයුතු, ආයතනයන්හි කාර්යසාධනය, නිෂ්පාදනය, කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව දියුණු කිරීම සඳහා භාවිතා කරන මෙවලමක්. මෙම ක්‍රියාවේදී අන්තර්ජාල සම්බන්ධතාව ඉතා වැදගත්. නමුත් ලංකාවේ තවමත් අන්තර්ජාල සම්බන්ධතා පවතින්නේ ඉතා අඩු මට්ටමක.කොරියානු ජනරජයේ පුද්ගලයින් 100 කට අන්තර්ජාල සම්බන්ධතාවය 93 ක්. සිංගප්පූරුවේ මෙය 81 ක්. මැලේසියාවේ 79 ක්. නමුත් ශ්‍රී ලංකාවේ තවමත් මෙය 27 යි. මෙම තත්ත්වයඉහළ නංවා ගැනීම සඳහා හැකිතාක් මෘදුකාංග භාවිතය වැඩි කළ යුතුයි. මේ සඳහා පරිගණක සම්පත් මධ්‍යස්ථානයට රුපියල් මිලියන 25 ක් සහ පළාත් මෝටර් රථ දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 29 ක් මෙම වර්ෂයේ වෙන්කර තිබෙනවා. මෙම මුදල්වලින් පරිගණක මෘදුකාංග 4 ක් දැනටමත් නිර්මාණය කරමින් පවතින අතර වර්ෂය තුළ ඒවායේ කටයුතු අවසන් කිරීම අපේ බලාපොරොත්තුවයි.

තොරතුරු තාක්ෂණය පළාතේ සෑම අමාත්‍යාංශයකටම, දෙපාර්තමේන්තුවකටම ඉතා වැදගත් නිසා පරිගණක සම්පත් මධ්‍යස්ථානයට සහ අනෙකුත් ආයතනවලට මෘදුකාංග භාවිතය වැඩි කර ගැනීම සඳහා මෘදුකාංග මිලදී ගැනීමට රුපියල් මිලියන 30 ක අපි වෙන් කරන්න බලාපොරොත්තු වෙනවා.

*ගරු සභාපතිතුමනි, අපේ රටේ අන්තර්ජාලය භාවිතා කරලා, You tube ගිහිල්ලා, face book ගිහිල්ලා, Google එකට ගිහිල්ලා අපේ අය මොනවාද කරන්නේ? දේශපාලඥයන්ටයි, රටේ වගකිවයුතු අයටයි එහෙම නැත්නම් සාමාන්‍යයෙන් කුණුහරුපයි, මඩ ගැහිලියි, ඒවායේ තිබෙන නරක දේවල් තමයි බලන්නේ. නමුත් දියුණු රටවල ඒ තාක්ෂණික මෙවලම් පාවිච්චි කරන්නේ බැංකු කටයුතු, ටෙලිෆෝන් බිල්, ඒ වාගේම විවිධ කටයුතු සඳහා. නමුත් අපේ රටේ ඒවා පාවිච්චි කරන්නේ මම හිතන්නේ වැරදි දේවල්වලට. ඒ ගැනත් අපි මතක් කරන්න ඕනෑ.*

*සාමාන්‍යයෙන් අද මේ වන කොට මම දන්නවා. අපේ පෞද්ගලික පාසල් දුරස්ථ අධ්‍යාපනය, අපේ රජයේ පාසල් දුරස්ථ අධ්‍යාපනය NI එක හරහා කරනවා. නමුත් ඒකෙන් උපරිම ප්‍රයෝජන ගන්නවාද කියන එක සැක සහිතයි. නමුත් සාමාන්‍යයෙන් අපේ රටේ දියුණු පාසල්වල, පුද්ගලික පාසල්වල ගුරුවරිය ගෙදර වැඩ දෙන්නෙත් e mail මගින්. ඒ නිසා දෙමව්පියන්ට තමන්ගේ දරුවන් කරන ගෙදර වැඩ වුණත් මේ තාක්ෂණය ඔස්සේ පාවිච්චි කරන්න පුළුවන්. ඒ පිළිබඳවත් අපි ගරු ඇමතිතුමාට යෝජනා කරනවා. අපේ දරුවන්ට දුරස්ථ අධ්‍යාපනය යටතේ ඒ තාක්ෂණික මෙවලම් පාවිච්චි කිරීමේ අයිතිය ලබා දෙන්න කියලා.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා සමාවෙන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමාට මූලාසනයට ආරාධනා කරනවා.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

හොඳයි නියෝජ්‍ය සභාපතිතුමාව මූලාසනයට ආපු එක. එතුමා තමයි හුඟාක් මේ තාක්ෂණික මෙවලම් වැරදි විධියට පාවිච්චි කරන්නේ මේ පළාත් සභාවේ.

**ගරු හෙක්ටර් බෙත්මගේසභා නායකතුමා -**
Hon. Hector Bethmage - Leader of the House

ඒ කථාව නම් හරියටම හරි. තාක්ෂණය පිළිබඳව දැනුම තිබෙනවා කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ඒ නිසා මම මේ අවස්ථාවේදී මූලාසනය වන ගරු නියෝජ්‍ය සභාපතිතුමාට යෝජනා කරනවා මේ අන්තර්ජාල සම්බන්ධතාවලින් යහපත් කටයුතු කරන්නට තමන්ගේ ඒ දැනුම හා ඥානය අපේ පළාතේ ජනතාවට ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

රටටම ගියා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සියලු දෙනාම නිවැරදි ආකාරයෙන් පාවිච්චි කරන්න කියලා මම මූලාසනය හැටියට ඉල්ලා සිටිනවා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

**කෘෂිකර්මාන්තය**

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත තුළ සිදුවන සීඝ්‍ර නාගරීකරණය හේතුවෙන් ප්‍රජාව කෘෂිකර්මාන්තය කෙරෙහි දක්වන ආකර්ෂණය අවම වීමෙන් කෘෂිකාර්මික කටයුතු කෙරෙහි දැඩි බලපෑමක් ඇති වෙලා. විශේෂයෙන් තරුණ ජනතාව කෘෂිකර්මයෙන් ඈත්වී වෙනත් සරල ආදායම් මාර්ගවලට යොමු වීම පළාතෙහි බහුලව දැකිය හැකි තත්ත්වයක්. අතීතයේ ඉවතලන දණ්ඩ පවා පැළවූ මේ සාරවත් භූමිය අද රසායනික ද්‍රව්‍ය නිසා දූෂ්‍ය හා නිස්සාර බවට පත්වීම ද කනගාටුදායක කරුණක්.

*ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මේ වෙලාවේදී මතක් වෙනවා. අපේ පාසලේ හිටපු කීර්තිමත් විදුහල්පතිවරයෙක් වන, අවිහිංසාවාදයේ පියා හැටියට මේ රටේ, මේ ලෝකයේ සලකන දිවංගත ආචාර්ය ඒ.ඩබ්ලිව්. අදිකාරම්තුමා 'අවි ගත්තෝ අවියෙන් නසී' කියලා කිව්වේ මේ පාතාල ලෝකයට නොවෙයි. මේ වැරදි පොහොර භාවිතයේදී වන දේ එදා එතුමා දැකලා තමයි කිව්වේ, 'අවි ගත්තෝ අවියෙන් නසී' කියලා.*

කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්කවල වී වගාවට අමතරව එළවළු සහ අනෙකුත් බෝග වගාවන් බහුලව දකින්න පුළුවන්. මෙම ගොවීන් මුහුණ දෙන ප්‍රබල ගැටළුවක් තමයි ක්ෂණිකව නොයෙක් වගා රෝග ඇති වීම. සමහරවිට රෝගය ඇති වී දින තුනක් හතරක් තුළ මුළු වගාවම විනාශ වී යනවා. මෙවන් තත්ත්වයක් ඇති වුවහොත් ගොවියා නැවත එම වගාවන් කරයිද? රෝගය සෑදුණු විගස එයට අවශ්‍ය උපදෙස් ලබා දීමට කෘෂිකාර්මික උපදේශකවරුන් කටයුතු කළ යුතුයි. එම නිසා මෙකී කරුණ වෙනුවෙන් අවශ්‍ය යටිතල පහසුකම් නිර්මාණය සඳහා ලබන වර්ෂය තුළ විශේෂ මුදලක් වෙන් කර දීමට මා බලාපොරොත්තු වෙනවා. *උපදේශකවරුන් නේද පසුගිය දවස්වල උද්ඝෝෂණය කළේ.*

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

ඔව්.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ජන ඝනත්වය ද කෘෂිකාර්මික කටයුතු කෙරේ බලපෑමක් කරන සාධකයක්. උතුරු මැද පළාතේ වර්ග කිලෝ මීටරයකට පුද්ගලයින් 135 ක් සිටින විට බස්නාහිර එය 1,664 ක්. පළාතේ දිස්ත්‍රික්ක වශයෙන් ද දැඩි විෂමතාවයක් පවතිනවා. කොළඹ දිස්ත්‍රික්කයේ වර්ග කිලෝමීටරයකට පුද්ගයින් 3,513 ක් වන විට, ගම්පහ එය 1,755 යි, කළුතර 793 යි. මින් ප්‍රකාශ වන්නේ කුමක්ද? අප පළාතේ ද වගා කළ හැකි බිම් වැඩියෙන් පවතිනුයේ කළුතර දිස්ත්‍රික්කයේ බවයි. තව වර්ෂ 15 ක් 20 ක් යන විට මෙම තත්ත්වය ද වෙනස් වෙන්න පුළුවන්. කළුතර දිස්ත්‍රික්කයේ වගා බිම්වලින් උපරිම ප්‍රයෝජන ගත යුතුයි. මේ නිසා ලබන වර්ෂයේ කළුතර දිස්ත්‍රික්කයේ වගා කටයුතු සඳහා වැඩිපුර ප්‍රතිපාදන වෙන් කිරීමට මා යෝජනා කරන අතර

*ගරු නියෝජ්‍ය සභාපතිතුමාට යෝජනා කරනවා ඒ තාක්ෂණික මෙවලම් ඒ සඳහා උපයෝගී කර ගන්නා ලෙස.*

"*වල්පිට*" තියෙන්නේ 1945 දී ඉදි කළ නේවාසික පුහුණු මධ්‍යස්ථාන දෙකක්. ඒවායේ පහසුකම් ඉතා අල්පයි. ප්‍රමාණයෙන් කුඩායි. එම නිසා නවීන පහසුකම්වලින් හෙබි වර්ග අඩි 21,000 ක පමණ නේවාසිකාගාරයක් සහිත පුහුණු මධ්‍යස්ථානයක් 2019 වර්ෂයේ ආරම්භ කරනවා. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මෙම මුදල් ප්‍රකාශයෙන් අපි වෙන් කරලා තිබෙනවා.

වකුගඩු රෝගය ද බස්නාහිර පළාත තුළ දැන් ක්‍රමයෙන් පැතිරෙන රෝගයක් බවට පත් වෙලා. මෙම රෝගය වැළැක්වීම සඳහා වස විසෙන් තොර කෘෂිකාර්මික පිළිවෙත්, කාබනික කෘෂිකර්මය, සම්මතයන්ට අනුකූලව පොහොර හා රසායනික ද්‍රව්‍ය භාවිතය පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම දැනටමත් සිදු කරනවා. මෙම ව්‍යාපෘතිය ලබන වර්ෂය තුළ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ද සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම අපේ අරමුණයි.

*ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මුදල් වෙන් කරන කොට මම දැන ගත්ත කාරණය තමයි මිලියන ගණන් දීලා නැහැ කෘෂිකර්මයට. අපි තමයි දැන් දීලා තිබෙන්නේ. ඒ නිසා අපි හිතනවා, ගරු ඇමතිතුමා මේ අවුරුද්දේ මොකක් හරි වැඩක් - දැන් ගියවරත් මිලියන ගණනක් දුන්නා. මේ සැරෙත් දෙන නිසා ඒක ඉෂ්ට කරයි කියලා. ඒ වාගේම මෙතැන කෘෂිකර්ම ඇමතිතුමාත් -*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ කියන්නේ, කෘෂිකර්ම ඇමතිතුමාට කිව්වේ කොස් පැල විතරක් බැහැ. අනික් ඒවාත් හිටවන්න කියලා.

**ගරු ඉසුරු දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

*ආ. කොස් පැළ. දැන් අධ්‍යාපන ඇමතිතුමාත්, කෘෂිකර්ම ඇමතිතුමාත් ඉන්න නිසා මම මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. විශේෂයෙන්ම අපේ රජයේ පාසල්වල ගුරුවරුන්ට කෘෂිකර්මය පිළිබඳව පුළුල් දැනුමක් නැහැ. ඒ නිසා ගුරුවරු කරන්නේ, ළමයින්ට කියන්නේ ගෝවා, ඒ වාගේම රාබු, කැරට් වාගේ ඒවා ගේන්න කියලා. මොකක්ද මේ තිබෙන්නේ අල්බන් සොලියුෂන් කියලා. ඒ ක්‍රමයට. පස් නැතිව වතුරවලින් වවන්නේ. අන්න ඒ ක්‍රමයට වවන්න තමයි ඉස්කෝලවල ළමයින්ට කියලා දෙන්නේ.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඇල්බට් සොලියුෂන්.

**ගරු ඉසුරු දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

*අන්න ඒ සිස්ටම් එක. එතකොට එහෙම කරන කොට ළමයින්ට කෘෂිකර්මාන්තය පිළිබඳව හැඟීමක් ඇති වෙන්නේ නැහැ. අපි ආසයි ගස්ලබු පැලයක් හිටවලා - අපටත් මතකයි පොඩි කාලේ මඤ්ඤොක්කා පැලයක් හිටවලා, මිරිස් පැලයක් හිටවලා - ඔය නළුවෝ වාගේ නොවෙයි. තේරුණාද කියන කථාව.*

**ගරු යූ.එල්.එන්.පී. උඩවෙල**
Hon. U.L.N.P. Udawela

රොජර්ට කිව්වේ.

**ගරු ඉසුරු දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

*එහෙම හිටෙව්වාම මාසයක්, එකහාමාරක්, දෙකක් යන කොට ඒකේ ප්‍රතිඵලයක් එනවා. එතකොට මිරිස්, බණ්ඩක්කා, වම්බටු, දඹල වාගේ එළවළු වවන්න තමයි දරුවන්ව හුරු කරන්න ඕනෑ. නමුත් අපේ පාසල්වල එහෙම වෙන්නේ නැහැ. රොජර් ගැන මම කියන්න යන්නේ නැහැ. රොජර් ඇතුළු නළුවෝ ඔක්කොමට මම ගිය සැරේ කිව්වා, මොකක් හරි වැඩ සටහනක් හදන්නය කියලා. මම දන්නේ නැහැ. කරපු වැඩකුත් නැහැ. නළුවෝ ටික එකතු වෙලා බෙරේ පළුව නැති කරපු එක තමයි කරලා තිබෙන්නේ.*

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

රොජර්ලාට වෙන වැඩ තිබෙනවා නේ? රූපවාහිනියට පනින්න තිබෙනවා.

**ගරු යූ.එල්.එන්.පී. උඩවෙල**
Hon. U.L.N.P. Udawela

නාට්‍යක් කළා. ආරාධනා කළාම බලන්න එන්නෙත් නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

*නාට්‍ය කළේ සුභ සාධකයෙන්. නළුවෝ, කලාකාරයෝ නොවෙයි.*

**සත්ත්ව නිෂ්පාදන කටයුතු**

ගරු සභාපතිතුමනි, සත්ත්ව නිෂ්පාදන කටයුතු වෙනුවෙන් 2019 වර්ෂයට රුපියල් මිලියන 380 ක් වෙන් කර තිබෙනවා. එය 2018 වර්ෂයේ වෙන් කළ රුපියල් මිලියන 343 ට වඩා සියයට 11 ක වැඩි වීමක්. සත්ත්ව පාලන ක්ෂේත්‍රයේ නියුතුවූවන්ගේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීම, සත්ත්ව ගොවිපළවල් පරිසර හිතකාමීව සංවර්ධනය කිරීම, නව තාක්ෂණික දැනුම ගොවීන් වෙත ලබා දීම සහ පළාතේ පශු සම්පත් නිෂ්පාදනවල ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් 2019- 2021 තුන් අවුරුදු සැලැස්මක් සකසා තිබෙනවා. මෙම අරමුණු ඉෂ්ට කර ගැනීම සඳහා ඉහත මුදල් ආයෝජනය කිරීම අපේ අපේක්ෂාවයි.

2017 වසරේදී සමස්ත ජාතික කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 396 ක්. එය 2016 වසරට වඩා සියයට 3.2 ක වැඩි වීමක්. මෙම වැඩි වීමට අප පළාත ද දායක වී තිබෙනවා. 2016 වසරේදී පළාතේ කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 30.7 ක් වූ අතර 2017 වසරේදී 32.28 දක්වා වැඩි වෙලා. ඉහළ අස්වැන්නක් සහිත එළදෙනුන් බෙදා දීම සහ නැවුම් කිරි සඳහා ගොවීන්ට සහතික මිලක් නියම කිරීම මෙම වර්ධනයට ප්‍රධාන හේතුවයි.

ජාතික නිෂ්පාදනයෙන් සියයට 82 ක් එළකිරි නිෂ්පාදනය යි. මී කිරි නිෂ්පාදනය සියයට 18 යි. අප පළාතේ තත්ත්වය ද එයයි. පළාතේ මී කිරි නිෂ්පාදනය වැඩි කිරීම කෙරෙහි අපේ සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව අවධානය යොමු කළ යුතුයි. එම නිසා ලබන වර්ෂයේදී මී ගවයන් බෙදා දීම සඳහා වැඩි මුදලක් වෙන් කිරීමට මා යෝජනා කරනවා.

*ඒ වාගේම අපි ගිහිල්ලා බැලුවා, කොහේද හම්බන්තොට. පාර්ලිමේන්තුවේ ඉන්න මී ගවයෝ නොවෙයි අපි බලන්න ගියේ. හම්බන්තොට. මම හිතන්නේ, ඒ ව්‍යාපෘතිය අපි දැන් තනිකරම තාක්ෂණ විධියට, තාක්ෂණික ක්‍රමෝපායන් පාවිච්චි කරලා කිරි ලබා දීමේ ව්‍යාපෘති අපි පටන් අරගෙන තිබෙනවා. ගරු ඇමතිතුමා මාවත් එක්කගෙන ගිහිල්ලා පෙන්නුවා. රිදීගම නේද?*

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

රිදීගම.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

*රිදීගම. ඇමතිතුමාට තවම පුළුවන් ඒ වැඩේ කරන්න. (බාධා කිරීම්) නැහැ. මම කිව්වේ, පට්ටි දාන්න පුළුවන් කියලා. ඇමතිතුමාට නොවෙයි. ගවයින්ට. තේරුණාද?*

2016 වර්ෂයේදී ජාතික බිත්තර නිෂ්පාදනය මිලියන 2,060 යි. මින් සියයට 11 ක් පමණ තමයි පළාතේ දායකත්වය. එය කිසිසේත් ප්‍රමාණවත් නැහැ. මෙය වැඩි කර ගැනීමට අප කටයුතු කළ යුතුයි. විශේෂයෙන් කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්කවල බිත්තර නිෂ්පාදනය වැඩි කළ හැකියි. ඒ සඳහා අවශ්‍ය කුකුළු පැටවුන් ලබන වර්ෂයේදී සහනදායී මිලකට ලබා දීමට බලාපොරොත්තු වෙනවා.

*ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සාමාන්‍යයෙන් කුකුළු ගොවිපලක නම් කිකිළියෝ ඉන්න තැනට කුකුලෝ ඉන්න අවශ්‍යයි. නමුත් අපි රටක් හැටියට මුහුණ දෙන ගැටළුවක් තමයි අපේ ගවයන් ඉන්න ගොවිපලවල පිරිමි ගවයින් නඩත්තු කිරීම. ඒක බරපතළ කාරණයක් අපට.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හැබැයි, ඒක මහා පාපකර්මයක්.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

*ඒක අපේ ආර්ථිකයට බලපෑමක් වෙලා තිබෙනවා. ඒක බුද්ධ දර්ශනය අනුව රාජකාරියක් කරන්න බැහැ. ඒ නිසා ආර්ථිකමය පරිහානියකට අපි ලක් වෙලා තිබෙනවා. යම් තරමකට සතුටු වෙන්න පුළුවන්. දැන් ඌරන් මැරීමේ බලතල දීලා තිබෙන නිසා. ඒක ගොවියන්ට ලබා දීපු ලොකු ශක්තියක්. ඒ කෙරෙහිත් අවධානය යොමු කරනවා.*

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු මහ ඇමතිතුමා, ගියවර කුකුළු පැටව් විතරයි බෙදපුවායේ හිටියේ. කිකිළි පැටියෝ හිටියේ නැහැ බෙදපු ඒවායේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

*ඒ කියන්නේ, බෙදුවාම කිකිළියෝ නොවෙයි ඉන්නේ. කුකුල්ලු. මම ඒක නේ කිව්වේ, යාළුවා වැඩකාරයා කියලා.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඡන්ද කාලේ බෙදන්නේ ඒවා තමයි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

*ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ගරු ඇමතිතුමාටයි, සත්ව නිෂ්පාදන නිලධාරීන්ටයි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, අපි පසුගිය අවුරුද්ද වෙන කල්ම කුකුළු පැටව් සල්ලිවලට ගත්තේ. මේ සැරේ අපේ සත්ව නිෂ්පාදන අමාත්‍යාංශය ඒක අපට ඒගොල්ලෝම නිෂ්පාදනය කරලා තමයි ලබා දුන්නේ. ඒ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාටයි, ඒ අදාළ නිලධාරීන්ටයි මම ස්තුතිවන්ත වෙනවා.*

ජාතික සූකර නිෂ්පාදනයට වැඩිම දායකත්වයක් දක්වන්නේ අපේ පළාතයි. බස්නාහිර පළාත තමයි ඒකටත් වැඩිම. රටේ දිස්ත්‍රික්ක අතරින් වැඩිම සූකර නිෂ්පාදනයක් සිදු කරන්නේ ගම්පහ දිස්ත්‍රික්කයේ. ඔන්න කට්ටිය. ගම්පහ කට්ටිය තමයි ඒ වැඩේ කරන්නේ. 2017 වර්ෂයේ රටේ සූකර නිෂ්පාදනය 81,420 ක් වන විට ඉන් සූකරයන් 26,410 ක් එනම් සියයට 32 ක් පමණ නිෂ්පාදනය කර ඇත්තේ ගම්පහ දිස්ත්‍රික්කයේ. මේ සියල්ල පෞද්ගලික නිෂ්පාදනයි. *අපට පසුගිය දවස්වල ගැහුවා ගම්පහට වැඩක් කරන්නේ නැහැයි කියලා. බලන කොට සූකරයෝ හරි හදලා තිබෙනවා නේ?*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වැඩිපුර එහෙනේ කරලා තිබෙන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

තව ඉස්සරහාට තිබෙනවා ගම්පහ කරපු වැඩ. මේ සඳහා පළාත් සභාවෙන් ලැබෙන දායකත්වය ඉතාම අල්පයි. මෙම නිෂ්පාදකයින් ධෛර්යමත් කිරීම සඳහා ලබන වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කිරීමට මං අදහස් කරනවා. කොටදෙනියාව පුහුණු මධ්‍යස්ථානයේ සංවර්ධනය සඳහා 2018 වර්ෂයේදී රුපියල් මිලියන 40 ක් වෙන් කළා. සියයට 70 ක පමණ වැඩ කටයුතු දැන් අවසන් කරලා. ඉතා අබලන් තත්ත්වයේ පැවති හෝමාගම සහ දොම්පේ පශු වෛද්‍ය කාර්යාල සඳහා නව ගොඩනැගිලි ඉදි කිරීමට රුපියල් මිලියන 50 ක් වෙන් කර ඇති අතර 2019 වර්ෂයේදී එම ගොඩනැගිලිවල වැඩ අවසන් කරනවා.

**සුළු වාරිමාර්ග සංවර්ධනය**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාතේ කුඹුරු වගා කරන්නේ වැසි ජලයෙන්. විශාල වාරි මාර්ග ව්‍යාපෘති අපේ පළාතේ නැහැ. අක්කර ගණනාවක් වී වගා කරන ගොවීන් ද බස්නාහිර පළාතේ නැහැ.

මේ පළාතේ ගොවීන්ට අවශ්‍ය වන්නේ සුළු වාරිමාර්ගයි. ඒ අනුව පළාත් සභාවේ ප්‍රධාන කාර්යය වන්නේ සුළු වාරිමාර්ග නඩත්තු කටයුතුයි.

2018 වර්ෂයේදී ගොවි පවුල් 4,160 කට ප්‍රතිලාභ ලැබෙන අයුරින් ඇළ මාර්ග 80 ක් ප්‍රතිසංස්කරණය කිරීම, වැව් 03 ක් ප්‍රතිසංස්කරණය කිරීම, නව අමුණු 11 ක් ඉදිකිරීම සහ අමුණු 43 ක් අළුත්වැඩියා කිරීම දැනට කරමින් පවතින අතර වර්ෂය අවසන් වීමට පෙර එම ව්‍යාපෘති නිම කරනවා. වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය සඳහා දැනටමත් එක්කැවේටර් යන්ත්‍ර 3ක් හා බාජ් 3ක් මිලදී ගෙන දිස්ත්‍රික්ක තුනට ලබා දී තිබෙන අතර 2019 වර්ෂයේදී ද එක්කැවේටර් යන්ත්‍ර 3 ක් බාජ් එකක් සහ බූම් ට්‍රක් එකක් මිලදී ගැනීමට බලාපොරොත්තු වෙනවා. මේ සඳහා ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 63 ක්.

පසුගිය අයවැය කථාවේදී මා ප්‍රකාශ කළ පරිදි හොරණ කණේවෙල අමුණ ඉදි කිරීම සඳහා රුපියල් මිලියන 35 ක් වෙන් කළා. එහි ඉදි කිරීම් කටයුතු ආරම්භ කර දැනට අවසන් අදියරේ පවතින අතර වර්ෂය අවසන් වීමට පෙර එහි ප්‍රතිලාභ ගොවීන්ට ලබා ගන්න පුළුවන්.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ඒක ඩී.එස්. සේනානායක මහත්තයාගේ කාලේ. 1948 කළා. කවුරුවත් කළේ නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මොකක්ද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

කණේවෙල අමුණ.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1948 අපේ දිවංගත අග්‍රාමාත්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා විසින් ආරම්භ කරන ලද එකක් තමයි හොරණ කණේවෙල අමුණ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මහ ඇමතිතුමා, අවුරුදු 25 කින් විතර කළේ නැති එකක් අපේ කෘෂිකර්ම ඇමතිතුමා කළේ. මගේ කොට්ඨාශයේ සහ අපේ නිමල් චන්ද්‍රරත්න ගරු මන්ත්‍රීතුමාගේ, ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමන්ලාගේ කොට්ඨශවල. මගේ ගොවින්ටත් විශාල සෙතක් වුණා ඇමතිතුමා ඒ කරපු වැඩෙන්.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සාමාන්‍යයෙන් අමුණු හදන්නේ නැහැ නේ? ඒ වාගේම පසුගිය දිනක වැව් සම්බන්ධ සාකච්ඡාවකදී මම අතිගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටියා, අපේ පළාතේ තිබෙන වැව් නඩත්තු කිරීම සඳහා ඒ වැව් අපට පවරා දෙන්නය කියලා. මොකද, අපේ පළාතේ තිබෙන ඒ වැව් කිහිපය අපට දුන්නොත්, අපට ඒක රජයට වඩා හොඳින් නඩත්තු කරන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා. අනික් එක වැඩ කරන මිනිහෙක් එක්ක එපැයි යන්න.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

එල්ලාවල එක්කගෙන ගියේ මාව.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එල්ලාවල කියන්නේ රෙද්ද බැනියම අඳින, සෙරෙප්පු සපත්තු නැතිව ඇවිදින නිකම් බැලුවාම ගමේ මිනිහෙක්. සිංහල මිනිහෙක්.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

අද නැහැ. හිටියා නම් තමයි හොඳ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කුඹුරු බහින මිනිහෙක් වෙන්න ඕනෑ නේ?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

කුඹුරු බහින මිනිහෙක් වෙන්න ඕනෑ නේ. ඒක හරි. ඒක ඇත්ත.

**ඉඩම් බලතල**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් සභා පිහිටවූ දා සිටම ඉඩම් බලතල පිළිබඳ තියෙන්නේ මතභේදකාරී තත්ත්වයක්. නීති රීති සහ අණපනත්වල කුමක් සඳහන් වුවද, ඍජුවම බලතල යටතේ අප ක්‍රියාත්මක කරන්නේ බදු එකතු කර ගැනීම පමණයි. අනෙකුත් සියලු කාර්යයන්හිදී අපි කරන්නේ ඉඩම් කොමසාරිස් ජනරාල්ට සහ ප්‍රාදේශීය ලේකම්වරුන්ට තීරණ ගැනීම සඳහා සහාය වීම පමණයි.

බදු ආදායම එකතු කර ගැනීමට යාමේදී ගැටළු රාශියකට මුහුණ පෑමට සිදු වෙලා. බදු එකතු කර ගැනීම හැර එම ඉඩම් සම්බන්ධ තීරණ ගැනීමේ කිසිදු බලයක් පළාත් සභාවට නැහැ. අවම වශයෙන් සත්‍ය වශයෙන් නොලැබෙන බදු ආදායමක් ඉවත් කිරීමේ බලයක් හෝ පළාත් සභාවට නැහැ. අපි අවස්ථා ගණනාවකදී බදු නොගෙවන අයට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගන්න උත්සාහ කළත් නීතිමය ක්‍රියා මාර්ග ගැනීමේ බලතල පළාත් සභාවට තිබේද යන්න ගැටළුකාරී තත්ත්වයක්. මේ නිසා මේ වන විට හිඟ බදු ආදායම වන රුපියල් මිලියන 2,155 ක් එකතු කර ගැනීම ද ප්‍රශ්නයක්.

බදු ගිවිසුම් අළුත් කිරීම, නැවත තක්සේරු කිරීම, බදු ගත් ඉඩම් ව්‍යාජ ඔප්පු සකසා විකිණීම පිළිබඳ නීත්‍යානුකූලව කටයුතු කිරීම වැනි සියලු කාර්යයන් පවතිනුයේ රජය යටතේයි. එම නිසා රජය මෙම කාර්යයන් කරන තුරු අපට බලා සිටීමට සිදු වෙලා.

අක්කර 106 ක් වූ බොරැල්ල "*ගොල්ෆ් ක්ලබ්*" ආයතනයෙන් වාර්ෂිකව එකතු කරන බදු මුදල රුපියල් 4,400/- ක්. මෙම මුදල සාධාරණ ද යන්න නැවත සිතා බැලිය යුතුයි.

*ගොල්ෆ් ක්ලබ් එකේ රෙස්ටුරන් එකට ගියොත් එහෙම බිල මම හිතන්නේ, 4,400 ක් නොවෙයි. මම හිතන්නේ, 48,000 ක් විතර වෙනවා.*

කෙසේ වුවද මෙම ගැටළු ක්‍රම ක්‍රමයෙන් විසඳා ගැනීමට අපි සැම උත්සාහයක්ම ගන්නවා. අපගේ "*ආදායම් ප්‍රවර්ධන කමිටුව*" ද මෙම ගැටළු විසඳා ගැනීමට ප්‍රබල උත්සාහයක් ගන්නවා. නමුත් ඒ සඳහා දිගු කාලයක් ගත වන්න පුළුවන්.

**ධීවර කර්මාන්තය**

ගරු සභාපතිතුමනි**,** ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදන ක්‍රම අතරින් ප්‍රමුඛ වන්නේ වෙරළාශ්‍රිත මත්ස්‍ය නිෂ්පාදනය යි. එය මුළු මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 51 ක්. පළාත් සභාවේ වගකීම වන්නේ මෙම වෙරළාශ්‍රිත මත්ස්‍ය නිෂ්පාදකයන්ට උදව් කිරීමයි.

මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයේ වඩාත් වැදගත් වන්නේ වගාකරුවන් බිහි කර ගැනීමයි. මෙම වර්ෂයේ පළාතේ වගාකරුවන් 65 දෙනෙකු තෝරා ගෙන ඔවුන්ට යටිතල පහසුකම් ලබා දී කිලෝ ග්‍රෑම් 360,000 ක ඉලක්කයක් ඔවුන් වෙත ලබා දුන්නා. දැනටමත් ඉන් සියයට 50 කට වඩා වැඩි නිෂ්පාදනයක් අත්කරගෙන තිබෙනවා. මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයේදී තවත් වැදගත් කරුණක් තමයි ජලජීවී වගාව සහ ඒ ආශ්‍රිත කර්මාන්ත පිළිබඳ තාක්ෂණික පුහුණුව ලබා දීම. මෙම වර්ෂයේ වගාකරුවන් 80 දෙනෙකුට පුහුණුව ලබා දෙන්න ඉලක්ක කළත් මේ වන විටත් 94 දෙනෙකු පුහුණුව ලබා අවසන්. තවත් වගාකරුවන් 154 දෙනෙකු බිහි කර ගැනීම අපේ නව ඉලක්කයයි.

යුරෝපා සංගමය මත්ස්‍ය අපනයනය කෙරෙහි පනවා තිබූ තහනම ඉවත් කිරීමත් සමඟ 2016 වසරට සාපේක්ෂව 2017 වසරේදී මත්ස්‍ය අපනයන පරිමාව සියයට 41 කින් සහ අපනයන ආදායම සියයට 48.5 කින් ඉහළ ගොස් තිබෙනවා. එය ඉතා හොඳ ප්‍රවණතාවයක්. එමනිසා පළාතේ ද මත්ස්‍ය අපනයනකරුවන් බිහිකර ගැනීමට කටයුතු කිරීම අපේ වගකීමක්.

කළ යුතු කාර්යයන් රාශියක් පැවතුනත් පළාත් සභාවට වෙන් වන ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ විශාල මුදලක් ධීවර කටයුතු සඳහා වෙන් කළ නොහැකි වීම කණගාටුවට කරුණක්. කෙසේ වුවත් 2019 වර්ෂයට ධීවර කටයුතු සඳහා රුපියල් මිලියන 10 ක් අපි වෙන් කරලා තිබෙනවා. ඒක පසුගිය කාලේ මුකුත්ම වුණේ නැති එකක්.

**සෞඛ්‍ය සේවාව**

ගරු සභාපතිතුමනි, අධ්‍යාපනය හැරුණු විට, මෙම මුදල් ප්‍රකාශයෙන් වැඩිම ප්‍රතිපාදන මුදලක් වෙන් කරන්නේ සෞඛ්‍ය ක්ෂේත්‍රයටයි. ඇමතිතුමා ඉන්නවා නේද? සෞඛ්‍ය කටයුතු සඳහා 2018 වර්ෂයට වෙන් කළ මුදල රුපියල් මිලියන 12,710 ක් වන විට 2019 වර්ෂයට රුපියල් මිලියන 17,306 වෙන් කරනවා. එය 2018 වර්ෂයට වෙන් කළ මුදලට වඩා සියයට 36 ක වැඩි වීමක්.

රටේ අනෙකුත් ක්ෂේත්‍රයන් සමඟත්, ලෝකයේ අනෙකුත් දියුණු රටවල් සමඟත් සැසඳීමේදී අපේ රටේ සෞඛ්‍ය සේවාවන් ඉතා හොඳ මට්ටමක පවතින බව අප කවුරුත් අවිවාදයෙන් පිළිගන්නා කරුණක්. රටක් වශයෙන් සෞඛ්‍ය සේවය වෙනුවෙන් දරන්නා වූ අති විශාල වියදමත්, ගුණාත්මක සේවයත් එයට ප්‍රබල හේතුවක් වෙලා තිබෙනවා. 2008 වර්ෂයේදී සෞඛ්‍ය වෙනුවෙන් දැරූ රටේ සමස්ත වියදම රුපියල් මිලියන 74,548 යි. එය 2017 වර්ෂය වන විට රුපියල් මිලියන 196,820 දක්වා වැඩි කර තිබෙනවා. 2008 වර්ෂයේ රජයේ රෝහල්වල වෛද්‍යවරු සිටියේ 14,255 යි. අද වන විට එය 21,259 දක්වා වැඩි වෙලා.

පසුගිය වසර කිහිපය තුළ අපි මුහුණ දුන් ප්‍රබල අභියෝගයක් තමයි ඩෙංගු රෝග වසංගත තත්ත්වය. 2016 වසරට සාපේක්ෂව 2017 වසරේදි ඩෙංගු රෝග ව්‍යාප්තිය සියයට 237 කින් වර්ධනය වුණා. එම වසරේ මුළු

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

දිවයිනේම ඩෙංගු රෝගීන් සංඛ්‍යාව 186,101 ක් වන විට බස්නාහිර පළාතේ රෝගීන් සංඛ්‍යාව 76,882 ක්. පසුගිය වර්ෂයේ අයවැය ඉදිරිපත් කරමින් ඩෙංගු රෝග මර්ධනය සඳහා යෝජනා ගණනාවක් ඉදිරිපත් කළා පමණක් නොවෙයි ඒවා අපි ක්‍රියාත්මක කළා. ඒවායින් සාර්ථක ප්‍රතිඵල අත්කර ගැනීමට අපට හැකි වී තිබෙනවා. 2018 අගෝස්තු අග වන විට බස්නාහිර පළාතෙන් වාර්තා වී තිබෙන්නේ රෝගීන් 13,033 ක් පමණයි. අප ගත් ක්‍රියා මාර්ග තුළින් සාධනීය ප්‍රතිඵල ලැබී ඇති බව ඉන් පැහැදිලි වෙනවා. කෙසේ වුවත්, ගෙන තිබෙන ක්‍රියා මාර්ග නතර කිරීම සුදුසු නැහැ. එසේ වුවහොත් එම වසංගත තත්ත්වය නැවත ඇති වෙන්න පුළුවන්. එම නිසා ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ද මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනවා.

*ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම අපට මේ ඩෙංගු රෝගය මර්දනය කිරීමට හැකි වුණ එක කාරණයක් තමයි, මේ දූමායනය. මේ සභාවේ මන්ත්‍රීවරුන් දැනුවත් වෙන්න කියන්න ඕනෑ. දූමායනය සම්බන්ධයෙන් මම දැඩි ක්‍රියා පිළිවෙතක් අනුගමනය කිරීම. මම දැනගත් හැම තැනකම මම දූමායනයට ඉඩ දුන්නේ නැහැ. මොකද, දූමායනයෙන් මම දන්න විධියට ඒ දූමායනය යෙදීමෙන් අපේක්ෂිත අරමුණ ඉෂ්ට වෙන්නේ නැහැ. මොකද, ඩෙංගු මදුරුවෙක් ඉන්නේ මතුපිට නොවෙයි. ඇතුළත ඉන්නේ. අනික් එක විවෘත ප්‍රදේශ තුළ දූමායනය යෙදීමෙන් ඒ පරිසරය තුළ ඉන්න මදුරුවන් කා දමන සත්ව කොට්ඨාශ, විශේෂයෙන් බත් කූරා වැනි ජලයේ ඉන්න ජීවීන් විශාල පිරිසක් අපේ පොදු පරිසරය තුළ ඉන්නවා. නමුත් ඒ දූමායනයෙන් සිද්ධ වෙන්නේ ඩෙංගු මදුරුවා නොවෙයි මැරෙන්නේ. ඒ පරිසරයේ ඉන්න ජීවීන්. මේක අපට විශාල බලපෑමක් ඩෙංගු මර්දනයට. ඒ නිසා මම හිතනවා, මේ වැඩි වීම අඩු කරන්න ඒකත් අපට හේතුවක් වුණා. ඒත් මට ආරංචි වෙනවා, කැස්බෑවේ MOH එකෙන් - දැන් මේ දවස්වල කැස්බෑවේ ඩෙංගු වැඩි වෙලා කියලා ඒ ඉන්න කොළඹ RVH - කොළඹ නියෝජ්‍ය එක්කෙනා දැන් මේ fogin කරනවා කියලා මට complain එක ඇවිල්ලා තිබෙනවා. මොකද, fogin කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. අපි සම්පූර්ණයෙන්ම fogin කරනවා - දැන් මේ වන කොට ඩෙංගු Positive වුණා කියලා ආරංචි වුණොත් මේ S 1 කියන ටෙස්ට් එක කොහේ හරි කළා නම් අපේ පළාතේ Clinic එකක්, පුද්ගලික රොහලක් හෝ රජයේ රෝහලක් ඒක එවෙලේම අපේ PD Office එකට Report වෙනවා. එතකොට PD Office එකට ඒක ගත්ත හැටිය අපි ඒකට Out door fogin කරන්නේ නැහැ. අපි ඒක indoor fogin කරන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඒ පිළිබඳව ඒ කොට්ඨාශයේ, පළාතේ මන්ත්‍රීවරුන්ට මම ඒ ගැන අවධානය යොමු කරනවා. එතකොට ඒ නිවස විතරයි අපට fogin කරන්න අවශ්‍ය වෙන්නේ. සමස්ත පරිසරයට අපි fogin කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ.*

*ඒ වාගේම විශේෂයෙන්ම මම අපේ ගරු මන්ත්‍රීවරුන්ව දැනුවත් කරන්න ඕනෑ. මොනම හේතුවක් නිසාවත් අපේ පළාතේ තිබෙන රෝහලකින් - අපට තමයි පළාතේ වැඩිම රෝහල් සංඛ්‍යාවක් තිබෙන්නේ. අපේ පළාතේ තිබෙන කිසිම රෝහලකින් clinical waste විවෘත බිම් තීරුවලට එන්නේ නැහැ. ඒවා අපි ප්‍රධාන රෝහල්වල තිබෙන insinator වලින් තමයි දහනය කරන්නේ. ඒ නිසා අපේ පළාතේ සායනික කසළ එන්නේ නැහැ. ඒ නිසා අපි ඒ සඳහා සායනික කසළ ප්‍රවාහනය කිරීම සඳහා අපි ලොරි තුනක් සකසා තිබෙනවා. අපි කථා කළා. ඒ පිළිබඳව කටයුතු කරන ස්වභාවික පරිසරය තුළ ඩෙංගු මර්දනය පිළිබඳව බොහොම ක්රියාකාරීව වැඩ කරන වෛද්‍ය වෙඩිසිංහ මහත්තයාත් එක්ක අපි සාකච්ඡා කළේ. දැන් අපි දන්න දෙයක් තමයි, මේ clinical waste පුද්ගලික රෝහල්වල එන්නේ අපේ ඩම්ප්වලට. සමහර වෙලාවට clinical waste තිබෙනවා කියලා compalain එන්නේ ඒ ජාවාරම් නිසා. ඒ නිසා අපි ඉදිරියේදී අපි බලාපොරොත්තු වෙනවා, clinical waste අපේ incinator වලට අරගන්න. ඒකෙන් අපට ආදායමකුත් උපයා ගන්න පුළුවන්කම ලැබෙයි. අපි ඒක අරමුණු කර ගන්නවා.*

ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ 2018 මුදල් ප්‍රකාශයෙන් රුපියල් මිලියන 906 ක ප්‍රතිපාදන සෞඛ්‍ය අංශයට ලබා දී තිබෙනවා. ඒ වාගේම පරිපූරක ඇස්තමේන්තු I යටතේ වෙන් කළ මුදල රුපියල් මිලියන 719 ක්. ඒ යටතේ රෝහල්වලට අවශ්‍ය උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 250 ක් වෙන් කර තිබෙනවා. අතීතයේ කිසිම වර්ෂයක පරිපූරක ඇස්තමේන්තු යටතේ සෞඛ්‍ය කටයුතු සඳහා මෙතරම් මුදලක් වෙන් කර නැහැ. මීට අමතරව රජය විසින් වතු රෝහල් සඳහා රුපියල් මිලියන 36 ක් ද, මීගමුව රෝහල සඳහා රුපියල් මිලියන 500 ක් ද වෙන් කර දී තිබීම අගය කළ යුතුයි.

පසුගිය අයවැය විවාදයේදී ගරු මන්ත්‍රීතුමන්ලා දැක්වූ අදහස් සැලකිල්ලට ගෙන හෝමාගම රෝහලේ අධිකරණ වෛද්‍ය සංකීර්ණයක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 31 ක් දැනටමත් වෙන් කර අවසන්. ඒ සඳහා අවශ්‍ය ඉතිරි ප්‍රතිපාදන මෙම මුදල් ප්‍රකාශය යටතේ ලබන වර්ෂය තුළ වෙන් කරනවා.

කාන්තාවන් අතර බෝ නොවන රෝග වැළඳීමට වැඩි අවදානමක් පවතින බව මෑත කාලීනව කරන ලද සමීක්ෂණයකින් හෙළි වී තිබෙනවා. විවාහ වී ඇති කාන්තාවන්ගෙන් සියයට 32 ක් අධි බර තත්ත්වයෙන් ද, සියයට 13.3 ක් ස්ථූලතාවයෙන් ද පෙළෙන බව එම සමීක්ෂණයේ දී අනාවරණය වෙලා. පිරිමි අයට සාපේක්ෂව කාන්තාවන් අතර අධි රුධිර පීඩනය, දියවැඩියාව සහ අධි රුධිර කොලෙස්ට්‍රෝල් මට්ටම් බහුල වීමෙන් මෙම තත්ත්වය තවත් තහවුරු වෙනවා. අහිතකර ජීවන රටා සහ පරිභෝජන පුරුදු මෙම තත්ත්වයට හේතු වෙලා. අපගේ සෞඛ්‍ය අංශය විසින් මෙම කරුණු තේරුම් ගෙන ඉදිරි සැලසුම් සකස් කළ යුතු යැයි මා යෝජනා කරනවා. රෝග නිවාරණ සේවා පවත්වාගෙන යාමේදී එම කාර්යාල මුහුණ දෙන ප්‍රබල ගැටළුවක් වන්නේ ප්‍රවාහන පහසුකම්වල හිඟතාවය. එයට පිළියමක් වශයෙන් මෙම වර්ෂයේදී වාහන 10 ක් මිලදී ගැනීමට ප්‍රතිපාදන සලසා දී තිබෙනවා.

*ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාහන 10 ඩෙංගුවලට නොවෙයි. ඒ වාගේම මේ වන කොට විශේෂයෙන්ම අපේ රටේ විතරක් නොවෙයි. මුළු ලෝකයේම කාන්තාවන් ගත්තොත් එහෙම දරුවන් බෝ වීමේ අගය භාගයට භාගයකින් අඩු වෙලා තිබෙනවා. ඒ පිළිබඳවත් අපි අවධානය යොමු කරන්න ඕනෑ කාරණාවක්. බරපතළ කාරණාවක්. ඒ වාගේම විශාල ගැටළුවක් තමයි මේ ඩයිලසීස් කරන එක. මේ රුධිර කාන්දු කරන එක. ඒක විශාල අභියෝගයක්. සාමාන්‍ය ජනතාවට, සාමාන්‍ය රෝගීන්ට ඒක විශාල අභියෝගයක්. මොකද, සාමාන්‍යයෙන් පෞද්ගලික රෝහල්වලින් කරන්නේ. අපි ඒ නිසා අපේ අවධානය යොමු වෙලා තිබෙනවා මේ ඩයලසීස් මැෂින් අපේ රෝහල්වලට ලබා දෙන්න. ඒවා අපි දැනටමත් සූදානම් කරලා ඒ කටයුතු අපි කර ගෙන යනවා.*

*ඒ වාගේම අර වෙන්ටලේටර් බෙඩ් කියන එක. අර හුස්ම ගන්න තිබෙන බෙඩ් එක. මට පසුගිය දවසක කාන්තාවක් දුරකථනයෙන් කථා කරලා කිව්වා, ගරු මහ ඇමතිතුමා, සාමාන්‍යයෙන් ඒ වෙන්ටලේටර් බෙඩ් එකක් ගන්න සාමාන්‍යයෙන් පෞද්ගලික රෝහලක රුපියල් ලක්ෂයකට වඩා යනවා. සල්ලි තිබ්ලත් ඒගොල්ලන්ට ඒ බෙඩ් එකක් ගන්න බැරි වුණා. ඒ නිසා ඒගොල්ලොන්ගේ ස්වාමියා නැති වුණා කියලා මහත් ශෝකයෙන් කථා කළා. සාමාන්‍යයෙන් ඒ වෙන්ටලේටර් බෙඩ් එකක් වෙන්නේ මිලියන දෙකක් විතර. සාමාන්‍යයෙන් සල්ලි තිබෙන ගෙවල්වල මම දැක්කා මේ ළඟදීත් ගියාම ඒ බෙඩ් එකක් සමහර ළමයි තමන්ගේ දෙමව්පියන්ට සල්ලි දීලාම ගෙනැල්ලා තියා ගන්නවා. මම මේ ළඟදී ගිය අවමංගල්‍යයකදී ඒගොල්ලෝ අවුරුදු හතක් විතර තමන්ගේ අම්මාව ඒ වෙන්ටලේටර් බෙඩ් එකේ තියලා තිබ්බා. එතකොට සාමාන්‍ය මිනිස්සුන්ට කරන්න හැකියාවක් නැහැ. ඒ නිසා මම ගරු ඇමතිතුමාට යෝජනා කරනවා, අපේ වෙන් වන ප්‍රතිපාදනවලින් වෙන්ටලේටර් බෙඩ් අපේ රෝහල්වලට ඩයලසීස් මැෂින් එක්ක ලබා දෙන්නය කියලා.*

**දේශීය වෛද්‍ය සේවය**

ගරු සභාපතිතුමනි, අවුරුදු 100 කට වඩා ඉපැරණි ඉතිහාසය ගතහොත්, අපේ රටේ පැවතියේ දේශීය වෛද්‍ය ක්‍රමය හා බැඳුණු සමාජමය ව්‍යුහයක්. මෙම ක්‍රමය පාරම්පරික වීම මත තරුණ පරපුර දේශීය වෛද්‍ය ශාස්ත්‍රය ඉගෙන නොගැනීමත්, මිනිසුන්ගේ කාර්යබහුල ජීවන රටාවත් නිසා බටහිර වෛද්‍ය ක්‍රමය වැළඳ ගැනීම සිදුවුවත් වර්තමානයේ නැවත වරක් මිනිසුන් දේශීය වෛද්‍ය ක්‍රමයට නැඹුරුවන බව පෙනී යනවා. නොයෙක් හේතු මත, විශේෂයෙන් වැඩිහිටි ජනතාව නිදන්ගත රෝග සඳහා දේශීය වෛද්‍ය ක්‍රමයේ සහය පතන බව අපි කවුරුත් දන්නා කරුණක්. අපගේ වෛද්‍ය මධ්‍යස්ථානවලින් වර්ෂයකට ලක්ෂ හයකට ආසන්න සංඛ්‍යාවක් බාහිර ප්‍රතිකාර ගැනීමෙන් සහ හය දහසකට වැඩි පිරිසක් අභ්‍යන්තරව ප්‍රතිකාර ගැනීමෙන් මෙය මනාව පැහැදිලි වෙනවා.

*දේශීය වෛද්‍ය එක කොයි තරම් හොඳ වුණත් සමහර වෙලාවට දේශීය වෛද්‍යවරුන්ගේ ඇතැම් කෘතිම වට්ටෝරු, දෙන වට්ටෝරු නිසා දැඩි අවධානමක් තිබෙනවා. විශේෂයෙන්ම සීනි රෝගය සම්බන්ධයෙන් දෙන වට්ටෝරු මම හිතන්නේ, ඒගොල්ලෝ විසින් නිර්මාණය කර ගත්ත බටහිර හා දේශීය mix කරලා*

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

*අරගෙන තිබෙන්නේ. කලවම් කරලා අරගෙන තිබෙන්නේ. ඒකත් රෝගීන්ට දැඩි අවධානම් තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා.*

පසුගිය කාලයේ සෞඛ්‍ය සේවාව නිසි අයුරින් සැපයීම සඳහා පැවති ප්‍රබල බාධාවක් තමයි කාර්යය මණ්ඩලයේ පැවති හිඟකම. විශේෂයෙන් ප්‍රජා සෞඛ්‍ය සේවා කටයුතු සඳහා එම වෛද්‍ය නිලධාරීන්ගේ අඩුව ප්‍රබලව බලපෑවා. මෙම වර්ෂයේදී ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් 69 දෙනෙක්, ආයුර්වේද සේවා සහායකයින් 48 දෙනෙක්, උපස්ථායකයින් 12 දෙනෙක්, ඖෂධ සංයෝජකයින් 12 දෙනෙක් බඳවා ගැනීමෙන් පුරප්පාඩු සම්පූර්ණ කර ගෙන ග්‍රාම නිලධාරී කොට්ඨාස ආවරණය වන පරිදි රාජකාරීවල යොදවා තිබෙනවා.

දැනට වර්ෂ කිහිපයකට පෙර ආයුර්වේද රෝහල්වල ඖෂධ හිඟයක් ගැන කථා කළත් වර්තමානයේ එවැනි තත්ත්වයක් නැහැ. ඖෂධ වර්ග සැකසීම, ඒවා ලබා ගැනීම සහ ගබඩා කර තබා ගැනීමට ක්‍රමවේද සකසා තිබෙනවා. කිසි අඩුවකින් තොරව අවශ්‍ය ඖෂධ මිලදී ගැනීම සඳහා ලබන වර්ෂයට රුපියල් මිලියන 116 ක ප්‍රතිපාදන ද මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මහ ඇමතිතුමනි, මේ අවස්ථාවේදී මූලාසනයට ගරු සභාපතිතුමා පැමිණෙනවා.

***ඊට අනුකූලව ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] left the Chair and Hon. Chairman [Mr. Sunil Wijeratne] took the Chair*

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ප්‍රජා සෞඛ්‍ය සේවාවේදී වඩාත් සාර්ථක සේවයක් අපගේ ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් සිදු කරනවා. රෝග සුව කිරීමට වඩා රෝග සෑදීම වළක්වා ගැනීම මෙම සේවාවේ අරමුණයි. මෙම වර්ෂයේ පහත කරුණු යටතේ රුපියල් මිලියන 8 ක් වෙන් කර වැඩසටහන් 691 ක් පැවැත්වීමට ඉලක්ක කර ඇති අතර ඒවායින් 598 කටත් වඩා දැනටමත් පවත්වා අවසන්.

1. පෝෂ්‍යදායී දේශීය ආහාර වර්ග හඳුනා ගැනීම සහ ඒවා සකස් කිරීම.
2. නිශ්චිත හේතු කාරකයක් හඳුනා නොගත් වකුගඩු රෝග නිවාරණය.
3. වැරදි ආහාර රටාවන්ට හුරු වීම වළක්වා ගැනීම.
4. බෝ නොවන රෝගවලින් මුදවා ගැනීම සඳහා දේශීය පාන වර්ග ප්‍රචලිත කිරීම.
5. කැඩුම් බිඳුම්, සර්ප විෂ හා සර්වාංග වෛද්‍යවරුන්ගේ දැනුම යාවත්කාලීන කිරීම.

මෙවැනි වැඩසටහන් ඉදිරි වර්ෂය තුළ ද පැවැත්වීම සඳහා රුපියල් මිලියන 10 ක් ලබන වර්ෂයට ද වෙන් කරනවා.

ඒ වාගේම ආයුර්වේද ක්ෂේත්‍රයේ ඉදිකිරීම් ඇතුළු අනෙකුත් සියලු කාර්යයන් සඳහා රුපියල් මිලියන 743 ක ප්‍රතිපාදන මෙම මුදල් ප්‍රකාශය යටතේ වෙන් කරනවා.

*ගරු සභාපතිතුමනි, අර ඩෙංගු කථාව කියන කොට මට එක කාරණයක් කියන්න බැරි වුණා. ඩෙංගු සම්බන්ධයෙන් දූමායනය සම්බන්ධයෙන් මාව දැනුවත් කරපු වෛද්‍යවරයාට අපේ වෛද්‍යවරු ප්‍රබල ලෙස චෝදනා නගනවා. හේතුව තමයි, මොකද අපේ MOH ලා - මම මේක ප්‍රසිද්ධියේ ජනාධිපතිතුමා ඉන්න රැස්වීමකදීත් කිව්වා. මේගොල්ලෝ කරන්නේ ප්‍රසිද්ධියේ දූමායනය කරලා ජනතාවගේ මනසට සතුටක් ලබා දෙනවා. තාවකාලික වින්දනයක් ලබා දෙනවා. එතකොට ඒගොල්ලෝ fogin කළා කිව්වාම ඒගොල්ලොන්ගේ job එක ඉවරයි. ඒකෙන් පරිසරයට මොනවාද වෙන්නේ? ජීවීන්ට මොනවාද වෙන්නේ. අපට මොනවාද වෙන්නේ කියලා නොවෙයි. අපේ MOH ලා පුරුදු වෙලා තිබෙන්නේ fogin කරලා මිනිස්සුන්ගේ මනස හදන්න. ඒක සම්පූර්ණ අසාර්ථක ක්‍රමයක් බව මම මේ අවස්ථාවේ මතක් කරනවා.*

*ඒ වාගේම අපි පාරම්පරිකව දේශීය වෛද්‍ය ගැන කථා කරන කොට අපි විශේෂයෙන්ම අවධානය යොමු කරන්න ඕනෑ. මේ දේශීය වෛද්‍ය ක්‍රමය හොඳටම කරන, බෙහෙත් කලවම් නොකරන, නියමාකාරයෙන් ඖෂධ යොදලා බෙහෙත් නිෂ්පාදනය කරන ඒ පාරම්පරිකව කරන*

*වෛද්‍යවරු කැමැති නැහැ ගරු සභාපතිතුමනි, ඒ වට්ටෝරු ආයුර්වේද දෙපාර්තමේන්තුවට දෙන්න. මොකද, එහෙම ඒ වට්ටෝරු දුන්නාම ඒ වට්ටෝරු හොරකම් කර ගෙන ගිහිල්ලා ඒගොල්ලෝ වෙනත් දේවල් කරන නිසා. දැන් ඒකෙන් වෙලා තිබෙන්නේ, පාරම්පරික ඇතැම් වෛද්‍යවරුන්ට බලපත්‍රය ගන්න විධියක් නැහැ, වෛද්‍යවරු හැටියට. අන්න ඒකත් අපි මේ දේශීය වෛද්‍ය ක්‍රමයේ දකින විශාල බරපතළ කාරණාවක්.*

**සමාජ සේවා**

ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකාව තුළ විශේෂයෙන් බස්නාහිර පළාතේ වේගයෙන් වෙනස් වෙමින් යන සමාජ, ආර්ථික පරිසරයට අනුගතව වැඩිහිටි නිවාස සඳහාත්, ආබාධ සහිත වූවන්ගේ පුහුණු මධ්‍යස්ථාන සහ නිවාස සඳහාත්, සමාජගත ඉල්ලුම ඉහළ නගිමින් පැවතීමත්, ඒ සඳහා පෞද්ගලික අංශයේ මැදිහත් වීමත් දකින්න පුළුවන්. පෞද්ගලික අංශයේ මැදිහත් වීම හොඳ ප්‍රවණතාවයක් වුවත් ඒවායේ අවිධිමත්භාවය, ප්‍රමිතියකින් තොරව කටයුතු කිරීම පිළිබඳව අපට වගකීමක් තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය නීති සම්පාදනයටත්, නීති මනාව ක්‍රියාත්මක කිරීමටත් පසුබිම දැනට සකසා ඇති අතර ලබන වර්ෂයේ ඒවා ක්‍රියාත්මක කිරීම අපගේ ඉලක්කය යි.

සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ සිදු කරන ප්‍රබල සේවාවක් තමයි මහජන ආධාර ලබා දීම. ඒ සඳහා අති විශාල මුදලක් වැය කරනවා. මහජන ආධාර ලබන්නන් මා හමුවීමේදී මෙම මුදල වැඩි කර දෙන ලෙස නිරන්තර ඉල්ලීම් කරනවා. එම ඉල්ලීමට කන් දෙමින් දෘෂ්‍යාබාධිත අයට දැනට ගෙවන මුදල වන රුපියල් 1,500 මෙම වර්ෂයේ අගෝස්තු මාසයේ සිට මම රුපියල් 3,000 දක්වා වැඩි කළා. රෝගාධාර, විශේෂිතාධාර වැනි අනෙකුත් සියලු මහජන ආධාර 2019 වර්ෂයේ ජනවාරි සිට දැනට ගෙවන මුදල මෙන් දෙගුණයක් කිරීමට මා යෝජනා කරන අතර ඒ සඳහා අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන වශයෙන් රුපියල් මිලියන 50 ක් වෙන් කරනවා. ඒ අනුව ලබන වර්ෂයේ මහජනාධාර ගෙවීම සඳහා සම්පූර්ණයෙන් වෙන් කරන මුදල රුපියල් මිලියන 330 ක්.

අනෙකුත් සියලු වේදනාවන් දරා ගන්න පුළුවන් වුවත් ගරු සභාපතිතුමනි, ඔබටත් කවදාහරි "හුදකලාව" කියන වේදනාව තමයි දරා ගන්න අපහසුම වේදනාව වෙන්නේ. වැඩිහිටියන්ට මෙම වේදනාවේ බරපතළකම වැඩියි. ඔවුන්ව මෙයින් මුදවා ගැනීම අපේ වගකීමක් වාගේම යුතුකමක් ද වෙනවා. වැඩිහිටියන්ට එකට එකතු වී කටයුතු කිරීමේ ස්ථාන, විනෝදාස්වාදය සපයන ස්ථාන වාගේම එම වැඩසටහන් ද අපි සංවිධානය කළ යුතුයි. ලබන වර්ෂයේ එහි මූලාරම්භයක් වශයෙන් අවශ්‍ය කටයුතු කිරීම සඳහා රුපියල් මිලියන 10 ක ප්‍රතිපාදන වෙන් කිරීමට මා යෝජනා කරනවා.

*ඒ වාගේම ආබාධ සහිත දරුවන්ගේ සංස්කෘතික, ක්‍රීඩා හා විශේෂ දක්ෂතා හඳුනාගෙන එම දරුවන්ගෙන් සමන්විත සංචිතයක් ඇති කිරීමත්, එම සංචිතය තුළ ඔවුන්ට අවශ්‍ය පුහුණුවීම් ලබා දී ජාතික හා ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒමට කටයුතු කිරීමටත් අපි අපේක්ෂා කරනවා.*

**ළමාරක්ෂක කටයුතු**

ගරු සභාපතිතුමනි, අපගේ පරිවාස දෙපාර්තමේන්තුව යටතේ පරිවාස කාර්යාල 12 ක්, සහතික කළ පාසල් 2ක්, රැඳවුම් නිවාස 2 ක් සහ භාර ගැනීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන අතර, එමගින් දරුවන් 5,000 ක් පමණ නේවාසිකව සිටින ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන 120 ක් අධීක්ෂණය කිරීමේ කාර්යය ද කරනවා.

දරුවන්ට විවිධ ක්ෂේත්‍රවල වෘත්තීය පුහුණුව ලබා දීම, මානසික සුබ සාධනයට විවිධ වැඩසටහන් පැවැත්වීම, සුදුසු දෙමව්පියන්ට දරුවන්ව හදා වඩා ගැනීමට දීම, රැකියා ලබා දීම, විවාහ කර දීම, ළමා සංවර්ධන මධ්‍යස්ථානවල දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නීති රීති පැනවීම, ළමා සංවර්ධන මධ්‍යස්ථානවලට ආධාර ලබා දීම පරිවාස දෙපාර්තමේන්තුවේ මූලික කාර්යය භාරයන්.

දරුවන්ගේ මානසික සුවය සඳහා චිත්‍ර 500 ක් ඇතුළත් චිත්‍ර ප්‍රදර්ශනයක් සෞන්දර්යය විශ්ව විද්‍යාලයේ පැවැත්වූ අතර ළමා දින උත්සවය පවත්වා පිරිනමන ලද ත්‍යාග සහ සහතික පත්‍ර ප්‍රමාණය 650 ක්. ඒ වාගේම මෙම වර්ෂයේදී යශෝධරා, රයිගමයයි ගම්පලයයි චිත්‍රපටය සහ ගුත්තිල කාව්‍ය වේදිකා නාට්‍යයන් නැරඹීමට අවස්ථාව ලබා දී තිබෙනවා. ඒ වාගේම දරුවන්ගේ යහපත උදෙසා රැඳවුම් නිවාස සහ සහතික කළ පාසල්වල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා මෙම වර්ෂයේ රුපියල් මිලියන 57.4 ක් වෙන් කර ඇති

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

අතර නඩත්තු ආධාර වෙනුවෙන් වෙන් කර ඇති මුදල රුපියල් මිලියන 33 ක්.

මෙම සියලු දරුවන්ගේ රැකවරණය සහ ආරක්ෂාව සැපයීම මාගේ වගකීමක් සහ යුතුකමක් සේ සලකා 2019 වර්ෂයට ද පරිවාස කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 274 ක ප්‍රතිපාදන වෙන් කරනවා.

## වනිතා කටයුතු

ගරු සභාපතිතුමනි, රටේ සමස්ත ආර්ථික වර්ධනය ළඟා කර ගැනීමේදී කාන්තාවන්ගේ, විශේෂයෙන් තරුණියන්ගේ දායකත්වය ඉතාම වැදගත්. ජනගහනයෙන් සියයට 52 ක් කාන්තාවන් වන අතර එයින් වයස අවුරුදු 19 හා 34 අතර වයස් කාණ්ඩයට අයත් කාන්තාවන් සංඛ්‍යාව ජනගහනයෙන් සියයට 25 ක්. පුරෝකථන සංඛ්‍යා ලේඛන අනුව වසර 2041 වනවිට අපේ රටේ ජනගහනයෙන් සියයට 25 ක් වයස අවුරුදු 60 ට වැඩි පිරිස වෙනවා. එයිනුත් වැඩි පිරිසක් කාන්තාවන්. එම නිසා අපගේ ප්‍රතිපත්තීන් ජනගහන සංයුතියේ ප්‍රතිඵල නෙලා ගැනීමට සුදුසු අයුරින් සකසා ගත යුතුයි.

ස්වයං රැකියාවල නියුතු කාන්තාවන් ගතහොත් එය සියයට 28.9 ක්. ස්වයං රැකියාවන්හි නියුතු පුරුෂයන්ගේ අනුපාතය සියයට 71.1 ක්. අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් අත්කර ගන්නා කාන්තාවන් සංඛ්‍යාව ඉහළ ගියත් ශ්‍රම බලකායේ තිබෙන්නේ ඌණ කාන්තා උපයෝජනයක්. කාන්තාවන් ආර්ථිකමය වශයෙන් අක්‍රීය වීමට ප්‍රධානතම හේතුව ඔවුන් ගෘහස්ථ කටයුතුවල යෙදීමයි. සිංගප්පූරුව, චීනය, පිලිපීනය සහ තායිලන්තය වැනි රටවල් සමඟ සැසඳීමේදී, ශ්‍රී ලංකාවේ රාත්‍රී වැඩමුර සහ මාතෘ නිවාඩු පිළිබඳ විධිවිධාන සම්බන්ධයෙන් පසුගාමී තත්ත්වයක් පැවතීමත් මෙයට හේතුවයි. නම්‍යශීලී පැය පදනම මත අර්ධකාලීන රැකියා අවස්ථා, වැඩිදියුණු කළ ප්‍රවාහන පහසුකම් සහ ළමා හා වැඩිහිටි සුරැකුම් පහසුකම් ඇති කිරීමෙන් කාන්තා ශ්‍රම සහභාගීත්වය ඉහළ නංවන්න පුළුවන්. රජයේත්, පළාත් සභාවේත් අවධානය මේවා කෙරෙහි යොමු විය යුතු බව මාගේ විශ්වාසය යි.

## ප්‍රවාහන ජාලය

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත තුළ වෙසෙන ජනතාව සිය දෛනික ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීමේදී විවිධ ප්‍රවාහන මාධ්‍යයන් පරිහරණය කරන බව අපි කවුරුත් දන්නා කරුණක්. මෙම ප්‍රවාහන මාධ්‍ය ස්වාධීනව ක්‍රියාත්මක වීම නිසා මේවා අතර මනා සම්බන්ධයක් නැහැ. ඒ හේතුවෙන් මගීන් අපේක්ෂා කරන ගුණාත්මක පොදු ප්‍රවාහන සේවාවක් මේ දක්වා පළාත තුළ ස්ථාපිත වී නොමැති බව ජනතාවගේ පිළිගැනීමයි. එමනිසා මගී ජනතාව පෞද්ගලික ප්‍රවාහන සේවාවන් වෙත යොමු වීම වැළැක්විය නොහැකි තත්ත්වයට පත් වෙලා. 2016 වසරට සාපේක්ෂව 2017 වසරේ දී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මගී කිලෝ මීටර් ප්‍රමාණය සියයට 1.8 කින්ද, පෞද්ගලික බස් රථ මගී කිලෝ මීටර් ප්‍රමාණය සියයට 2.4 කින් ද අඩු වීමෙන් මෙම තත්ත්වය මනාවට පැහැදිලි වෙනවා.

ත්‍රී රෝද රථ, පාසල් වෑන් රථ සහ කාර්යාලයීය ප්‍රවාහන වෑන් රථ යන ප්‍රවාහන මාධ්‍යය තුනම, නියාමන ක්‍රමවේදයක් නොමැතිව අක්‍රමවත් ආකාරයට සීඝ්‍රයෙන් වර්ධනය වෙනවා. මේ වන විට පළාත තුළ කාර්යාලයීය ප්‍රවාහන පහසුකම් සපයන වෑන් රථ 850 ක් පමණ පවතිනවා. කර්මාන්තයේ දියුණුවට සහ විශ්වාසනීයත්වය තහවුරු කිරීම පිණිස නියාමන කාර්යයට මෙම රථ ක්‍රියාකරුවන් එකඟ නොවේ යැයි විශ්වාස කරන්න බැහැ. මෙම නියාමන යාන්ත්‍රණය තුළ සියලු රථ ලියාපදිංචි විය යුතුයි. ඒ සමඟම මෙම නියාමන අධිකාරිය විසින් කර්මාන්තයට අදාළ යෝග්‍යතා පරීක්ෂණ ද කර්මාන්තය දියුණු කිරීමට අවශ්‍ය පුහුණු වැඩසටහන් ද කාලානුරූපීව සකස් කළ යුතු වෙනවා. මෙකී කාර්යය වැදගත් කරුණක් සේ සලකා අවශ්‍ය ප්‍රතිපාදනවලින් කොටසක් හෝ ලබන වර්ෂය තුළ වෙන් කරනවා.

මාර්ග අනතුරු අවම කිරීම සඳහා හැකිතාක් දුරට කටයුතු කිරීම ද පළාත් මගී ප්‍රවාහන අධිකාරියට පැවරී ඇති කාර්යයක්. ඒ අනුව බස්නාහිර පළාතේ ලියාපදිංචි මාර්ග බලපත්‍ර සහිත බස් හිමියන්, බස් රියදුරන් සහ කොන්දොස්තරවරුන් සඳහා මාර්ග අනතුරු අවම කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රියාත්මක කරනවා. මෙහිදී ප්‍රධාන වශයෙන් මාර්ග පද්ධතියේ ප්‍රමිතිය, මාර්ග නීති, මාර්ග විනය හා අධික වාහන තදබදය අවම

කිරීම සම්බන්ධ උපදේශන සේවා මෙම වැඩමුළු මගින් ලබා දෙනවා.

මෙම සියලු කාර්යයන් සඳහා ලබන වර්ෂය තුළ පළාත් මගී ප්‍රවාහන අධිකාරියට වෙන් කරන මුදල රුපියල් මිලියන 230 ක්.

*ඒ වාගේම පෞද්ගලික බස් රථ සඳහා GPS තාක්ෂණ ක්‍රමවේදය හඳුන්වා දෙමින්, බස් රථය බස් නැවතුම්පලට පැමිණෙන වේලාවන් පිළිබඳව ජනතාවට දැනුවත් වීමේ ක්‍රමවේදයක් සකස් කිරීමටත් අප බලාපොරොත්තු වෙනවා. ඒ විතරක් නොවෙයි. මීට යාබදව මාළඹේ නගරයේ සිට 2025 වන විට **light railway**, උඩින් යන සැහැල්ලු දුම්රිය මාර්ගය ද දැන් මේ වන කොට මාළඹේ සිට කොළඹ දක්වා ඒ වැඩ කටයුතු ආරම්භ වෙමින් තිබෙනවා.*

**පළාත් මාර්ග සංවර්ධනය**

ගරු සභාපතිතුමනි, රටක සංවර්ධනය, මාර්ග ජාලය සමඟ ඍජු වශයෙන් හෝ වක්‍ර වශයෙන් සම්බන්ධයි. ඒ නිසා ආර්ථික සංවර්ධනයේ දී මාර්ග අංශයේ දායකත්වය ඉතා වැදගත් ස්ථානයක් ගන්නවා. මාර්ග යටිතල පහසුකම් සංවර්ධනයට කරනු ලබන ආයෝජනය සමස්ත ආර්ථිකයේ ඵලදායීතාවය වැඩි කිරීමට ද ප්‍රබල හේතුවක්. සංඛ්‍යා ලේඛන අනුව මෙරට මගී ප්‍රවාහනය සඳහා වසරකට ඇති ඉල්ලුමෙන් සියයට 93 ක් ද, භාණ්ඩ ප්‍රවාහනය සඳහා වසරකට ඇති ඉල්ලුමෙන් සියයට 97 ක් ද සපයනු ලබන මාධ්‍යය, මාර්ග ජාලය යි.

අනෙකුත් පළාත් සමඟ සැසඳීමේදී බස්නාහිර පළාතේ තමයි වැඩිම පළාත් මාර්ග ප්‍රමාණයක් කාපට් කරලා තිබෙන්නේ. ඔන්න එනවා subject එකට. පළාත් මාර්ගවලින් සියයට 75 කට ආසන්න ප්‍රමාණයක් කාපට් කරලා අවසන්. නමුත් දිස්ත්‍රික්ක අනුව ගත් විට විෂමතාවයක් පවතිනවා. දිස්ත්‍රික්ක අනුව ප්‍රතිශතයන් ගතහොත්, මහරගම හෝ කොළඹ නොවෙයි. ගම්පහ දිස්ත්‍රික්කයේ තමයි සියයට 91 ක් කාපට් කරලා අවසන් කරලා තිබෙන්නේ. කොළඹ සියයට 67 යි. තව කරන්න තිබෙනවා. කළුතර තමයි අඩුම. එය සියයට 59 යි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මිස්ට ටෙන් පසන්ට් කෙනෙක් හිටියා නම් මේ පැත්තෙත් වැඩේ කෙරෙයි. ඒකයි ප්‍රශ්නය. කොළඹට කළුතරට නැහැ නේ?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

*ආ. ටෙන් පසන්ට්* - එම නිසා ඉදිරි වර්ෂයේදී මාර්ග කාපට් කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමේදී කළුතර දිස්ත්‍රික්කය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම කළ යුතුයි. *හැබැයි, අපි හුඟක් විශ්වාස කළා මේ I - road ව්‍යාපෘතිය යටතේ කළුතරට සාධාරණයක් වෙයි කියලා. නමුත් ඒක වෙලා නැහැ.* කෙසේ වුවද, පසුගිය වර්ෂයේ කළුතර දිස්ත්‍රික්කයේ ගංවතුරෙන් හානි වූ පාරවල් ප්‍රතිසංස්කරණය සඳහා පළාත් මාර්ගවලට රුපියල් මිලියන 140 ක් සහ පළාත් නොවන මාර්ගවලට රුපියල් මිලියන 236 ක් වැය කරලා මාර්ග කිලෝ මීටර් 43 ක් සංවර්ධනය කර තිබෙනවා.

*ඒ වාගේම අපි දැන් විශේෂයෙන්ම පළාත් පාලන ආයතන පිහිටුවලා තිබෙනවා. අපි ආරම්භ කරලා තිබෙනවා, මේ පළාත් පාලන ආයතන හරහා කාපට් කරන්න. මම හිතනවා, අපි පළාත් පාලන ආයතන හරහා පාරවල් කාපට් කිරීම ආරම්භ කළොත් එහෙම අපට ඒ ඉලක්කයන් සපුරා ගන්න පුළුවන් වෙයි කියලා.*

2019 වර්ෂයේ ලෝක බැංකු ආධාර ලබා ගෙන අදියර 2 ක් යටතේ පළාත් මාර්ග කිලෝ මීටර් 96 ක් කාපට් කිරීම අපේ බලාපොරොත්තුවයි. ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල රුපියල් මිලියන 1,505 ක්. මෙම අදියර දෙක ද අවසන් වූ පසු කාපට් කරන ලද පළාත් මාර්ග ප්‍රමාණය සියයට 80 දක්වා වැඩි වෙනවා.

පළාත් මාර්ග පමණක් නොවෙයි, ග්‍රාමීය මාර්ග සංවර්ධනයේදී ද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විශාල වගකීමක් උසුලනවා. පසුගිය වර්ෂයේදී ග්‍රාමීය මාර්ග කිලෝ මීටර් 123 ක්, පාලම් බෝක්කු 33 ක්, කාණු පද්ධති 4 ක් හා පැති බැම් 23 ක් ඉදි කළ අතර ඒ සඳහා වැය කළ මුදල රුපියල් මිලියන 910.8 ක්.

පළාත් මාර්ග සංවර්ධනය සහ නඩත්තුව සඳහා පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට මෙම මුදල් ප්‍රකාශයෙන්

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

රුපියල් මිලියන 400 ක් වෙන් කරන අතර මීට අමතරව බස්නාහිර පළාත් නගර සංවර්ධන අමාත්‍යාංශයෙන් ද අතිරේක ප්‍රතිපාදන ලැබේ යැයි අපි බලාපොරොත්තු වෙනවා.

*බස්නාහිර පළාතේ මාර්ග තදබදය අවම කිරීම සඳහා තෝරා ගත් නගර කිහිපයක් ආවරණය වන පරිදි අධිවේගී මාර්ග හා සමාන කෙටි දුර මාර්ග කිහිපයක් ඉදිරි වර්ෂය තුළ ඉදි කිරීමට සැලසුම් කර ඇත. මෙමගින් ප්‍රධාන නගර අතහැර ධාවනය කිරීමට හැකි වන අතර, මාර්ග තදබදය අවම වීමෙන් පළාත් සභාවට අමතර ආදායමක් ලබා ගැනීමත් අපගේ අපේක්ෂාවයි.*

## සමුපකාර ක්ෂේත්‍රය

ගරු සභාපතිතුමනි, ග්‍රාමීය සුළු පරිමාණ ගොවියාගේ සහ කාර්මිකයන්ගේ ණයගැතිභාවය, ව්‍යාපාරික ගැටළු සහ වෙනත් සමාජ ගැටළුවලට විසඳුම් ලෙස ශත වර්ෂයකට පෙර ආරම්භ වූ සමුපකාර ව්‍යාපාරය සමස්ත ශ්‍රී ලංකාව පුරාම පැතිරුණු ව්‍යවසායක් සේ ක්‍රියාත්මකයි. ග්‍රාමීය පාරිභෝගිකයන්ට අත්‍යාවශ්‍ය හා හිඟ ආහාර ද්‍රව්‍ය සැපයීම, වියළි සලාක සහ දිළිඳු සහනාධාර බෙදා හැරීම, සකසුරුවම් හා ඉතිරි කිරීම් දිරිගන්වන්නෙකු සහ ආයෝජකයෙකු වශයෙන් ක්‍රියා කිරීම, ජාතික ආපදා සහ ස්වභාවික විපත් අවස්ථාවලදී සහන සේවා සැපයීම, ග්‍රාමීය ණයගැතිභාවයට විසඳුම් සැපයීමට සහාය වීම ආදී වූ විශාල කාර්යභාරයක් සමුපකාර ව්‍යාපාරයෙන් සිදු වුණා.

එහෙත් 1978 න් පසු විවෘත ආර්ථික ක්‍රමය නිසා ඇති වූ තරඟකාරී වෙළෙඳපොල ක්‍රමයට මුහුණ දී ගත නොහැකිව සමුපකාර ව්‍යාපාරයේ ඉදිරි ගමන අඩාල වීමක් පසුගිය කාලය පුරාම දක්නට ලැබුණු තත්ත්වයක්. මෙය වර්තමානය වන විට තවත් උග්‍ර වෙලා. විවිධ සේවා සමුපකාර සමිති 38 ක්, කෝප් සිටි ලෙස ක්‍රියා කරන වෙළෙඳ ඒකක 774 ක්, ගබඩා 56 ක්, ඉන්ධන පිරවුම්හල් 42 ක් සහ ග්‍රාමීය බැංකු 543 ක් මගින් පාරිභෝගික ජනතාවට විශාල සේවයක් කළ හැකි ජාලයක් පැවතිය ද, සමුපකාර අංශය තුළින් එම සේවය සාර්ථකව ලබා ගත නොහැකි වී ඇත්තේ පාරිභෝගික අංශය පාඩු ලබන නිසයි. කෙසේ හෝ මේවා ලාභ ලබන තත්ත්වයට පත් කළ යුතුයි. ඒ සඳහා ඉල්ලුමට සරිලන සැපයුමක් ඇති කිරීම කෙරෙහි සහ ව්‍යවසායකත්ව වෙනසක් කෙරෙහි අවධානය යොමු කළ යුතුයි. අවදානමක් භාර නොගෙන ලාභයක් ලැබිය නොහැකි බව අපි කවුරුත් දන්නා න්‍යායයක්. සමුපකාර ව්‍යාපාරය ද එම අවදානම භාර ගැනීමට කටයුතු කළ යුතුයි.

ඉල්ලන දේ නොසැපයීමෙන් සමුපකාර පාරිභෝගික අංශය පාඩු ලබන විට, මා මීට පෙර අයවැයවල ද ප්‍රකාශ කර ඇති පරිදි සමුපකාර ග්‍රාමීය බැංකුවල ඵලදායී කටයුතුවල යොදා නොගන්නා විශාල මුදල් ප්‍රමාණයක් තවමත් නිශ්ක්‍රියව තිබෙනවා. ස්ථාවර තැන්පතු වශයෙන් තබා ගැනීමට නොව, සාමාජිකයින්ගේ, පළාතේ ජනතාවගේ යහපතට මෙම මුදල් ආයෝජනය කිරීමට ග්‍රාමීය බැංකු පෙළඹවීමට සමුපකාර දෙපාර්තමේන්තුව කටයුතු කළ යුතුයි. ඒ සඳහා වැඩ සැලැස්මක් සකසන ලෙසට මා දැනටමත් සමුපකාර දෙපාර්තමේන්තුවට උපදෙස් දී තිබෙනවා.

*ගරු සභාපතිතුමනි, මේ ස්ථාවර තැන්පතු වශයෙන් තබා ගැනීමට නොව සාමාජිකයන්ගේ, පළාතේ ජනතාවගේ යහපතට මුදල් ආයෝජනය කිරීම යන්න කියමින් අප අදහස් කරන්නේ ඒ බැංකුවල තිබෙන මුදල් පුද්ගලික බැංකුවලට දාලා ප්‍රතිලාභ ලබන එක නොවෙයි. මම මේක දැනටමත් නවත්වන්න කියලා චක්‍රලේඛ ගහලා, උපදෙස් දීලා, සාකච්ඡා පවත්වලා, ගරු ඇමතිතුමාත් එක්ක එකතු වෙලා සම්පූර්ණයෙන්ම නතර කරලා තිබෙන්නේ. මොකද, මේ වන කොට අවිස්සාවේල්ල, දෙහිවල ආදී තැන්වල සම්පූර්ණයෙන්ම පෞද්ගලික බැංකුවල මුදල් යොදලා ඒ මුදල් අස්ථාවර වෙලා තිබෙන්නේ. ඒ නිසා මම විශේෂයෙන්ම අවධාරණය කරන්න ඕනෑ. බස්නාහිර පළාතේ සමුපකාරයට අයත් ග්‍රාමීය බැංකුවේ රුපියලක්වත් පුද්ගලික බැංකුවක තිබෙන්න පුළුවන්කමක් නැහැ. ගන්න කියලා තිබෙන්නේ. ඒ දින අනුව ගන්න කියලා තිබෙන්නේ.*

## කර්මාන්ත ක්ෂේත්‍රය

ගරු සභාපතිතුමනි, රෙදිපිළි, නිමි ඇඳුම්, සම් සහ සම් ආශ්‍රිත නිෂ්පාදන කටයුතු පසුගිය වසරේදී සියයට 5.7 කින් වර්ධනය වී තිබෙනවා. විශේෂ ප්‍රතිලාභ සහිත වෙළෙඳ වරණ පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී.ප්ලස්) නැවත ස්ථාපනය වීම මෙම වර්ධනයට ප්‍රබලම හේතු සාධකය යි. මේ පිළිබඳව අපි අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත විය

යුතුයි. එතුමාගේ දූරදර්ශී වැඩපිළිවෙල නොවේ නම් ජී.එස්.පී.ප්ලස් සහනය අපට නැවත ලැබෙන්නේ නැහැ.

පළාතේ හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ නිෂ්පාදන ප්‍රවර්ධනය වෙනුවෙන් පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව කරනු ලබන කාර්යභාරය සුවිශේෂයි. කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි හස්ත කර්මාන්ත ශිල්පීන් 745 ක් පමණ සිටිනවා. ක්‍රාෆ්ට් ලංකා අලෙවි සැල් ජාලය මගින් ඔවුන්ගේ නිෂ්පාදනයන්ට වෙළෙඳපොල අවස්ථා නිර්මාණය කර දෙන නිසා අලෙවිකරණය පිළිබඳ ගැටළුවකට එම නිෂ්පාදකයන් මුහුණ දෙන්නේ නැහැ. ඒ වාගේම ඔවුන්ගේ ආදායම ද එමගින් ස්ථාවර වී තිබෙනවා.

රෙදිපිළි නිෂ්පාදනය පමණක් නොවෙයි "*පාසල් ඩෙස් පුටු* " නිෂ්පාදනය ද මේ වර්ෂයේ කර්මාන්ත දෙපාර්තමේන්තුව වෙත පැවරුවා. කැලි පදනම මත සේවා නියුක්ත කාර්මික ශිල්පීන්ගේ සහාය ලබා ගෙන 2018 අගෝස්තු වන විට රුපියල් මිලියන 63 ක ඩෙස් පුටු 9,448 ක් නිෂ්පාදනය කර පාසල් වෙත භාර දී අවසන්. කාර්මික ශිල්පීන්ට ගෙවූ වැඩ කුලිය පමණක් රුපියල් මිලියන 11.7 ක්. ඒ වාගේම "*බිඳුණු පුටුවට දැතේ සවිය* " වැඩ සටහන යටතේ 2015 වර්ෂයේ සිට මේ දක්වා පාසල් 259 ක ඩෙස්, පුටු සහ ගුරු මේස 30,392 ක් අළුත්වැඩියා කර භාරදී තිබෙනවා.

වර්තමානයේ "*හීන් නූල්* " සාරි නිෂ්පාදනය පිළිබඳව ඉල්ලුමට සරිලන සැපයුමක් නොමැති වීම අභියෝගයක් වෙලා. නමුත් රෙදිපිළි නිෂ්පාදනය වඩාත් සීඝ්‍රයෙන් වෙනස් වන කර්මාන්තයක්. මෙම කර්මාන්තයේ සාර්ථකත්වයට බලපාන විවිධ සාධක අතර සීඝ්‍රයෙන් වෙනස් වන පාරිභෝගික කැමැත්ත කෙරෙහි ඉක්මන් ප්‍රතිචාර දැක්වීම සහ නිර්මාණ සැකසීම ඉතා වැදගත් සාධකයි. වේගයෙන් ජනප්‍රියත්වයට පත්ව ඇති "*අන්තර්ජාල වෙළෙඳාම* " සහ "*වේගවත් විලාසිතා*" **(**Fast Fashion) කෙරෙහි අපේ කර්මාන්ත දෙපාර්තමේන්තුව අවධානය යොමු කළ යුතු කාලය දැන් එළඹිලා.

මේ සියල්ල කෙරෙහි අවධානය යොමු කරමින් කර්මාන්ත කටයුතු වෙනුවෙන් 2019 වර්ෂයට රුපියල් මිලියන 290 ක ප්‍රතිපාදන වෙන් කරනවා.

## නිවාස අවශ්‍යතාවය

ගරු සභාපතිතුමනි, නිවාස අවශ්‍යතාවය සම්පූර්ණ නොවීම රටක නිරපේක්ෂ දරිද්‍රතාවයේ එක් කොටසක් වශයෙන් සලකනවා. නිසි නිවාසයක් නොමැති ජනතාවගෙන් සියයට 21 ක් වාසය කරන්නේ බස්නාහිර පළාතේ. අපේ රටේ නිවාසවලින්, තවමත් සියයට 10.3 ක් වර්ග අඩි 250 ට අඩු කුඩා ප්‍රමාණයේ නිවාස වන අතර සියයට 17 ක් අර්ධ ස්ථාවර බිත්ති සහිත නිවාසයි.

පළාත් නිවාස දෙපාර්තමේන්තුව විසින් පළාත් සංවර්ධන, පළාත් නිශ්චිත, උපමාන පාදක සහ නිවාස අරමුදල යටතේ වාර්ෂිකව 3,000 කට ආසන්න ප්‍රතිලාභීන් සංඛ්‍යාවකට නිවාස ආධාර සැපයීම සුළු පටු නොමැති වුවත් එය කිසිසේත් ප්‍රමාණවත් යැයි මා සිතන්නේ නැහැ. ආධාර ලබා දීමට වඩා නිවාස ඒකක සාදා දීමේ හැකියාවක් පවතී නම් එය වඩාත් සුදුසු බව මා අදහස් කරනවා. 2017 වර්ෂයේ දරිද්‍රතාවය පිටු දැකීමේ ව්‍යාපෘතිය යටතේ නිවාස ඒකක 39 ක් සම්පූර්ණ කර පවුල් ඒකක වෙත ලබා දීම අපි කවුරුත් අගය කළ යුතුයි. ප්‍රතිලාභියාගේ ශ්‍රම දායකත්වය ද ලබා ගෙන සාමාන්‍යයෙන් රුපියල් ලක්ෂ 6 කට පමණ කුඩා නිවසක් සාදා නිම කරන්න පුළුවන්. එම නිසා ලබන වර්ෂයට ලබා දෙන නිවාස ආධාරවලට අමතරව කුඩා නිවාස ඒකක සෑදීම සඳහා ප්‍රතිපාදන ද මෙම මුදල් ප්‍රකාශය යටතේ වෙන් කරනවා.

## ග්‍රාම සංවර්ධන අංශය

ගරු සභාපතිතුමනි, අප රටේ ආදායම, පසුගිය වර්ෂ ගණන තුළ ඉහළ ගියත් ආදායම් බෙදී යෑමේ විෂමතාවය තවමත් සම්පූර්ණයෙන් ඉවත් වෙලා නැහැ. ජනගහනයේ දිළිඳුම සියයට 20 මුළු ආදායමෙන් සියයට 4.8 ක් හිමි කර ගන්නා විට, සියයට 50.8 ක්, ජනගහනයේ ධනවත්ම සියයට 20 ක් විසින් හිමි කර ගන්නවා. ග්‍රාම සංවර්ධන අංශයට මෙම විෂමතාවය අඩු කිරීම සඳහා යම් මට්ටමකින් හෝ දායක වන්න පුළුවන්. නමුත් පළාතේ ග්‍රාම සංවර්ධන සමිතිවලින් සියයට 50 කට වඩා අක්‍රීය තත්ත්වයේ පැවතීම ඉතාම දුර්වල තත්ත්වයක්. මේවා සක්‍රීය තත්ත්වයේ පවත්වා ගැනීමට අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කළ යුතුයි.

[ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා]

මෙම සමිති සක්‍රීය කිරීමේ අරමුණින් පසුගිය වර්ෂයේදී එක් සමිතියකට රුපියල් 20,000/- බැගින් ලබා දුන්නා. එමගින් සෑම සමිතියක්ම එම මුදල මෙන් තුන් ගුණයක වටිනාකමින් යුත් ව්‍යාපෘතියක් කළ යුතු යැයි නියම කළා. එමගින් සමිති 80 ක් පමණ බලගැන්විය හැකි වුවත් එය කිසිසේත් ප්‍රමාණවත් යැයි මා සිතන්නේ නැහැ. එම නිසා ලබන වර්ෂයේදී එම මුදල රුපියල් 30,000/- ක් දක්වා වැඩි කිරීමට මා යෝජනා කරන අතර, එමගින් අනෙකුත් සමිති ද ක්‍රියාකාරී තත්ත්වයට පත් කර ගත යුතුයි.

*විශේෂයෙන් මේ අතර තිබෙන යෞවන සමාජවලට ද අත් වෙලා තිබෙන්නේ ග්‍රාම සංවර්ධන සමිතිවලට අත් වුණු ඉරණමයි.*

කාන්තා පුහුණු මධ්‍යස්ථාන 18 ක් ග්‍රාම සංවර්ධන අංශය සතුව පළාතේ පවතිනවා. මැහුම් ගෙතුම්, අත්කම්, එම්බ්‍රොයිඩර්, ආහාර හා පෝෂණ පුහුණු වැඩ සටහන් ඒවායේ පවත්වන අතර වර්ෂයකට 1,000 කට ආසන්න සංඛ්‍යාවක් ඉන් පුහුණුව ලබා පිටව යනවා. මෙම මධ්‍යස්ථාන සංඛ්‍යාව වැඩි කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ද මෙම මුදල් ප්‍රකාශය යටතේ වෙන් කරනවා.

### ඉදිකිරීම් කටයුතු

ගරු සභාපතිතුමනි, මෙම වර්ෂයේ රුපියල් මිලියන 15,000 කට වැඩි මුදලක් ප්‍රාග්ධන වියදම් වශයෙන් වෙන් කළද, මින් සියයට 75 කට වඩා වැඩි මුදලක් වෙන් වන්නේ ඉදි කිරීම් කටයුතු සඳහා යි. ඇස්තමේන්තු සැකසීම, ප්‍රසම්පාදනය, අධීක්ෂණය සහ ගෙවීම් කිරීම යනාදී ඉදි කිරීම්වලට අදාළ සියලු කටයුතු කරන්නේ ඉංජිනේරු කාර්යාංශය යි. ඉංජිනේරුවන් සහ කාර්මික නිලධාරීන් 41 ක් හිඟව පැවතියදීත් ඉංජිනේරු කාර්යාංශය මෙම සියලු කාර්යයන් උසස් ප්‍රමිතියෙන් යුතුව කර ගෙන යාමට දරන උත්සාහයට වාගේම ඉහළ වෘත්තීමයභාවයට සහ කැපවීමට අප කාගේත් ප්‍රශංසාව හිමි විය යුතුයි. නිවාඩු දිනවලද රාජකාරී ඉටු කරමින් පරිපූරක ඇස්තමේන්තු එක යටතේ වෙන් කළ ප්‍රතිපාදනවලින් සාර්ථක භෞතික ප්‍රගතියක් අත් කර ගැනීමට හැකි වීම එයට හොඳ සාක්ෂියක්. ඉංජිනේරු කාර්යාංශයේ නිලධාරීන්ට දීමනා ලබා ගැනීමට අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන රුපියල් මිලියන 31 ක් මෙම වර්ෂයේ වෙන් කර දුන් අතර ලබන වර්ෂයේදී ඔවුන්ගේ කාර්යාලවල භෞතික පහසුකම් වැඩි දියුණු කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ද මෙම මුදල් ප්‍රකාශයෙන් වෙන් කරනවා.

ගරු සභාපතිතුමනි, අප ළඟ විවිධ මතභේද, මතවාද පවතිනවා. ඒවා ඉදිරිපත් කිරීමට ද අපට අයිතියක් තිබෙනවා. ඒක තමයි ප්‍රජාතන්ත්‍රවාදයේ තිබෙන අපූරු ලක්ෂණය. අනාගතය පිළිබඳ සිතා බලා කටයුතු කිරීම සඳහා අතීතය ස්මරණය කරන්න පුළුවන්. *මම කියන්නේ, මේ පාර්ලිමේන්තුවේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන දේශපාලන පක්ෂවල නියෝජිතයන් ගැන නොවෙයි ගරු සභාපතිතුමනි.*

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒක දැන් තහනම් වචනයක් නේ? ඒක ඔබතුමාගේ නායකයාට තහනම් වචනය.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

*ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න ගිහිල්ලා සිවුරයි, හක් ගෙඩියයි අලියාගේ බෙල්ලේ එල්ලන්නත් සිද්ධ වුණා. ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න ගිහිල්ලා.*

නමුත් අතීතය හා වර්තමානය අතර ආරවුලක් ඇතිකර ගතහොත් අපේ අනාගතය අප විසින්ම අහිමි කර ගත් බව පසක් කර ගැනීමටත් කලක් ගත වෙනවා. අපි කවුරුත් අනාගතය අහිමි කර ගැනීමට අකමැතියි. එම නිසා අර්ථවත් විවේචන ඉදිරිපත් කරමින් මෙම අයවැය සම්මත කර ගැනීමට ඔබ සියලු දෙනාගේම සහයෝගය ලබා දෙන ලෙස මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ස්තුතිය**

*ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමාටත්, හිටපු අගමැතිතුමාටත්, වර්තමාන අගමැතිතුමාටත්, ඇමතිවරුන්ටත්, අපට සහාය වන සියලුම රාජ්‍ය ආයතනවලටත්, සියලුම නිලධාරීන්ටත් පළාත් සභාවෙන් පිට අපට සහයෝගය දෙන සියලුම දෙනාටත් මගේ ස්තුතිය හා ගෞරවය මා පුද කරන්න කැමැතියි.*

මෙතෙක් වේලා අයවැය කථාවට සවන් දුන් ඔබ සියලු දෙනාට මාගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. අපේ ඉදිරි ගමනට දායකත්වයක් ලබා දෙන ගරු ආණ්ඩුකාරතුමාට ද, 2019 මුදල් ප්‍රකාශය පිළියෙළ කිරීමේදී මහත් කැපවීමෙන් කටයුතු කළ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රධාන ලේකම්තුමා ඇතුළු.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ. මේකේ අපේ මන්ත්‍රීවරු දාලා නැහැ. ඒකයි මම බැලුවේ. ගරු ආණ්ඩුකාරතුමාටද, ඒ වාගේම අපේ ගරු අමාත්‍යවරුන්ට ද, පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්ටද ඒ වාගේම 2019 මුදල් ප්‍රකාශය පිළියෙළ කිරීමේදී මහත් කැපවීමෙන් කටයුතු කළ ප්‍රධාන ලේකම්තුමා ඇතුළු පළාත් භාණ්ඩාගාරයේ අයවැය අංශයේ සියලු නිලධාරීන්ට ද, පළාතේ සියලු ලේකම්වරුන්ට ද, පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ද, අනෙකුත් කාර්යාලවල ආයතන ප්‍රධානීන්ට ද මාගේ හෘදයාංගම ස්තුතිය පුදකර සිටිනවා. එමෙන්ම වාර්තා කිරීමේ යෙදී සිටි ජනමාධ්‍යවේදීන්ට ද, සංවිධාන කටයුතු සහ පහසුකම් සැපයූ සභා ලේකම් ඇතුළු එම කාර්ය මණ්ඩලයට ද මාගේ අවංක ස්තුතිය පුද කරමින් මාගේ අයවැය කථාව මෙයින් අවසන් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාදය කල් තබන ලදී.***
*Question proposed and debate adjourned.*

# 2019 වාර්ෂික මුදල් ප්‍රකාශයට අදාළඥප්තියවිසර්ජන ප්‍ර
APPROPRIATION STATUTE RELEVANT TO THE ANNUAL FINANCIAL STATEMENT OF 2019

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, *"2019 වර්ෂය වෙනුවෙන් වූ මුදල් ප්‍රකාශයට අදාළ විසර්ජන ප්‍රඥප්තිය අනුමත කළ යුතුය." යන යෝජනාව ඉදිරිපත් කරනවා.*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාදය කල් තබන ලදී.***
*Question proposed and debate adjourned.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2019 වසරට අදාළ අයවැය යෝජනා සහ ප්‍රකාශය සහ ඊට අදාළ විසර්ජන ප්‍රඥප්තිය පිළිබඳ විවාදය 2018 දෙසැම්බර් මස 04, 05, 06, 07, 10 සහ 11 යන දිනවලදී පැවැත්වීමට නියමිත බවත් ගරු මන්ත්‍රීවරුන්ට ඒ දිනවලට සහභාගී වන ලෙස ඉතාමත් ගෞරවයෙන් ආරාධනා කරනවා. මම නැවතත් ඒ දින ටික කියන්නම්. 2018 දෙසැම්බර් මස 04, 05, 06, 07, 10 සහ 11 යන දින.

# කල් තැබීමේ යෝජනාව
ADJOURNMENT

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු සභාපතිතුමනි, *"දැන් සභාව කල් තැබිය යුතු යැයි"* මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින් .සභා සම්මත විය ,***
*Question put and agreed to.*

*ඊට අනුකූලව පළාත් සභාව අ **.භා.01.28** ට, **2018** දෙසැම්බර් මස **04** වන දින පූ **09.00** .භා.වන තෙක් කල් ගියේය .*
*Accordingly, the Provincial Council was adjourned at 01.28 p.m till 09.00 a.m, on 04.12.2018.*